LST
REVIEW
| වෙළුම 30 |නිකුතුව 348 | 2021 නොවැම්බර්
www.lstlanka.org

LAW & SOCIETY TRUST

# විශේෂ ආර්ථික කලාප සහ කොළඹ වරාය නගරය-

## ශ්‍රී ලංකාවේ දීර්ඝකාලයක සිට පවතින සංවර්ධන අර්බුද සියල්ල විසඳන පිළියම් මේවාද?

**LST Review**

වෙළුම 30 |නිකුතුව 348 | 2021 නොවැම්බර්

**විශේෂ ආර්ථික කලාප සහ කොළඹ වරාය නගරය**

ශ්‍රී ලංකාවේ දීර්ඝකාලයක සිට පවතින සංවර්ධන අර්බුද සියල්ල විසඳන පිළියම් මේවාද?

නීතිය හා සමාජය භාරය

පළමු මුද්‍රණය : 2021 නොවැම්බර්

ISSN : 2815-0244

---

**විශේෂ ආර්ථික කලාප පිළිබඳ සංසන්දනාත්මක සමාලෝචනයක්: මිත්‍යාවන් හා මතභේද දුරලීම**

ආචාර්ය කෙහින්දෙ ඔලාඕයියෙ සහ ආචාර්ය දිනි සේකෝ විසින් රචිත ලිපිය

මෙම ලිපිය හරහා කතුවරුන් ජාතික සංවර්ධනය සඳහා නෛතික සහ ආර්ථික ව්‍යුහයක් වශයෙන් විශේෂ ආර්ථික කලාපවල භූමිකාව සැකෙවින්, සංසන්දනාතමකව විමසනු ලැබේ. විශේෂ ආර්ථික කලාප සම්බන්ධයෙන් වඩාත් සමබර සහ අපක්ෂපාතී දෘෂ්ටිකෝණයකින් සලකා බැලීම සඳහා එම කලාපවල සාර්ථකත්වය පිළිබඳ කථා සහ අසාර්ථකවීම් පිළිබඳව ද, එමෙන්ම මාධ්‍යවල ඒ සම්බන්ධයෙන් පලවූ විවේචන ද මෙම ලිපියෙන් විචාරාත්මකව විශ්ලේෂණය කෙරේ.

**වරාය නගරය, පාලනය සහ ජනතාව**

මහාචාර්ය සාවිත්‍රි ගුණසේකර විසින් රචිත ලිපිය

මහාචාර්ය ගුණසේකර, ශ්‍රී ලංකාවේ පාලන ආයතන සහ ක්‍රියාවලි මත වරාය නගර මුලපිරීමෙන් ඇතිවන බලපෑම මෙන්ම ශ්‍රී ලංකාවේ අනාගතයට ඉන් ඇතිවන බලපෑමද සාකච්ඡා කරයි. ඇගේ විශ්ලේෂණයට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත සහ එම පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ මහජන අර්ථසාධක නඩුකර ඇතුළත් වන අතර ඇය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදුන් නඩුතීන්දුවේ විශ්ලේෂණයක් ද කර ඇත.

---

ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදී

## පටුන

### කතුවැකිය

විශේෂ ආර්ථික කලාප සහ කොළඹ වරාය නගරය - 1

ශ්‍රී ලංකාවේ දීර්ඝකාලයක සිට පවතින සංවර්ධන අර්බුද සියල්ල විසඳන පිළියම් මේවාද?

---

### ලිපි

විශේෂ ආර්ථික කලාප පිළිබඳ සංසන්දනාත්මක සමාලෝචනයක්: මිත්‍යාවන් හා මතභේද දුරලීම 9

*ආචාර්ය කෙහින්දේ ඔලොය් හා ආචාර්ය දීනි සෙප්කො*

වරාය නගරය, පාලනය සහ ජනතාව 23

*මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර*

### කතුවැකිය

# විශේෂ ආර්ථික කලාප සහ කොළඹ වරාය නගරය-

## ශ්‍රී ලංකාවේ දීර්ඝකාලයක සිට පවතින සංවර්ධන අර්බුද සියල්ල විසඳන පිළියම් මේවාද?

විශේෂ ආර්ථික කලාප විශේෂයෙන්ම ආසියාවේ, අප්‍රිකාවේ සහ මැදපෙරදිග රටවල සීඝ්‍රයෙන් පැතිර ගියේ ඒවා ආර්ථික වර්ධනයේ ධාවකය වේ යැයි ප්‍රතිපත්ති සම්පාදකයින් අතර පැවති විශ්වාසය පදනම් කරගෙන ය. ශ්‍රී ලංකාවේ ද, ආර්ථික වර්ධනයේ ධාවක වශයෙන් විශේෂ ආර්ථික කලාප සහ 'මෙගාපොලිස්' නොහොත් මහනගර සංකල්පය සම්බන්ධයෙන් ඇති උනන්දුව වත්මන් රජය සහ ඊට පෙර පැවති රජය තුළද පැතිර තිබුණි. 1980 ගණන්වල නිදහස් වෙළඳ කලාප හඳුන්වාදෙනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ආර්ථික විභවයේ බීජ වශයෙනි. ඊට දශක තුනකට පසුව කොළඹ වරාය නගරය ඇතිවන්නේ ද සිත් ඇදගත් ඒ කාරණය හරහා ය. ඉදිරි වර්ෂවලදී තවත් මෙවැනි ව්‍යාපෘති ඇතිවනු දකින්නට ශ්‍රී ලංකාවේ අපි සූදනම් විය යුතුය. චීනයේ අනුග්‍රහයෙන් සිදුකෙරෙන තීරය සහ මාර්ග මුලපිරීමත් මුතු මාලා මුලපිරීමත් ඔස්සේ අදාළ ක්‍රමෝපායික මාර්ගය මුළුල්ලේ මෙවැනිම තවත් කලාප ඇති වීමට මගපෑදීමේ හැකියාවක් ඇත.

මෙවර LST සමාලෝචනයෙන් (LST Review) අවධානය යොමු කරන්නේ විශේෂ ආර්ථික කලාප සහ කොළඹ වරාය නගරයටයි. මේවා, ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක් තිස්සේ පීඩා විඳින ආර්ථික අර්බුද සියල්ල නසන ඖෂධයක් වනු ඇතිදැයි ප්‍රශ්න කරන අතරේම, ශ්‍රී ලංකාව දැනටමත් කැපවී ඇති තිරසාර සංවර්ධන අරමුණු වැනි රාමුවලට මෙවැනි මුලපිරීම් කෙසේ යෝග්‍ය වේද යන ප්‍රශ්නය ද නගයි.

මෙම LST සමාලෝචනයෙන් වරාය නගර මුලපිරීම සම්බන්ධයෙන් වඩාත් යථාර්ථවාදී ඇගයුමක් සකසා ගැනීමට ප්‍රජාව තුළ පුළුල් විවාදයක් ද, වරාය නගරයේ මෙහෙයුම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම හරහා එය ශ්‍රී ලංකාව මානව හිමිකම් සම්බන්ධයෙන් සහ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් ලබාදී ඇති පොරොන්දු අනුව ක්‍රියාත්මකවන බව සහතික කරගැනීම සඳහා කැපවීමක් ද පෝෂණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විශේෂ ආර්ථික කලාප සම්බන්ධයෙන් සංසන්දනාත්මක සමාලෝචනයක් සිදුකිරීම සඳහා LST සමාලෝචනය විසින් හොංකොං නගර විශ්ව විද්‍යාලයේ පර්යේෂකයින් වන කෙහින්දෙ ඔලාඕයේ සහ දිනි සේකෝ යන ශාස්ත්‍රඥයින් දෙපළට ආරාධනා කරන ලදී. ග්වන්ඩොං යන වෙරළබඩ පළාතේ ෂෙන්සෙං නගරය චීනයේ මහා තාක්ෂණික පුරවරය බවට පරිවර්තනය කිරීමේ කථාව චීනය තුළ විශේෂ ආර්ථික කලාප පිහිටවීමේ එක් අත්දැකීමක් විස්තර කෙරෙන අතර, දකුණු හා අග්නිදිග ආසියාවේත්, අප්‍රිකාවේත් විවිධ ප්‍රදේශවල විශේෂ ආර්ථික කලාප පිහිටුවීමේදී ඒවාට හවුල්කරුවකු වීමේ කථාව හරහා චීනය ලද තවත් අත්දැකීමක් නැගී එන සංවර්ධන සුසමාදර්ශයක් ලෙස සාකච්ඡා කෙරේ.

ඊට අමතරව, පාලනය සහ ශ්‍රී ලංකාවේ අනාගතය පසුබිම් කර ගනිමින් කොළඹ වරාය නගරය මුලපිරීම පිළිබඳ කථා කිරීම සඳහා ගෞරවලත් විශ්‍රාමික නීති මහාචාර්ය ගුණසේකර මහත්මියට LST සමාලෝචනය විසින් ආරාධනා කරන ලදී. මහාචාර්ය ගුණසේකර කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත, එම පනතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ මහජන අර්ථ සාධක නඩුකර, මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ද විශ්ලේෂණය කරයි. එමෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙම පනත් කෙටුම්පතින් එල්ල වූ අභියෝගවල දෘෂ්ටිකෝණයෙන් ද, අධිකරණයෙන් යෝජනා කළ සංශෝධන කඩිමුඩියේ ඒකාබද්ධ කරගෙන ඇතත් අධිකරණයෙන් පූර්ණ වශයෙන් ආමන්ත්‍රණය නොවූ හා නොවිසඳුනු මෙන්ම අධිකරණය විසින් නුවණක්කාර ලෙස මගහරින්නට පවා කටයුතු කළ ගැටළු මගින් තවමත් පීඩා විඳින මෙම පනත හේතුවෙන් අනාගතයේදී ඇතිවිය හැකි ව්‍යවස්ථාමය ගැටළු පිළිබඳව ද ඇය සාකච්ඡා කරයි. පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් සමාලෝචනයට ලක් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමිත සහ අසතුටුදායක ක්‍රමවේදයක් සඳහා විධිවිධාන සලසා ඇති අතර, පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමගින් නොගැටෙන බව සහතික කරගැනීම සඳහා එම පනත් කෙටුම්පතට කළයුතු සංශෝධන සම්බන්ධයෙන් උපදෙස් දීමට ද ඒ හා සමානවම අසතුටුදායක ක්‍රමවේදයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා තිබේ.[1] ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් අනුව පනත් කෙටුම්පතට සංශෝධන සිදුකිරීමට පාර්ලිමේන්තුවට නියම වී ඇතත් අවසාන සමාලෝචනයක් සඳහා එය නැවතත් අධිකරණයට යැවීමක් සිදු නොවේ. පාර්ලිමේන්තුවේ විවාදය අතරතුර පැන නැගිය හැකි කරුණුවලට අමතරව, සංශෝධිත පනත් කෙටුම්පත සමාලෝචනය කර, එහි සිදුකළ වෙනස්කම් සැබැවින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වේදැයි බැලීම සඳහා සතුටුදායක යාන්ත්‍රණයක් නොමැත. පාර්ලිමේන්තුවේ කාර්යපටිපාටි අතිශයින්ම පක්ෂවාදී ක්‍රියාවලි බවට පත් වී ඇති අතර, එය ද්වීපාක්ෂික ව්‍යවස්ථා සමාලෝචන ක්‍රියාවලියක් සිදුවන, රටේ ජාතික යහපත සඳහා පෙළගැසුනු නීතිරීති සම්මත කරගන්නා ස්ථානයක් වනු ඇතැයි අපේක්ෂා කරන්නේ අතලොස්සකි.

කෙහින්දෙ ඔලාඕයේ සහ දිනි සේකෝ විශේෂ ආර්ථික කලාප සම්බන්ධයෙන් සිදුකළ සංසන්දනාත්මක අධ්‍යයනය තුළ මෙම කලාප

සම්බන්ධයෙන් ඇති ඇතැම් භීතීන් හඳුනාග ැනීමට ලක් කරමින්ඒවා පිළිබඳ සාකච්ඡා කිරීමට කටයුතු කර ඇති අතර මෙවැනි කලාප හා බැඳී ඇති ඇතැම් මිථ්‍යා මත සහ විවාදයට තුඩුදෙන කරුණු සම්බන්ධයෙන් ද සැක දුරු කිරීමට උත්සාහ දරනු ලැබේ. ඔවුන් ඒත්තු ගැන්වෙන පරිදි තර්ක කරන්නේ අභියෝගවලට තුඩු දෙන්නේ, මෙම සංකල්පය හෝ අස්ථිත්වයම නොව එය බලගන්වන නීතිය සහ ඒවා පිහිටන්නා වූ පසුබිම වන බවයි. මෙහි සත්‍ය තත්වය දැනගැනීමට බැලූබැල්මට පෙනෙන සරළ අර්ථයෙන් ඔබ්බට ගොස් ගැඹුරින් සිතා බැලිය යුතු බව ඔවුහු කියති.

ක්ෂිතිජ ඉමේ දර්ශනය වන ගොඩනැගිලි රේඛාවේ ඇතිවන වෙනස, ප්‍රාණවත් ආර්ථිකයක් පෙන්නුම් කරන ලක්ෂණය යැයි සිතීමට නැඹුරුවක් පවතියි. එහෙත්, විශේෂ ආර්ථික කලාප යනු අර්ථිකය වර්ධනය සඳහා පොළඹවන මැජික් පෙත්තක් නොවන බව ඔලාඕියේ සහ සේකෝ සඳහන් කරති. විශේෂ ආර්ථික කලාපවල අරමුණ සාර්ථකව ඉටුකරගැනීමට නම් ආයෝජකයින්ට ආකර්ෂණීය, ශක්තිමත් සහ බලදායී නීති හා ගිවිසුම් තිබිය යුතු නමුත් මෙවැනි කලාපවල සාර්ථකත්වයට වඩාත්ම වැදගත් වන්නේ මනා සැලසුම්කරණය සහ මනා පාලනයයි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ප්‍රජාවේ සාමාජිකයින් සමගින් පැවති සාකච්ඡාවලදී මෙය තවදුරටත් තහවුරු වේ. 2021 මැයි මස 19 හා 20 වැනි දින පැවැත්වූ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත් විවාදය අතරතුර ඇඩ්වොකාටා බුද්ධි මණ්ඩලය ඒ පිළිබඳව විවරණයක් සිදුකළේ ය. එහිදී ව්‍යාපාරික නායකයින් කිහිප දෙනෙකුම ප්‍රකාශ කළේ තමන්ට දෙන බවට කියන බදු සහන තුළ තමන් විශේෂයක් නොදුටු බවත් ඔවුන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වුයේ විශේෂ ආර්ථික කලාපය පැහැදිලි සහ වෙනස් නොවන නියාමන රාමුවකින් පාලනය වීම පිළිබඳව බවත්ය. ඒ අනුව ප්‍රධාන කරුණ වන්නේ බදු සහනවලට වඩා මනා ආර්ථික පාලනයක් ආයෝජකයින්ට ආකර්ෂණීය වන බවයි. ජනතා අවධානයට යොමු වූ 'වංචා' කිහිපයක්ම පසුබිමෙහි (සුප්‍රකට බැඳුම්කර වංචාවේ සිට වඩාත් මෑතකාලීන සීනි සහ සුදු ලූණු වංචාව දක්වා) නිදොස් කීර්තිනාමයක් සහ යහපත් ආර්ථික පාලනය සඳහා කැපවීමක් පවත්වාගෙන යාමට යොමු වූ රටක් වශයෙන් ශ්‍රී ලංකාව තවමත් විශ්වාසය දිනාගෙන නොමැත.

එමෙන්ම, විශේෂ ආර්ථික කලාප යනු ආර්ථික වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් යැයි සිතනු වෙනුවට ඒවා ආර්ථික වර්ධනයේ ධාවකය නොහොත් එන්ජිම යැයි සැලකීමෙන් ඇතිවන භයානක තත්වයක් ද තිබේ. විශේෂ ආර්ථික කලාප යනු ආර්ථික වර්ධනයේ ධාවකය වශයෙන් සැලකූ කල රටේ අනෙකුත් ප්‍රදේශ සහ අංශ අත්හැර සියළුම ආයෝජන එම කලාපයට සිදු කෙරේ. විශේෂ ආර්ථික කලාපය සියළුම ඔක්සිජන් තමා වෙත ඇදග නිමින් ආර්ථික හා සමාජ විකෘතවීම් සඳහා මග පාදනු ඇති අතර රටේ අනෙකුත් කලාප නොසලකා හැරීමත්, කුඩා ආයෝජන අයවැයක් ඇති ජාතික මට්ටමේ ආයෝජකයින් බොහෝ දෙනාට ආර්ථික කලාපය තුළ පවතින බොහෝ නීති අත්හැරදැමීම්, වරණීය බදු, නවතම යටිතල පහසුකම්, සහ ගැටුම් කඩිනමින් නිරාකරණය කරගැනීමට ඇති විශේෂ යන්ත්‍රණ යනාදියෙහි වාසි ලබා ගැනීමට නොහැකි වීමත් සිදුවනු ඇත.

විශේෂ ආර්ථික කලාප සෘජු විදේශ ආයෝජන සඳහා ආකර්ෂණීය ස්ථානයක් වියයුතු ය යන ඒකායන අධිෂ්ඨානයෙන් ගන්නා ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, රටේ අනෙක් ප්‍රදේශවල සහ විශේෂ ආර්ථික කලාප තුළ ආයෝජන ආකර්ෂණය කර නොගන්නා වෙනත් අංශවල ආයෝජනය කරන දේශීය ආයෝජකයින්ට අවාසි සහගතවන හා ඔවුන් අතරමග දමා යන, සාමාන්‍ය රෙගුලාසිවලට සමගාමී විශේෂිත

නීති සහ රෙගුලාසි රාමු නිර්මාණය වේ. විශේෂ ආර්ථික කලාප තුළ කාර්යක්ෂමතාවය, හොඳින් සේවා ලබාදීම, ඒවායෙහි ඇති අභියෝග වලට මුහුණදීම සඳහා වේගවත් නීති පිළියම් යනාදියට අවධානය යොමු කිරීම තුළින්, දියුණු වන පරිසරයක් නිර්මාණය කිරීමට නම් රටේ අනෙකුත් ප්‍රදේශවලට ද ව්‍යාපාර වලට ද, එවැනිම අවධානයක් යොමු කළ යුතුය යන කාරණය නොසලකා හැරේ. ආයෝජන ප්‍රාග්ධනය විදේශීය ආයෝජකයෙකුගෙන් ලැබුණත් දේශීය ආයෝජකයෙකුගෙන් ලැබුණත් ආයෝජන ප්‍රාග්ධනය ම ය. පැහැදිලිවම, අවසාන අභිමතාර්ථය විය යුත්තේ පොදුවේ ආර්ථිකය සංවර්ධනය මිස විශේෂ ආර්ථික කලාපයේ සංවර්ධනය නොවේ. රටේ ඉතිරි කොටස නොසලකා හැරීම යනු තමන්ගේ අසාර්ථකත්වය පිළිගැනීමක් සහ රටේ ඉතිරි ප්‍රදේශ, රටේ සමස්ථ පාලන පද්ධතිය සහ නීති රාමුව බේරා ගැනීමට නොහැකි තරම් අන්ත තත්වයක පවතින බව අවබෝධකරගෙන එය පිළිගැනීමක් බඳු ය.

බොහෝ විශේෂ ආර්ථික කලාපවල මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදුවී ඇති බවත්, විශේෂයෙන්ම මියන්මාරය, ලාඕසය, තායිලන්තය, කාම්බෝජය සහ ගැබොන් වැනි රටවල විශේෂ ආර්ථික කලාප බොහෝදෙනා තුළ අවිශ්වාසයක් ඇතිකිරීමට දායක වී ඇති බවත්, ඔලාඕයේ සහ සේකෝ පිළිගනිති. එවැනි මතභේදාත්මක සිදුවීම් සහ අපයෝජන අතරට පාරිසරික හානිය, ශ්‍රමිකයින් සඳහා ඇති ආරක්ෂණ ඉවත් කිරීම, මිනිස් වෙළඳාම සහ විශේෂ ආර්ථික කලාප හරහා ඇතිවන ඇල වූ සහ අසමාන සංවර්ධනය ඇතුළත් වේ. විශේෂ ආර්ථික කලාප සඳහා දැඩි ලෙස සහ තීව්‍ර ලෙස ආයෝජන කිරීම සලකන්නේ රටවල් ණය උගුලකට ඇද දැමීමක් සහ තිරසාර සංවර්ධනයේ වඩාත් වැඩි වේගයක් නොගන්නා සුසමාදර්ශවලට පටහැනිව යාමක් ලෙසය.

යහපාලනයට සහය ලබාදෙන, එකිනෙකට ගැලපෙන හා විනිවිදභාවයෙන් යුත් ශක්තිමත් නියාමන රාමු සහ ආයතනවල අවශ්‍යතාවය ප්‍රබල සාක්ෂි ගෙනහැර දක්වමින් තහවුරු කර තිබේ. එසේම, විශේෂ ආර්ථික කලාප ප්‍රතිපත්ති පුරෝකථනය කළ හැකි අන්දමින් ක්‍රියාත්මක කරනු ඇතැයි සහ ශක්තිමත් කළමනාකාරීත්ව ශක්‍යතා සහිත, පැහැදිලිව අර්ථ දැක්වූ වගකීම් පැවරුනු විශේෂ ආර්ථික කලාප අධිකාරීන් ඇතිකරනු ඇතැයි අපේක්ෂා කරේ. සාර්ථක විශේෂ ආර්ථික කලාපයක් සඳහා මේවා අවශ්‍ය කරන්නේ නම්, මේවා පදනම් කර ගනිමින් කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත විශ්ලේෂණය කර, ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන පනත තිබේදැයි තීර්ණය කළ හැක.

මහාචාර්ය ගුණසේකර කොළඹ වරාය නගරය දෙස බලා ඇත්තේ පාලනය, ව්‍යවස්ථානුකූලභාවය, ජනතා පරමාධිපත්‍ය සහ නීතියේ ආධිපත්‍ය මත ඉන් ඇති කෙරෙන බලපෑම යන දෘෂ්ටිකෝණයෙනි. ආරම්භයේ පටන්ම වරාය නගර මුලපිරීම විවිධ මතභේදවල පැටලී තිබුණු බව ඇය සඳහන් කරයි. ව්‍යාපෘතිය හෝ ඊට දරන්නට වන පිරිවැය සම්බන්ධයෙන් මහජනයාගෙන් අදහස් විමසීමක් සිදු නොකෙරුනි. මුහුදු ඉඩම් ගොඩකිරීමෙන් ඇතිවන බලපෑම, විශේෂයෙන්ම ධීවර කර්මාන්තයට මින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් පාරිසරික ශක්‍යතා අධ්‍යන සිදු කර නැත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ සංවර්ධන සුසමාදර්ශයෙහි සාධනීය අංගයක් වන බව ජනතාවට ඒත්තු ගන්වමින් ඔවුන්ගේ බිය තුරන් කර දැමීමට ප්‍රමාණවත් යමක් සිදුකර නොමැත. වරාය නගරය හරහා දේශීය වශයෙන් විවිධ බලපෑම්, එනම් අක්‍රමිකතා ඇතිවනු ඇතැයි සහ මතභේද අවුළුවනු ඇතැයි ඇය කණස්සල්ල පල කරයි.

මහචාර්‍ය ගුණසේකර කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත, එම

පනතේ ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ මහජන අර්ථ සාධක නඩුකර, මෙම පනත් කෙටුම්පතෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ලවන අභියෝග පිළිබඳව එහි පල වී ඇති අදහස් ද ඇතුළුව එම තීන්දුව විශ්ලේෂණය කරයි. පනත් කෙටුම්පත ජනමත විචාරණයකට යොමු නොකරන්නේ නම්, එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන බව සහතික කරගැනීම සඳහා එම නීති කෙටුම්පතට පාර්ලිමේන්තුවෙන් ඒකාබද්ධ කළයුතු වෙනස්කම් නඩු තීන්දුවෙන් යෝජනා කර තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මෙම අනනුකූලතා හඳුනාගෙන පාර්ලිමේන්තුවේ 2/3ක බහුතරයකින් සම්මත කරගතයුතු විධිවිධාන 26ක් ද පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකින් සහ ජනමත විචාරණයකින් සම්මත කරගත යුතු විධිවිධාන 9ක් ද හඳුනාගැනීමෙන් හෙළිදරවු වන්නේ මේ පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කිසිත් නොදුටු නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් අනුගමනය කර ඇති අපේක්ෂා සහගත පිළිවෙතයි. නීතියක් සම්මත වූ පසුව එය අධිකරණයේ අභියෝගයට ලක් කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවසර නැත. පනත් කෙටුම්පතක් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට ඇති අවස්ථාව ද ඉතා සීමිත ය. එසේ තිබියදී පවා, උද්යෝගිමත් දේශපාලන සහ සිවිල් සමාජ සාමාජිකයින් විසින් මේ සම්බන්ධයෙන් නීතිමය අභියෝග යක් ඉදිරිපත් කළ අතර, ඒ අනුව මෙම පනත් කෙටුම්පතට යම් යම් සීමිත වෙනස්කම් කිරීමට රජයට බල කෙරුනි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් සංකීර්ණ නීතිමය සහ දේශපාලන ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට සිදු වී තිබිණි. ඊට පහත කරුණු ඇතුළත් විය:

- ගොඩකරන ලද ඉඩම් බදුදීමට හෝ බැහැර කිරීමට/අන්සතු කිරීමටත් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ නිර්වචනය වෙනස් කිරීමටත් ජනාධිපතිවරයාට ඇති බලතල

- රජයට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතෙන් ඒ වෙනුවට ව්‍යාපෘති සමාගමක් පත් කළ හැකිද යන වග

- ඉඩම් නීති ඇතුළුව වැදගත් නීති බොහොමයක් වරාය නගරය තුළ අදාළ නොවීම

- වරාය නගර කොමිෂන් සභාව සහ පළාත් සභා අතරේ බලතලවල සම්බන්ධතාවය සහ ඉඩම් සම්බන්ධයෙන් පලාත් සභාවලට ඇති තත්වය සහ බලය.

පනත් කෙටුම්පතට යම් සංශෝධන සිදුකිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් රජයට බල කෙරුනද, ඉඩම් සම්බන්ධයෙන් පළාත් සභාවලට ඇති බලතල යන වැදගත් ප්‍රශ්නය සාකච්ඡාකිරීම අධිකරණයෙන් මගහැර ඇත. පළාත් සභා සහ ඉඩම් සම්බන්ධයෙන් පළාත්වලට නීති සෑදීම සඳහා ඒවාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල ද පළාතට බලපෑමක් ඇතිවන කටයුතුවලදී ඔවුන්ගෙන් අදහස් විමසනු ලැබීම සඳහා ඇති අයිතිය ද සම්බන්ධයෙන් අධිකරණයේ ආකල්පය මේ පිළිබඳ යමක් හෙළිදරවු කරයි. පළාත් සභා මැතිවරණ පවත්වා නොතිබුණු හෙයින්, නීතියට අනුව පළාත් සභා පිහිටුවා නොතිබුණේය යන කාරණය පදනම් කරගනිමින් පළාත්වලින් අදහස් විමසීම යන කාර්ය පටිපාටිමය පියවර ඉටුකිරීමට නොහැකි වී ඇති බවත් එසේ අදහස් නොවිමසීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනයක් වශයෙන් සැලකිය නොහැකි බවත් අධිකරණය විසින් සඳහන් කර තිබේ. ඒ අනුව, ඉඩම් සම්බන්ධයෙන් පළාත් සභාවල බලතල පිළිබඳව පැහැදිලි කරගැනීමට

අධිකරණයෙන් දායකත්වයක් ලැබී නැති අතර ඉදිරියේදී, වරාය නගර කොමිෂන් සභාවේ කරදරයට හේතුවන පරිදි මෙම කාරණය නැවත නැවතත් ඉස්මතුවීමට ඉඩ තිබේ.

පළාත් සභා මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් දේශපාලනමය මතභේද පවතින බැවින්, වසර කිහිපයක සිට පළාත් සභා අර්ධ-අකර්මන්‍ය තත්වයේ පසුවේ. එසේම, පළාත්සභා වලට ඉඩම් සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීමට අවසර නොදී සිටීමට වෑයම් දරන අය ද පළාත් සභා පිළිබඳව ප්‍රශ්න කරනු ලැබේ. කෙසේනමුත්, මෙම LST සමාලෝචනය ප්‍රකාශනයට පත්කරන අවස්ථාව වනවිට, මෙම මැතිවරණ නුදුරේදීම පවත්වනු ඇතැයි සාකච්ඡා පවතියි. පළාත් සභා පිහිටවනු ලැබුවහොත්, වරාය නගරයේ ඉඩම් අන්සතු කිරීම සම්බන්ධයෙන් අධිකරණයෙන් ලබාදුන් තීන්දුව පළාත් සභා විසින් කුමන ආකාරයෙන් පිළිගනු ඇත් ද? එමගින්, අනාගත මහනගර සම්බන්ධයෙන් ඇති කරන පූර්වාදර්ශය කුමක්ද?

එසේම, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පතින් සහය දක්වන බව කියැවෙන විවිධ සංවර්ධන සහ පාලන ආකෘති හරහා උද්ගත වීමට ඉඩ ඇති ආතතීන් ද මහාචාර්ය ගුණසේකර අවධාරණය කරයි. තිරසාර සංවර්ධනය සඳහා පදනම් සලසන මානව හිමිකම් පාදක ප්‍රවේශයකින් සංවර්ධනයක් ප්‍රවර්ධනය කරන ජාත්‍යන්තර ගිවිසුම් කිහිපයකටම ශ්‍රී ලංකාව කැපවී තිබේ. පරිසර අයිතිවාසිකම් ඇතුළුව සිවිල්, දේශපාලන හා ආර්ථික, සහ සමාජ අයිතිවාසිකම් පරාසය සඳහා විධිවිධාන සලසාලන නීති නොමැත්තේ නම් තිරසාර සංවර්ධනය සාක්ෂාත් කරගැනීමට නොහැකි වනු ඇත. කෙසේනමුත්, තිරසාර සංවර්ධනය සහ ශීඝ්‍ර ආර්ථික වර්ධනය යන දෙකම ප්‍රවර්ධනයට මෙම පනත් කෙටුම්පත හරහා පොරොන්දු වේ. මේ අරමුණු දෙක නිසඟයෙන්ම එකිනෙකට ප්‍රතිවිරුද්ධ ය. ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් හඹා යද්දී මානව හිමිකම් සම්මුති උල්ලංඝනයවීම සිදුවිය හැකි අතර වරාය නගර ව්‍යාපෘතියට විරුද්ධව ජනතාව ඒකරාශී කර මෙහෙයවනු ලැබීමට මග නිර්මාණය වියහැකිය.

කොළඹ නගර මධ්‍යයේ පිහිටා ඇති වරාය නගරය ධනවතුන්ට (දේශීය සහ විදේශීය)පාරාදීසයක් වී වරප්‍රසාද ලත් පැලැන්තියේ සංකේතයක් සහ ජනතා අප්‍රසාදයේ උල්පතක්බවට පත්වීමට ඉඩ තිබේ. විදේශ ආයෝජකයින්ගේ පසුම්බිය සහ ලැදියාවන් ආරක්ෂා කරදීමට රාජ්‍යය කැපවී සිටියද, වරාය නගරය පිහිටා ඇත්තේ කළකිරුණු සහ එදිරිවාදී ජනතාවක් මධ්‍යයේ නම්, එය වරාය නගරයේ අඛණ්ඩ සාර්ථකත්වයට එතරම් ම යහපත් නොවනු ඇත.

ආයෝජකයින්ට සියළු සේවාවන් එක් වහලක් යටින් ලබාගත හැකිවන අන්දමේ විශේෂ නීති සහිතව වරාය නගරය නිර්මාණය කිරීම, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජකයින්ට ඒ මේ අත යමින් කෙලවරක් නැති සහ අනවශ්‍ය නිලධාරීවාදී අවහිර හා බාධක තරණය කිරීමට සිදුවන බව ව්‍යංගයෙන් පිළිගැනීමකි. ඒ සෑම අවහිරයක්ම හා බාධකයක්ම අසාධාරණ වාසි ලබාගැනීම සඳහා ඇති අවස්ථා වේ. මේ කණගාටුදායක තත්වය අවසාන කිරීම සඳහා රජය පාර්ශවයෙන් එතරම් උනන්දුවක් ඇතිබවක් නොපෙනේ. වරාය නගරයේ ආයෝජනය කරන්නන්ට තමන්ගේ ආරවුල් විසඳ ගැනීම සඳහා විශේෂ ආරවුල් නිරාකරණ යන්ත්‍රණයක් අවශ්‍ය බව පිළිගැනීමෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට මුහුණ දෙන නඩුපවරන්නන්ට අත්විඳින්නට වන බරපතළ ප්‍රමාදයන් ය. මෙය දිගින්දිගටම සාකච්ඡාවට ගතයුතු විෂයයක් වුවද, මේ අන්දමින්, විශේෂ ආයෝජකයින් පැලැන්තියකට පමණක් වාසිදායක වන අන්දමට සමගාමී

පද්ධතියක් පිහිටුවීමත් සමගින් මේ කාරණය ප්‍රතිසංස්කරණවලදී තවදුරටත් අවධානයට ලක් නොවීමට ඉඩ තිබේ.

වරාය නගරය සහ කොමිෂන් සභාවට පැවරෙන අතිවිශේෂ බලතල අළුතින් ගොඩකරන ලද, 'වරාය නගරය' යනුවෙන් හඳුන්වන භූමියට පමණක් නොව එම භූමි ප්‍රදේශයෙන් බැහැර ස්ථානවලට ද අදාළ වීම මෙහි ලා සැලකිල්ල යොමුකළයුතු ප්‍රධාන කාරණයකි. ඓතිහාසික කොළඹ 'කොටුව' තුළ පිහිටා ඇති ගොඩනැගිලි ද වරාය නගරයේ කොටසක් වශයෙන් සලකන අතර එම ගොඩනැගිලි විශේෂ උරුම වශයෙන් සංරක්ෂණය කෙරෙන බව සහතික කරගැනීමට නීති හෝ රෙගුලාසි නොමැතිවීම සම්බන්ධයෙන් බලවත් නොසන්සුන්භාවයක් ඇතිව තිබේ.

වරාය නගර පනත් කෙටුම්පතෙන් ජනාධිපතිවරයාට, වරාය නගර කොමිෂන් සභාවට හා එහි සභාපතිවරයාට කඩිනම් ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කරගැනීමේ කාර්යය සඳහා පූර්ණ බලතල පවරාදෙනු ලැබේ. එම කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලතල, තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් පවතින මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වියයුතු බවටත්, එම බලතල අත්තනෝමතික අන්දමින් අභිමතානුසාරී ලෙස භාවිතා කිරීම අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් විය හැකි බවටත් තීන්දු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවිය. එහෙත්, මෑතකාලීනව, රාජ්‍ය පරිපාලනය හමුදාකරණයට ලක්වීමේ නැඹුරුව ඇතුළුව ජනාධිපතිවරයා විසින් සිදුකළ බොහෝ පත්වීම් විධාපත්වූ මහජනතාවගේ සහ පාර්ලිමේන්තුවේ අභියෝගයකට ලක්වීමකින් තොරව සිදුවී තිබේ.

වරාය නගරයේ භූ-දේශපාලනික බලපෑම් සම්බන්ධයෙන් මහාචාර්ය ගුණසේකර අවධානය යොමු නොකරතත්, එක් ද්වීපාර්ශවීය හවුල්කරුවකු මත පමණක්, එනම් චීන රජය මත පමණක්ම යැපීම පිළිබඳව ද සැලකිල්ල යොමුකළයුතු බව ඇය සඳහන් කරයි. කලාපයේ ක්‍රමෝපායික මූල්‍ය කේන්ද්‍රයක් බවට පත්වීමේ අභිමතාර්ථයෙන් ඇතිකරන මෙම වරාය නගරය, භූ-දේශපාලනික මඩගොහොරුවක් බවට පත්වීමටත් සපුරාලන්න්ට නොහැකි වූ අපේක්ෂා හේතුවෙන් ආතතීන් උපදවන ස්ථානයක් බවට පත්වීමටත් ඉඩ තිබේ. ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම මෙන්ම, ඉන්දියාව සහ චීනය ඇතුළුව තවත් බලගතු රාජ්‍යයන් වෙත විවිධ අවස්ථාවලදී ආයෝජන සිදුකිරීමට ශ්‍රී ලංකාවෙන් ලබාදෙන අවස්ථා සඳහා ප්‍රවේශවීම සම්බන්ධයෙන් ඉන්දියාවත් චීනයත් අතර පවතින තරඟකාරී ස්වභාවය සලකා බලන කල මේ වරාය නගරය එවැනි තරඟ සඳහා තවත් කෙළි බිමක් වීමට ඉඩ තිබේ. මෙම ද්වී පාර්ශවීය සබඳතා මැනැවින් කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා කුසලතාසම්පන්න සහ වෘත්තීය ආකාරයෙන් කළමනාකරණයකිරීම අවශ්‍ය වන අතර විදේශ සබඳතා කළමනාකරණය කිරීමේදී දැනට ජනප්‍රිය ගනුදෙනුවාදී ප්‍රවේශයෙන් ඈත්වීමටත් සිදුවනු ඇත.[2] වර්තමානයේදී, වෘත්තීය විදේශසේවා රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් රාජ්‍යතාන්ත්‍රිකමය වශයෙන් වැදගත් ස්ථානවල තනතුරු බොහොමයකින් පසෙකට තල්ලු වී ඇති අතර විශේෂ පත්වීම් සිදුකිරීමේදී පවා අදාළ ධුරයට විශේෂ දයකත්වයක් ලබාදිය හැකි විශේෂඥ දැනුමක් ඇති අය සෑමවිටකම පත් නොවේ. වසංගතය සහ කෘෂි හා මූල්‍ය අර්බුදය අතරතුර පවා සෞඛ්‍ය සහ කෘෂිකර්මාන්තය හා මුදල් කටයුතු සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති වෘත්තිකයින් නොසලකා හැර තිබේ. මෙය අනාගතය සඳහා යහපත් තත්වයක් නොවේ.

ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී පාලන සංස්කෘතියක් තුළ ස්ථාපිතව ඇති අතර කාලයෙන් කාලයට, නායකයින් හට තමන්ගේ ක්‍රියා සඳහා

වගකියන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ව්‍යාපාර සඳහා හිතකාමී පරිසරයක් සහ ජනතා හිතකාමී පරිසරයක් සමබරව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් තිබේ. මේවා පරස්පර විරෝධී අරමුණු වශයෙන් නොදැකිය යුතුය.

වරාය නගර ව්‍යාපෘතිය යනු පාලනය, ආර්ථිකය සහ සමාජය සම්බන්ධ ගැටළු අන්තර්ඡේදනය කරන්නකි. රටේ ජාතික සම්පත් බොහෝ ප්‍රමානයක් ඊට ආයෝජනය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ජනතාව ඉන් ප්‍රතිලාභ ලැබිය යුතුවීම සාධාරණ ය. වරප්‍රසාද ලත් කිහිප දෙනෙකුට මහා පරිමාණයෙන් ලාභ උපදවාදීමට හැකියාව ඇති පරිසරයකින් තමන් වෙත යම් ප්‍රතිසංස්කරණ ක්‍රමයකින් පහළට රූරා එන තෙක් බලාසිටීමට තරම් ඉවසීමක් ජනතාවට තවදුරටත් නොමැත.

***ආචාර්ය සකුන්තලා කදිර්ගාමර්****

* ආචාර්ය සකුන්තලා කදිර්ගාමර් නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂවරිය වේ.

## පසු සටහන්

[1] ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 123(1)(ඇ) ව්‍යවස්ථාව

[2] වරාය නගරය, වඩාත් යහපත් ආර්ථික පාලනය, නව පාලන කලාපය තුළ පවාදීමට නොව අවධාරණයට ගතයුතු කරුණු වේ. ඇඩ්වොකාටා ආයතනය, hrttps://www.lankabusinessonline.com/opinion-port-city-better-economic-governance-not-giveaways-should-be-focus-of-new-governance-zone/

# විශේෂ ආර්ථික කලාප පිළිබඳ සංසන්දනාත්මක සමාලෝචනයක්: මිත්‍යාවන් හා මතභේද දුරලීම

*ආචාර්ය කෙහින්දේ ඔලොයේ හා ආචාර්ය දීනි සෙජ්කො**

*මෙම ලිපිය හරහා කතුවරුන් ජාතික සංවර්ධනය සඳහා නෛතික සහ ආර්ථික ව්‍යුහයක් වශයෙන් විශේෂ ආර්ථික කලාපවල භූමිකාව සැකෙවින්, සංසන්දනාතමකව විමසනු ලැබේ. විශේෂ ආර්ථික කලාප සම්බන්ධයෙන් වඩාත් සමබර සහ අපක්ෂපාතී දෘෂ්ටිකෝණයකින් සලකා බැලීම සඳහා එම කලාපවල සාර්ථකත්වය පිළිබඳ කථා සහ අසාර්ථකවීම් පිළිබඳව ද, එමෙන්ම මාධ්‍යවල ඒ සම්බන්ධයෙන් පලවූ විවේචන ද මෙම ලිපියෙන් විචාරාත්මකව විශ්ලේෂණය කෙරේ.*

ජාතික සංවර්ධනය සඳහා වූ ව්‍යූහ ලෙස විශේෂ ආර්ථික කලාප පිළිබඳ කෙටි සංසන්දනාත්මක විශ්ලේෂණයක් මෙම ලිපිය තුළින් සපයයි. විශේෂ ආර්ථික කලාප නිර්මාණය කිරීම හා ඒවායෙහි සිදු කෙරෙන මෙහෙයුම් සාමාන්‍යයෙන් මහජන සුපරික්ෂාවට සහ තරමක් අධික, එහෙත් සාධාරණ, විවේචන වලට ලක්වේ. මෙම දායකත්වය මගින් සාර්ථකත්වය පිළිබඳ කතාවල ඇගයීමක් සිදුකෙරෙන අතර, විශේෂ ආර්ථික කලාප පිළිබඳ වඩාත් සමබර සහ වාස්තවික ප්‍රතිරූපයක් ලබා දීම සඳහා අසාර්ථකත්වයන් හා මාධ්‍ය විවේචන ඉතා සියුම්ව පරික්ෂාවට ලක් කරයි. ඒ සමග ම, විශේෂ ආර්ථික කලාප පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම ද මෙම ලිපියෙහි අරමුණ වේ. ආසියාවේ සහ අප්‍රිකාවේ උදාහරණ වලින් පාඩම් උකහා ගනිමින් අපි උත්සාහ කරන්නේ කොළඹ වරාය නගරය සාර්ථකව ක්‍රියාවට නැංවීමට සහ මෙහෙයුම් සඳහා පාඩම් සපයා දීමටයි.

## හැඳින්වීම

1978 දී, ගිනිකොනදිග චීනයේ ගුවාංඩොං වෙරළබඩ පළාතේ පිහිටි ෂෙන්සෙන් ප්‍රදේශය, දළ වශයෙන් 330,000 ක් පමණ ජනගහනයක් සිටි, දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් මිලියන 2.87ක් පමණ වූ කුඩා ධීවර ගම්මානයක් විය.[1] මෙම ගම්මානය ඒ වන විටත් බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවති හොංකොං 'මූල්‍ය කේන්ද්‍රස්ථානයේ' සිට සැතපුම් 25 ක් තරම් නුදුරින් පිහිටියත්, මෙම ප්‍රදේශයේ සංවර්ධනය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

* ආචාර්ය කෙහින්දේ ඔලොයේ හොංකොං නගර විශ්ව විද්‍යාලයේ, නීති විද්‍යාලයේ පශ්චාත් දර්ශනශූරී උපාධී පර්යේෂකයෙකි.

ආචාර්ය දීනි සෙජ්කෝ හොංකොං හි චීන විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ තුලනාත්මක හා අන්තර්ජාතික නීතිය පිළිබඳ මධ්‍යස්ථානයේ පර්යේෂණ සාමාජිකාවක් වන අතර, ටෆ්ට්ස් විශ්ව විද්‍යාලයේ The Fletcher Network for Sovereign Wealth and Global Capital නැමති ජාලයේ අනුබද්ධිත පර්යේෂිකාවකි.

හොංකොං විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ අංශයේ නැඟී එන වෙළෙඳපොළ අධ්‍යයන පිළිබඳ ආයතනයට 'Green and Smart or Black and Clumsy? Examining the Role of Chinese Investors in ASEAN's Sustainable Development' සඳහා පර්යේෂණ ප්‍රදානය යටතේ ලබාදුන් සහයෝගය වෙනුවෙන් ආචාර්ය සෙජ්කෝ සිය ස්තූතිය පළ කර සිටියි.

දශක හතරකට පසුව චීනය ප්‍රථමවතාවට සිය 'විවෘත දොරටු ප්‍රතිපත්තිය' තුළින් විදේශ ආයෝජන සඳහා රට විවෘත කරන ලද අතර, ෂෙන්සෙන් එහි ප්‍රථම විශේෂ ආර්ථික කලාපය බවට පත්කරන ලදී. එමගින් ෂෙන්සෙන් "කුඩා ගම්මානයක" සිට අහස කරා නැගෙන සුවිසල් ගොඩනැගිලිවලින් යුක්ත නවීන පුරවරයක් බවට පරිවර්තනය විය. 2020 වර්ෂය වන විට එහි දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් බිලියන 429 දක්වා වර්ධනය වෙමින් එහි ආර්ථිකය 13,711 ගුණයකින් වර්ධනය වී ඇත.[2] ෂෙන්සෙන් නගරයෙහි වර්තමානයේ මිලියන 13 කට අධික ජනතාවක් වාසය කරන අතර, එය චීනයේ 'මහා තාක්ෂණික නගරය', 'වඩාත්ම නවෝත්පාදන සහ තරඟකාරී නගරය'වැනි අනුවර්ත නාම වලින් ද හඳුවන්වනු ලබන අතර, එය හුවාවේ, ලෙනොවෝ සහ ටෙන්සන්ට් වැනි ගෘහස්ථ නාමයන් සඳහා ද සත්කාරකත්වය සපයන නගරය වේ. ෂෙන්සෙන් පසුගිය දශක හතර තුළ චීනයේ ආශ්චර්යාත්මක ආර්ථික සංවර්ධනයේ සලකුණක් පමණක් නොව, විශේෂ ආර්ථික කලාප වලින් ඇති විය හැකි ආර්ථික දියුණුව තක්සේරු කිරීමේ පරමාදර්ශය බවට ද පත් වී ඇත.

විශේෂ ආර්ථික කලාප වලට දිගු ඉතිහාසයක් පැවතියත්, අග්නිදිග ආසියාවේ විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කිරීමෙහි ප්‍රගමනයක් ඇති වූයේ පසුගිය ශතවර්ෂය අගභාගයේදීය. රජයන් සහ ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වැනි අන්තර්ජාතික මූල්‍ය ආයතන අඩු කාර්ය සාධනයක් සහිත කලාපවල ආර්ථිකය සංවර්ධනය කිරීමේ මෙවලම් ලෙස මෙම විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කිරීම ප්‍රවර්ධනය කරන ලදී. පසුගිය වසර 25 පුරාවට, අග්නිදිග ආසියාවේ විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කිරීම උදෙසා රාජ්‍ය ආයතනවල සහ බහුපාර්ශ්වීය ආයතනවල නිල සංවර්ධන අනුග්‍රහය ලැබී ඇති අතර, එම කලාප වලට ජපානය, දකුණු කොරියාව, චීනය සහ යුරෝපා සංගමයේ සාමාජික රටවල් වැනි කලාපීය හා ගෝලීය ආර්ථික හවුල්කරුවන්ගෙන් සෘජු විදේශ ආයෝජන ගලා ආවේය. සේද මාවතෙහි සහ ඉන් ඔබ්බෙහි ඇති රටවල්[3] අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සහ චීනය හා සහභාගික රටවල් අතර වෙළෙඳ සහ ආයෝජන සබඳතා තවදුරටත් පුළුල් කිරීම අරමුණු කරගත්, 2013 දී දියත් කළ 'එක් තීරයක් - එක් මාවතක්' වැඩසටහන ද ගොඩබිම හා මුහුදුබඩ විශේෂ ආර්ථික කලාපවල ශක්‍යතාවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

2021 වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනතට අනුබලයදුන් කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය පසුගිය වසර කිහිපය තුළ ලොව පුරා ස්ථාපිත වූ විශේෂ ආර්ථික කලාප කිහිපයෙන් එකක් පමණි. 2021 වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනත සම්බන්ධයෙන් උණුසුම් වාදවිවාද ඇතිවූ පසුබිම තුළ, මෙම ලිපිය තුළින් ලොව පුරා විශේෂ ආර්ථික කලාප සහ විශේෂ ආර්ථික කලාප පිළිබඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේදී පැන නගින තීරණාත්මක සමාජීය හා නීතිමය ගැටලු පිළිබඳව කෙටි සංසන්දනාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරෙයි. විශේෂ ආර්ථික කලාප ආර්ථික වර්ධනය සහ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා වැදගත් වන ක්‍රියාමාර්ගයක් වුවත්, ඒවා සියල්ල විසඳන 'මැජික් පෙත්තක්' නොවන බවට අපි තර්ක කරමු. විශේෂ ආර්ථික කලාප සම්බන්ධ නීති සහ ගිවිසුම් විශේෂ ආර්ථික කලාපවල සංවර්ධනයට ඉතා වැදගත් වුවත්, මනා සැලසුම්කරණය සහ මනා පාලනය එහි සාර්ථකත්වය උදෙසා අත්‍යාවශ්‍යය වේ.

## භූගෝලීය වශයෙන් නිර්වචනය කළ ප්‍රදේශ

'විශේෂ ආර්ථික කලාප' යන්න යම් කලාපයක/රටක අනෙකුත් ප්‍රදේශ වලදී ලැබිය නොහැකි විශේෂ දිරිගැන්වීම් හා නීතිමය වැඩ පිළිවෙළ ලබාදීම මගින් විදේශීය ආයෝජන ආකර්ෂණනය කරගැනීම අරමුණු කරගත් භූගෝලීය වශයෙන් නිර්වචනය කළ ප්‍රදේශ වශයෙන් අර්ථ දැක්විය හැක. වඩාත් ම පුළුල් අර්ථයෙන් සලකා බැලීමේදී, 'විශේෂ ආර්ථික කලාප' යන යෙදුම ආර්ථික හා තාක්ෂණ සංවර්ධන කලාප (ETDZs), නිදහස් වෙළෙඳ කලාප (FTZs), අපනයන සැකසුම් කලාප (EPZs) සහ අධි තාක්ෂණික කාර්මික සංවර්ධන කලාප (HIDZs) වැනි අනෙකුත් ආර්ථික කලාප හැඳින්වීම සඳහාද භාවිතා කළ හැකි වුවත්, විශේෂ ආර්ථික කලාප ඒවාට වඩා වෙනස් වේ. ඒවායින් සාමාන්‍යයෙන් අපේක්ෂා කරනුයේ අපනයන ප්‍රවර්ධනය කිරීම, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, කාර්මික සංවර්ධනයක් වැඩිදියුණු කිරීම, රැකියා උත්පාදනය කිරීම, ආර්ථික විවිධාංගීකරණය කිරීම, නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම සහ ගෝලීය වටිනාකම් දාම (GVC) සහභාගිත්වයට සහාය වීමයි.

විශේෂ ආර්ථික කලාපවල අනිවාර්ය ලක්ෂණය වන්නේ ඒවායින් ආයෝජකයින්ට ලබා දෙන මූල්‍ය හා මූල්‍ය නොවන දිරි ගැන්වීම්ය. මෙම ආර්ථික කලාප පිහිටි ප්‍රදේශවල ඇති විවිධත්වය මෙන් ම මෙම දිරි ගැන්වීම් ද විවිධාකාර වුවත්, එමගින් භූමිය සඳහා වඩා පහසු ප්‍රවේශය, යටිතල පහසුකම් සහාය, බදු සහන, කඩිනම් ආරවුල් නිරාකරණ ක්‍රියාපිළිවෙත්, විශේෂ ව්‍යාපාර අවසර පත්‍ර සහ බලපත්‍ර හෝ සේවා නියුක්ති නීති සහ එක් වහලක් යටින් සියලු පහසුකම් සලසා දීම හරහා පරිපාලනය විධිමත් කිරීම ඇතුලු ව්‍යාපාර හිතකාමී රෙගුලාසි ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත.

විශේෂ ආර්ථික කලාප විවිධ වර්ග හා විවධ ස්වරූපයන්ගෙන් පවතී. දියුණු වෙමින් පවතින රටවල විශේෂ ආර්ථික කලාප සාමාන්‍යයෙන් කාර්මික සංවර්ධනය අරමුණු කරනු ලබන අතර, ඒවා බහු-කාර්මික, විශේෂීකරණය වූ හෝ ඉලක්කගත ඒවා විය හැකිය. සාමාන්‍යයෙන් විශේෂ ආර්ථික කලාප අවධානය යොමු කරනුයේ වෙළෙඳාම සහ නිෂ්පාදනය කෙරෙහි ය. කෙසේ නමුත්, ඒවා පසුගිය දශකය තුළ, අධි තාක්ෂණික, මූල්‍ය සේවා සහ සංචාරක ව්‍යාපාරය වැනි ප්‍රාථමික නොවන කර්මාන්ත කෙරෙහි යොමුවීමේ කැපී පෙනෙන වෙනසක් සිදු වී තිබේ. මෙම නව යුගයේ විශේෂ ආර්ථික කලාප බොහෝවිට අවධානය යොමු කරන්නේ වාණිජ්‍යකරණය, සංවරධනය සහ නාගරීකරණය කෙරෙහිය. කොළඹ වරාය නගරය එලෙස නිරීක්ෂණය වන එම ප්‍රවණතාවය සඳහා කදිම නිදසුනකි.

එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ සම්මේලනයේ (UNCTAD) 2019 වාර්තාවකට අනුව, ලොව පුරාරටවල් 147 ක ආසන්න වශයෙන් විශේෂ ආර්ථික කලාප 5,400 ක් පමණ දක්නට ලැබේ. මෙයින් කලාප 1,400 ක් ම පසුගිය වසර පහ තුළ බිහි වීම සුවිශේෂී කරුණක් වන අතර නව විශේෂ ආර්ථික කලාප 500 ට වැඩි ප්‍රමාණයක් බිහි වෙමින් පවතියි. විශේෂ ආර්ථික කලාප වැඩිම ප්‍රමාණයක් පවතිනුයේ චීනය, පිලිපීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, රුසියානු සමූහාණ්ඩුව, තුර්කිය, තායිලන්තය, ඩොමිනිකන් ජනරජය, කෙන්යාව සහ නිකරගුවාව යන රටවලය. පැහැදිලිව ම, ලෝකයේ විශේෂ ආර්ථික කලාප වලින් හතරෙන් තුනක්ම ආසියානුකලාපයේ පිහිටා ඇත.

පසුගිය දශකය පුරාවට චීන ආයෝජකයින් සෘජු විදේශ ආයෝජන මාර්ගයක් ලෙස සාමාන්‍යයෙන් දේශීය, පෞද්ගලික හා රාජ්‍ය හවුල්කරුවන් හා සහයෝගීත්වයෙන්

යුතුව විශේෂයෙන් ආසියාව සහ අප්‍රිකාව තුළ විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කර ඇත. චීන පිටිවහල ලබන විශේෂ ආර්ථික කලාප වලට උදාහරණ ලෙස චීන-ඕමාන (Duqm) කාර්මික උද්‍යානය, නයිජීරියාවේ චීන සහයෝගය ලබන ඔගුන්-ගුවාංඩොං නිදහස් වෙළෙඳ කලාපය (OGFTZ), චීන-පකිස්ථානු ආර්ථික කොරිඩෝව (CPEC) යටතේ කෛබර් පක්තුන්ක්වාහි ස්ථාපනය කර ඇති රෂාකයි විශේෂ ආර්ථික කලාපය, සහ චීනයට මායිම් වූ ලුවාන්ග් නම්තාහී බොටෙන් විශේෂ ආර්ථික කලාපය දැක්විය හැකිය. සිය යටිතල පහසුකම් සහ බදු දිරි ගැන්වීම් හේතුවෙන් "අග්නිදිග ආසියාවේ ආයෝජනය කරන චීන සමාගම් වලට පරාදීසයක්" වශයෙන් හඳුන්වනු ලබන, තායි-චීන රෙයොංග් (Rayong) කාර්මික කලාපය, 2006 දී චීන පුද්ගලික සමාගමක් වන හොලේ සමූහය (Holley Group) සහ තායිලන්තයේ අමාටා සමූහය (Amata Group) අතර හවුල්කාරිත්වයෙන් ස්ථාපනය කරන ලදී.

## විශේෂ ආර්ථික කලාප පිළිබඳ ගිවිසුම් සහ නීති සම්පාදනය

විශේෂ ආර්ථික කලාප මූලික වශයෙන්ම ස්ථාපනය කර නියාමනය කරනු ලබන්නේ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ නීති සඳහන් කර ඇති පනත්, නියෝග සහ රෙගුලාසි ස්වරූපයෙන් ඇති ජාතික නීති කරණ සම්පාදනයන් මගිනි. විශේෂ ආර්ථික කලාප පිළිබඳ නීති එම කලාප පිහිටා ඇති රටවල්මෙන් ම විවිධාකාර වේ. මෙම නීති සාධන පත්‍ර බොහෝ දුරට සත්කාරක රාජ්‍යයේ හෝ කලාපයේ සුවිශේෂී අවශ්‍යතාවන් පිළිබිඹු කරයි. වඩාත් වැදගත් කරුණ නම්, විශේෂිත අන්තර්ජාතික ආර්ථික නීති රීති සඳහා විධිවිධාන සලසන ලෝක වෙළෙඳ සංවිධානයේ ගිවිසුම්, නිදහස් වෙළෙඳ ගිවිසුම්, අන්තර්ජාතික ආයෝජන ගිවිසුම් සහ ද්විත්ව බදු ගිවිසුම් ආදී අන්තර්ජාතික ගිවිසුම් යටතේ වන රාජ්‍යයේ අන්තර්ජාතික බැඳීම් මගින් විදේශ ආයෝජකයින්[4] ආරක්ෂා කරන අතර, විශේෂ ආර්ථික කලාප වල මෙහෙයුම් සහ පාලනය සඳහා දැඩිව බලපෑම් කරනු ලබයි.

ජාතික නීති පද්ධති විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් ඇතුළත් වන පාර ජාතික නීති ක්‍රියාවලීන් හරහා ගෝලීයකරණය වූ ලෝකයක අන්තර් සම්බන්ධතා පවත්වන ආකාරය කෙසේද යන්නට විශේෂ ආර්ථික කලාප කදිම නිදර්ශනයකි. එහි මිශ්‍ර ප්‍රතිඵල තිබුණත්, ඕනෑම විශේෂ ආර්ථික කලාප පාලන තන්ත්‍රයක සාර්ථකත්වය උදෙසා ශක්තිමත් නියාමන රාමු, ශක්තිමත් ආයතන සහ යහපාලනය අත්‍යාවශ්‍ය සාධක බවට ප්‍රබල සාක්ෂි පවතියි. විශේෂ ආර්ථික කලාපවල නෛතික යටිතල පහසුකම් මගින් එම කලාපවල ප්‍රතිපත්ති ස්ථාවරව, විනිවිදභාවයෙන් යුක්තව සහ පුරෝකථනය කළ හැකි පරිදි ක්‍රියාවට නැංවීම සහතික කළ යුතුය. මෙවැනි හේතු නිසා, විශේෂ ආර්ථික කලාපවල පාලන අධිකාරින්ගේ වගකීම් ද පැහැදිලිව නිර්වචනය කළ යුතුය.

රටක් තුළ පවතින සියලුම විශේෂ ආර්ථික කලාපවලට අදාළ වන ජාතික විශේෂ ආර්ථික කලාප නීති ලොවපුරා බහුලවම භාවිතා වන විශේෂ ආර්ථික කලාප ප්‍රතිපත්ති සාධනපත්‍ර වේ. කෙසේ නමුත්, ඇතැම් රටවල් එකිනෙක විශේෂ ආර්ථික කලාප සඳහා වෙනමම නීති ස්ථාපනය කරමින් හෝ පළාත් පාලන ආයතනවලට නීති සම්පාදනය කිරීමේ බලතල පවරමින් වෙනස් ප්‍රවේශයන් අනුගමනය කර ඇත. එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ සම්මේලනයට අනුව, අවම වශයෙන් රටවල් 115 වත් විශේෂ ආර්ථික කලාප නීති සම්මත කරගෙන තිබේ. මෙම නීති වැඩි වශයෙන් ම දියුණු වෙමින් පවතින රටවල දක්නට ලැබේ.

විශේෂ ආර්ථික කලාප කළමනාකරණය කරන සහ ක්‍රියාත්මක කරන පාර්ශ්ව වන

රාජ්‍ය අධිකාරීන් අතර ඇති සම්බන්ධතා නියාමනය කරන අන්තර්ජාතික ගිවිසුම් විශේෂ ආර්ථික කලාපවල ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය මෙවලමක් වේ. විශේෂ ආර්ථික කලාප පිළිබඳ අධ්‍යයනයන්හි දී ප්‍රමාණවත් අවධානයක් යොමු නොවුණු මෙම ගිවිසුම්, සාමාන්‍යයෙන් සත්කාරක රජය හා විශේෂ ආර්ථික කලාපවල ක්‍රියාත්මක වන සමාගම් අතර අත්සන් කරනු ලබන, නියාමකයන්, හිමිකරුවන්, සංවර්ධකයන් සහ ක්‍රියාකරුවන් පත් කරනු සංවර්ධන ගිවිසුම් සහ හවුල්කාර ව්‍යාපාර වේ. මේ සඳහා වන මෑත කාලීන උදාහරණයක් වනුයේ සීමාසහිත කියුක්ෆියු (Kyaukphyu) විශේෂ ආර්ථික කලාප ඩීප් සීපෝර්ට් සමාගම ලෙස ලියාපදිංචි කර ඇති, චීන සමාගම් සමූහය CITIC මියන්මාර වරාය ආයෝජන සීමිත සමාගම සහ මියන්මාර රජය අතර 2020 වර්ෂයේ ස්ථාපනය කළ හවුල් ව්‍යාපාරයයි.

පහත දැක්වෙන වගුවෙන් පෙන්වා දෙන්නේ චීන රජයට අයත් ව්‍යාපාර සාමාන්‍යයෙන් චීන අනුග්‍රාහකත්වය ඇති විශේෂ ආර්ථික කලාපවල වැඩි ප්‍රතිශතයකට හිමිකම් කියන බවය. උදාහරණයක් වශයෙන්, ක්ෂඔෂක සමාගම් සමූහයේ සියයට 70 ක් වූ කොටසකට කියුක්ෆියු (Kyaukphyu) විශේෂ ආර්ථික කලාපයේ කාර්මික කලාපයෙන් සියයට 51ක් හිමි වන අතර මියන්මාර රජයට හිමි වන්නේ එයින් සියයට 49ක් පමණි. CITIC සමාගම මියන්මාර කියුක්ෆියු විශේෂ ආර්ථික කලාප පොදු සීමිත සමාගම යටතේ වන පෞද්ගලික මියන්මාර සමාගම් 42ක් ඇතුළත් වන කාර්මික කලාපයේ ඉදිකිරීම්වලද මූලිකත්වය දරයි. ප්‍රධාන වශයෙන් ම චීන හවුල්කාරිත්වයන් හේතුකොටගෙන මෙවන් අන්දමේ ගිවිසුම්වල වර්ධනයක් ඇති වී තිබේ. කෙසේ නමුත්, මෙම ගිවිසුම් රහස්‍ය ලියවිලි ලෙස පවතින අතර, ඔවුන් එකඟ වී ඇති සැබෑ කොන්දේසි මොනවාද යන්න ඇතැම්විට කිසි දිනෙකත් මහජන අවධානයට පත් නොවනු ඇත. විශේෂ ආර්ථික කලාපවලට ඇති බාධාවන් හා නීතිමය ආරවුල් ඇති වන්නේ විශේෂ ආර්ථික කලාපවල නීති සම්පාදනවල ප්‍රතිඵලයක් ලෙස නොව, විශේෂ ආර්ථික කලාප ගිවිසුම් කරන කොටගෙන බව මෙම පර්යේෂණයෙන් පෙන්වා දෙයි. මෙම ගිවිසුම් විදේශ ආයෝජකයින් හා රාජ්‍යයන් අතර අයෝජන බේරුම්කරණ ආරවුල්වලට හේතු වී තිබේ. විශේෂ ආර්ථික කලාප නීති මගින් විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කිරීමට අදාළ පොදු නෛතික රාමු නිර්වචනය කරන අතර, රජය සහ ආයෝජකයින් අතර ඇතිකර ගනු ලබන ගිවිසුම්වලින් සුවිශේෂී විශේෂ ආර්ථික කලාප පදනම් කරගත් ව්‍යාපෘතීන් සඳහා වඩාත් විශේෂිත නීති සපයා දීම එයට හේතුව විය හැකිය.

**තෝරාගත් විශේෂ ආර්ථික කලාප කිහිපයක හිමිකාරිත්ව ව්‍යුහය පෙන්වා දෙන වගුව**

| වර්ෂය | රාජ්‍යය | විශේෂ ආර්ථික කලාපය | වර්ගඵලය | වර්ගය | හිමිකාරිත්වය | නීත්‍යානුකූල ගිවිසුම |
|---|---|---|---|---|---|---|
| 2014 | ශ්‍රී ලංකාව | කොළඹ වරාය නගරය | හෙක්ටයාර 269 | සේවා | මුහුද ගොඩකරන ලද ඉඩම් වලින් 43% ක් චයිනා හාබර් ඉන්ජිනියරින් කොම්පැනි (CHEC) කොළඹ වරාය නගර (පුද්ගලික) සමාගමට 99 අවුරුදු බදු ක්‍රමය යටතේ බද්දට දෙන ලදී | ශ්‍රී ලංකාව හා චීන සන්නිවේදන ඉදිකිරීම් පුද්ගලික සමාගමේ (CCCC) කොටසක් වන චයිනා හාබර් ඉන්ජිනියරින් සමාගමේ අනුබද්ධ ආයතනයක් වූ චයිනා හාබර් ඉන්ජිනියරින් කම්පැනි (CHEC) කොළඹ වරාය නගර (පුද්ගලික) සමාගම අතර රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය |

## විශේෂ ආර්ථික කලාප පිළිබඳ සංසන්දනාත්මක සමාලෝචනයක්:

| වර්ෂය | රාජ්‍යය | විශේෂ ආර්ථික කලාපය | වර්ගඵලය | වර්ගය | හිමිකාරිත්වය | නීත්‍යානුකූල ගිවිසුම |
|---|---|---|---|---|---|---|
| 2020 | මියන්මාරය | කියුක්ෆියු විශේෂ ආර්ථික කලාපය | හෙක්ටයාර 1,708 | කාර්මික කලාප | CITIC සමූහය (51%) සහ මියන්මාරය (49%) | මියන්මාර වරාය ආයෝජන සමාගම (70%) සහ කියුක් ෆියු විශේෂ ආර්ථික කලාප කළමනාකරණ කමිටුව (30%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |
| 2020 | පකිස්ථානය | රෂාකයි විශේෂ ආර්ථික කලාපය | හෙක්ටයාර 406 | කාර්මික කලාප | - | කයිබර් පක්තුන්ක්වා ආර්ථික කලාප සංවර්ධන කළමනාකරණ සමාගම (KPEZDMC) සහ චයිනා රෝඩ් ඇන්ඩ් බ්‍රිජ් කෝපරේෂන් (CRBC) අතර සංවර්ධන ගිවිසුම |
| 2018 | ජිබුටිය | ජිබුටි අන්තර්-ජාතික නිදහස් වෙළෙඳ කලාපය | හෙක්ටයාර 4,800 | කාර්මික කලාප | - | චයිනා කොන්සෝර්ටියම් (60%) සහ ජිබුටි රාජ්‍යය (40%) |
| 2009 | ඉතියෝ-පියාව | ජින්ෆෙයි ආර්ථික හා වෙළෙඳ සහයෝගිතා කලාපය | හෙක්ටයාර 211 | කාර්මික | 100%ක් චීන හිමිකාරිත්වය සතුය | මොරිෂස් ජින්ෆෙයි ආර්ථික සහ වෙළෙඳ සහයෝගිතා කලාප සීමිත සමාගම - ෂැන්සි කොකිංකෝල් (30.2%), තායුවාන් අයන් ඇන්ඩ් ස්ටීල්ග෴ජ් සමාගම (50%) සහ ෂැන්ක්සි ටියාන්ලි එන්ටර්ප්‍රයිස් ව්‍යාපාර සමූහය (19.8%) |
| 2003 | සැම්බියාව | සැම්බියා-චීන ආර්ථික සහ වෙළෙඳ සහයෝගිතා කලාපය | හෙක්ටයාර 1,158 | කාර්මික | - | චයිනා නන්ෆෙරස් මෙටල් සමාගම (95%) සහ සැම්බියා කොන්සොලිඩේටඩ් කොපර් මයින්ස් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් සමාගම (5%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |
| - | බංගලා-දේශය | චිතගොන් විශේෂ ආර්ථික කලාපය | හෙක්ටයාර 303 | - | - | චයිනා හාබර් ඉන්ජිනියරිං සමාගම (70%) සහ බංග්ලාදේශ විශේෂ ආර්ථික කලාප අධිකාරිය (30%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |
| 2006 | නයිජීරියාව | ලෙක්කි නිදහස් වෙළඳ කලාපය | හෙක්ටයාර 16,500 | තෙල් සහ ගෑස් හා නිෂ්පාදන | | චීන-අප්‍රිකා ලෙක්කි ආයෝජන සමාගම (60%), ලාගෝස් ප්‍රාන්තය සහ නයිජීරියානු ආණ්ඩුව (40%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |
| 2005 | තායිලන්තය | තායි-චීන රෙයොංග් කාර්මික කලාපය | හෙක්ටයාර 1,200 | නිෂ්පාදන | - | හොලේ සමූහය (චීනය) (75%) සහ අමාටා සමූහය (තායිලන්තය) (25%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |
| 2008 | ඊජිප්තුව | ඊජිප්තු සුවස් ආර්ථික සහ වෙළෙඳ සහයෝගිතා කලාපය | හෙක්ටයාර 703.2 | කාර්මික | - | චීන-TEDA ආයෝජන සමාගම (75%) සහ ටියාන්ජින් TEDA සුවස් අන්තර්ජාතික සහායෝගිතා සමාගම (5%) අතර හවුල් ව්‍යාපාර ගිවිසුම |

මූලාශ්‍රය: කර්තෘ සම්පාදනයකි (2021)

## මිත්‍යාවන් සහ මතභේද

විශේෂ ආර්ථික කලාප මිත්‍යාවන් හා මතභේදවලින් පිරී පවතී. පුවත්පත් ශීර්ෂපාඨ නිරන්තරයෙන් සූරාකෑම්, ණය උගුල් සහ නව යටත් විජිතවාදය පිළිබඳ කතා පළ කරයි. පසුගිය කාලය මුළුල්ලෙහි චීන විදේශ ආයෝජන වර්ධනය වී ඇති බැවින්, අන්තර්ජාතික ආයෝජන සඳහා වූ තරගයක ලක්ෂණ සහිත, විදේශ ආයෝජන සඳහා වඩාත් බහු ධ්‍රැවීය අන්තර්ජාතික ආර්ථික පිළිවෙලකට තවදුරටත් දායක වෙන විශේෂ ආර්ථික කලාප දෙස පෙරටත් වඩා වැඩි සැකයකින් යුතුව බලනු ලැබේ. මීට අමතරව, විශේෂ ආර්ථික කලාප සාමාන්‍යයෙන් දියුණුවෙමින් පවතින රටවල් කේන්ද්‍රකර ගෙන, වඩා පුළුල් ව්‍යුහාත්මක, සමාජීය හා දේශපාලන අර්බුද සහිතව ස්ථාපනය වී ඇති බැවින්, ඒවායෙහි මෙහෙයුම් වඩාත් සංකීර්ණ තත්වයන් ඇතිවීමට හේතු විය හැකිය. මෑතකාලීනව චීන අනුග්‍රහය සහිත විශේෂ ආර්ථික කලාපවලට වැඩි අවධානය යොමු වෙමින්, ඒවා කෙරෙහි වඩාත් සෘණාත්මක අදහස් පළ කෙරුනත්, විශේෂ ආර්ථික කලාපවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දියුණු වෙමින් පවතින රටවල පවතින මෙවන් මතභේද සාමාන්‍යය වන අතර, චීන අනුග්‍රහය නොමැති විශේෂ ආර්ථික කලාප සඳහාද මෙය පොදු බව අත්‍යාවශ්‍යයෙන්ම පැහැදිලි කරගත යුතු වේ.

විශේෂ ආර්ථික කලාපවල ක්‍රියාකාරිත්වය වටා බැඳුණු ප්‍රධාන සමාජ-නෛතික මතභේද වනුයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ය. විශේෂ ආර්ථික කලාප ව්‍යාපෘති හේතුවෙන් විවිධ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු වී ඇත. මෑතකදී, හමුදා අනුග්‍රහය සහිත මියන්මාර ආර්ථික සංස්ථාවෙන් (MEC) කල්බදු ක්‍රමයට ලබා ගත් යැංගොං හි පිහිටි ඉඩමක ඩොලර් මිලියන 290ක් වැයකර වරායක් ඉදිකරමින් සිටින ඉන්දියාවේ අදානි වරාය හා විශේෂ ආර්ථික කලාප සමාගම වෙත, මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනා එල්ල වී ඇති මියන්මාර හමුදාව සමග ව්‍යාපාර සබඳතා පැවැත්වීම සම්බන්ධයෙන් චෝදනා එල්ලවී ඇත. ඇතැම් විශේෂ ආර්ථික කලාප ව්‍යාපෘතීන්ට ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන් සහ සිවිල් සමාජ සංවිධාන වලින් විරෝධතා එල්ල වී තිබේ. 2015 දී, චීන අනුග්‍රහය සහිත මොරිෂස්හි ජින්ෆෙයි විශේෂ ආර්ථික කලාපය සඳහා බදු දී තිබූ ඉඩම්වල සාම්ප්‍රදායිකව වගා කරමින් සිටි ගොවීන් උපවාසයක නිරත වූ බවට වාර්තා පළවිය. වඩාත් මෑතකදී, එනම් 2020 දෙසැම්බර් මාසයේදී, තායිලන්තයේ සොංකාලා පළාතේ වැසියන් එම පළාතේ අක්කර 6,600 ක ඉඩි කිරීමට නියමිත වූ විශේෂ ආර්ථික කලාපය පරිසරයට හානිකර විය හැකිබව සහ එය සිය ජන ජීවිතයට බාධා පැමිණවිය හැකි යයි පවසමින් එම විශේෂ ආර්ථික කලාපය ඉදිකිරීමේ සැලසුම්වලට එරෙහිව විරෝධය පෑහ.

විශේෂ ආර්ථික කලාප වලින් ඇති විය හැකි පාරිසරික බලපෑම දෙවන ප්‍රධාන ගැටලුවක් වේ. ඇතැම් විශේෂ ආර්ථික කලාප ව්‍යාපෘති වල, පාරිසරික බලපෑම් ආශ්‍රිතව පැන නැගුණු මතභේද ව්‍යාපෘතිය සැලකිය යුතු අන්දමෙන් ප්‍රමාද කිරීමට මෙන්ම ව්‍යාපෘති අවලංගු කර දැමීමට පවා හේතු වූ අවස්ථා ඇත. කැපී පෙනෙන උදාහරණයක් ලෙස 2013 දී ආරම්භ කරන ලද, මතභේදයට තුඩුදුන් බුරුමයේ ඩාවෙයි විශේෂ ආර්ථික කලාපය හැඳින්විය හැකිය. මෙම ව්‍යාපෘතිය අරමුදල් හිඟය, පාරිසරික හානි හා ගොවීන් බලහත්කාරයෙන් ඉවත් කරනු ලැබීම ආදිය සැලකිල්ලට ගනිමින් ප්‍රදේශවාසීන් එල්ල කළ විරෝධයන් වැනි බාධයකන් කිහිපයකටම මුහුණ දෙන ලදී. විශේෂ ආර්ථික කලාපයක භූගෝලීය පිහිටීම එහි සාර්ථකත්ව සඳහා හේතු වන මූලික මසාධකයක් වුවත්, විශේෂයෙන් ම දුර්වල පාලනයක් ඇති රටවල, ප්‍රාදේශීය ප්‍රජාවන් සැලකූ කල, මෙම 'උපායමාර්ගික ස්ථාන' ඔවුන්ගේ යහපැවැත්ම හා ජීවනෝපායන් කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරනු ලැබිය

හැක. කාම්බෝජයේ විශේෂ ආර්ථික කලාප සමහර පාරිසරික උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තා වල කේන්ද්‍රීය අවධානය වී ඇත. 2016 දී, කාම්බෝජයේ ස්වෙයි රියෙන්ග් ප්‍රාන්තයේ ඇඟලුම් නිෂ්පාදකයෙක් තායිවාන අනුග්‍රහයසහිත මැන්හැටන් විශේෂ ආර්ථික කලාපයෙන් පිරියම් නොකරන ලද අපජලය ඇල මාර්ගයකට මුදා හැරි බව සහ ඒ හේතුවෙන් එහි මත්ස්‍යයින් හා පශු සම්පත් මිය ගිය බවට වාර්තා විය. එම වසරේදීම, චීන ඉලෙක්ට්‍රොනික උපකරණ නිෂ්පාදකයෙකු වන කුවාන් ටෙක් ආයතනය විසින් නීති විරෝධීව ටැකියෝ පළාතේ දොළ පාරකට මලඅපද්‍රව්‍ය මුදා හැර ඇති බව කාම්බෝජ පරිසර නිලධාරින් විසින් සොයා ගන්නා ලදී.

කාම්බෝජය, ලාඕසය, තායිලන්තය සහ මියන්මාරය යන රටවල පිහිටි විශේෂ ආර්ථික කලාප තුළ චීන සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කම්කරු ප්‍රමිතීන්ට අනුකූල නොවීම, නීති විරෝධී සංක්‍රමණ සහ ඇතැම් කම්හල් වල පාරිසරික ප්‍රමිතීන් උල්ලංඝනය කිරීම වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් වලට තෝතැන්නක් බවට පත්ව ඇතැයි චෝදනා එල්ල වේ. කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සහ කම්කරු ආරක්ෂණ සම්මතයන් උල්ලංඝනය කිරීම ආසියාවේ විශේෂ ආර්ථික කලාප වල පවතින බරපතල ගැටලුවකි. විශේෂ ආර්ථික කලාපවල වැටුප්, ළමා ශ්‍රමය, සේවා නියුක්ති කොන්දේසි, සෞඛ්‍යය, සහ ආරක්ෂාව හා ශ්‍රමය සම්බන්ධව සේවකයින් සූරාකෑම මූලික අවධානයට ලක් විය යුතු කරුණු අතර වේ. උදාහරණයක් ලෙස, එන්කොක් හි පිහිටි ගැබොන් විශේෂ ආර්ථික කලාපයේ (GSEZ) ඉන්දියානු අනුග්‍රහය ලබන දැව සමාගමක සේවය කරන ඉන්දියානු සංක්‍රමණික සේවකයින් මිනිස් ජාවාරම් සහ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම ඇතුළු පහත් මට්ටමේ සේවා තත්ත්වයන්ට මුහුණපා සිටීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කරන ලද අනතුරු ඇඟවීම දැක්විය හැකිය.

ඉහත විමසා බලන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට අමතරව, විශේෂ ආර්ථික කලාපවල ක්‍රියාකාරිත්වය තුළින් අනෙකුත් දේශපාලන මතභේද ද මතු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම, පැවති ආණ්ඩු වෙනස් වූ අවස්ථා වල දී, විශේෂ ආර්ථික කලාප ගිවිසුම් නැවත සාකච්ඡාවට බඳුන් වීම දැක්විය හැකියි 2015 වර්ෂයේදී, මියන්මාරයේ මහ මැතිවරණයට කෙටිකාලයකට පෙර, කියුක්ෆියු විශේෂ ආර්ථික කලාපය සංවර්ධනය කිරීම සඳහා වූ ගිවිසුම මගින් එරට චීනය සමග රට “ණය උගුලකට” හසුවේය යන කරුණ මත එමවිශේෂ ආර්ථික කලාපය ඉදිකිරීම ප්‍රමාද කරන ලදී. 2021 ජනවාරි මාසයේ දී, තායිලන්තයේ ඉදිකිරීම් ප්‍රමුඛයෙක් වන ඉතාලි-තායි සංවර්ධන සමාගම සමග තමන් එළඹ තිබූ ගිවිසුම් දිගින් දිගටම සිදු වූ ප්‍රමාදයන් සහ මූල්‍ය ගිවිසුම් කඩ කිරීම් හේතුකොටගෙන අවලංගු කරන බව මියන්මාරය ප්‍රකාශ කළේය. ටැන්සානියාව සහ චීන මර්චන්ට් හෝල්ඩිංග්ස් ඉන්ටර්නැෂනල් සමාගම අතර විශේෂ ආර්ථික කලාපයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් 2013 වර්ෂයේදී එළඹ තිබූ ගිවිසුම ජනාධිපති ජෝන් මගුෆුලි යටතේ අත්හිටුවන ලදී. එහෙත් ජනාධිපති මගුෆුලිගේ අභාවයෙන් පසු පත්වූ ජනාධිපති සමියා සුලුහු හසන් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නැවත සලකා බලමින් සිටියි.

### සාර්ථකත්වයන් පිළිබඳ කතා

ආසියාවේ හා අප්‍රිකාවේ පවතින විශේෂ ආර්ථික කලාප සාමාන්‍යයෙන් හොඳ මට්ටමකින් ක්‍රියාත්මක වී නොමැත යන අදහස ඉහත සඳහන් විස්තර වලින් පෙන්වා දෙයි. එහෙත්, විශේෂ ආර්ථික කලාප වලින් ලබා දෙනු ලබන විශේෂ දිරි ගැන්වීම් මගින් සැලකිය යුතු අන්දමේ සෘජු විදේශ ආයෝජන ගලා එන්නේද යන්න සහ ඒවායෙහි සමස්ථ පිරිවැය හා ප්‍රතිලාභ පිළිබඳව තවමත් මිශ්‍ර සාක්ෂි පවතී. කෙසේ නමුත්, සාර්ථකත්වයේ

කතන්දර කිහිපයත් තිබෙන අතර, අවස්ථා ගණනාවකදී, විශේෂ ආර්ථික කලාප ඒවායෙහි ගිවිසුම් වලින් අරමුණු කරන ලද පරිදි සත්කාරක රාජ්‍යයේ සහ විදේශ ආයෝජකයන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කර ඇත.[5] ඊශ්‍රායලයේ, සෞදි අරාබියේ සහ ඊජිප්තුවේ දේශ භූමි දක්වා විහිදී යන අක්බා විශේෂ ආර්ථික කලාපය 2001 වර්ෂයේ දී ජෝර්දානයේ හෂිමයිට් රාජධානිය විසින් ස්ථාපිත කරන ලදී. මෙහි ආරම්භයේ සිට, මෙම විශේෂ ආර්ථික කලාපය ඩොලර් මිලියන 500 ට ආසන්න වටිනාකමක් ඇති ආයෝජන ගිවිසුම් 100 ට අධික සංඛ්‍යාවකට එළඹ ඇති අතර, පුද්ගලයින් 2,000 ට අධික සංඛ්‍යාවකට රැකියා අවස්ථා උත්පාදනය කර ඇත. 2010 දී ඕලාම් අන්තර්ජාතික සමාගමෙහි (40.5%), ගැබොන් ජනරජයෙහි (38.5%), සහ අප්‍රිකානු මූල්‍ය සංස්ථාවෙහි (21%) හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරන ලද ගැබොන්හි (එන්)කොක් විශේෂ ආර්ථික කලාපය සාර්ථක වි ඇත. කාම්බෝජයේ වුවද, කාම්බෝජයේ වඩාත්ම දිළිඳු ප්‍රදේශයක් ලෙස පැවති ස්වෙයි රියෙන්ග් ප්‍රදේශයේ 2020 මුල් කාර්තුවේදී මෙම වසංගත තත්ත්වය හමුවේ පවා අපනයනය ඩොලර් මිලියන 237 කින් වැඩි වූ අතර එයට මූලික ම හේතුව වූයේ එම කලාපය චීන සමාගම් වලට නිෂ්පාදන මධ්‍යස්ථානයක් බවට පත් කරමින් ස්ථාපනය කළ විශේෂ ආර්ථික කලාප නිසාය.[6]

මැදපෙරදිග, අප්‍රිකාව සහ දකුණු ආසියාව සඳහා මූල්‍ය මධ්‍යස්ථානයක් වශයෙන් 2004 දී ස්ථාපනය කරන ලද ඩුබායි අන්තර්ජාතික මූල්‍ය මධ්‍යස්ථාන විශේෂ ආර්ථික කලාපය, වාර්තාගත අන්දමින් ඉහළ ගිය වෙළෙඳ සහ ආයෝජන ප්‍රවාහයන් සඳහා සාර්ථකව පහසුකම් සලසා තිබේ. ඒ සමගම, ඩුබායි අන්තර්ජාතික මූල්‍ය මධ්‍යස්ථානය කලාපයේ වාණිජ්‍යය ආරවුල් විසඳීම සඳහා වන වැදගත් මධ්‍යස්ථානයක් බවට ද පත්වී ඇත.

මනා සැලැස්ම, සහ ප්‍රගාමී අන්තර්-ආයතන සහ අන්තර්-රාජ්‍ය සම්බන්ධීකරණය යනාදී කරුණු විශේෂ ආර්ථික කලාප වල සාර්ථකත්වයට ඉතා වැදත් වේ. 2018 වර්ෂයේ දී නැගෙනහිර ආර්ථික කොරිඩෝව පනත යටතේ තායි රජය විසින් චාචොඑන්ග්සාවො, චොංබුරි සහ රායොංග් යන පළාත් සංවර්ධනය කිරීම පිණිස විදේශ ආයෝජකයන් ආකර්ශනය කර ගැනීම මගින් ආර්ථිකය වර්ධනය ඉහළ නංවාගැනීම සඳහා ස්ථාපනය කරන නැගෙනහිර ආර්ථික කොරිඩෝව (EEC) මනාව සැලසුම් කරන ලද විශේෂ ආර්ථික කලාපයක් සඳහා හොඳ නිදසුනකි. නැගෙනහිර ආර්ථික කොරිඩෝව පනත මගින් ජාත්‍යන්තර තරඟකාරිත්වය ඉහළ නැංවීම උදෙසා කලාපයේ විවිධ ආර්ථික අංශ දියුණු කිරීම පිණිස පුළුල්, බහුතල සැලසුම් සඳහා විධිවිධාන සලසා ඇත. නැගෙනහිර ආර්ථික කොරිඩෝ සැලැස්ම තුළින් තායිලන්තයේ බැංකොක් ප්‍රදේශය සහ අනෙක් ප්‍රදේශ අතර පවතින ආර්ථික අසමතුලිතතාව සමනය කරයි.

නැගෙනහිර ආර්ථික කොරිඩෝ කාර්යාලය සහ තායි රජය විසින් නැගෙනහිර ආර්ථික කොරිඩෝ කලාපයේ පෞද්ගලික හා රජයට අයත් ආයෝජකයින් සඳහා රාමුවක් නිර්මාණය කිරීම පිණිස චීන රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන සමග බහුවිධ අවබෝධතා ගිවිසුම් ගණනාවක් ම අත්සන් තබා තිබේ. මෙම අවබෝධතා ගිවිසුම් මගින් Greater Bay Area ප්‍රදේශය සහ නැගෙනහිර ආර්ථික කොරිඩෝව අතර ඩිජිටල් ආර්ථිකය, ස්වයංක්‍රීයකරණය, පර්යේෂණ සහ සංවර්ධනය සහ නවෝත්පාදනය වැනි පොදු උනන්දුවක් සහිත ක්ෂේත්‍රවල සහක්‍රියාවන් සහ සහයෝගිතාවයන් ඇති කිරීමට උපකාරී වේ. නැගෙනහිර ආර්ථික කොරිඩෝව පනත මගින්නව ආර්ථික ක්ෂේත්‍රයන්හි නැගී එන ස්වාභාවයට සහාය විමට නොහැකි, යාවත්කාලීන නොවූ පවතින නීති අභිබවා කටයුතු කිරීමට නැගෙනහිර

ආර්ථික කොරිඩෝ කාර්යාලයට නීතිමය බලය ලබා දෙන අතර, එමගින් නැගෙනහිර ආර්ථික කොරිඩෝව තුළ නව නිෂ්පාදන සහ සේවා අත්හදා බලන ආයෝජකයින් හට ඉතාම යෝග්‍ය කාර්ය රාමුවක් නිර්මාණය කර දෙයි.[7] සමස්ථයක් වශයෙන්, නැගෙනහිර ආර්ථික කොරිඩෝව විශේෂ ආර්ථික කලාප මගින් බහුවිධ හවුල්කරුවන් ඇතුළත් වන අන්තර්ජාතික ක්‍රියාමාර්ගසාර්ථක ලෙස දේශීය අරමුණු සමග සංකලනය කරගන්නේ කෙසේද යන්න පිළිබඳ පාඩම් කියා දෙයි.

## කොළඹ වරාය නගරයඃ අවස්ථා සහ පාඩම්

කොළඹ වරාය නගරය රටේ සිවිල් සමාජ කණ්ඩායම් සහ මහජනතාවගේ දැඩි විවේචනයට ලක්ව තිබේ. මැයි මාසයේදී, පුද්ගලයින් සහ සංවිධාන විසින් 2021 කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත මගින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කරමින් ප්‍රබල ආර්ථික කොමිෂන් සභාවක් ස්ථාපනය කරන බවට තර්ක කරමින්, එම පනත් කෙටුම්තෙහි විධිවිධාන අභියෝගයට ලක් කරමින් ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පෙත්සමක් ගොනු කරන ලදී. කොළඹ වරාය නගරය ශ්‍රී ලංකාවේ ණය බර තවත් වැඩි කරනු ඇති බවටත්, කොළඹ නගරය මුදල් විශුද්ධිකරණ මධ්‍යස්ථායක් බවට පත් වනු ඇති බවටත්, බදු සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ පාර්ලිමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලැබීම තහනම් කරනු ඇති බවටත් විචාරකයින් තර්ක කළහ. එමෙන්ම, මෙම පනත මගින් ශ්‍රී ලංකාව තුළ චීන ජනපදයක් (කොලනියක්) නිර්මාණය වනු ඇති බවට විචාරකයින් තර්ක කළහ. කොළඹ වරාය නගරය ආශ්‍රිත මෙම මතභේද බාහිර සිදුවීම්වල බලපෑමකින් තොරව බිහිවූ ඒවා නොවේ; ඒවා තවත් ප්‍රමුඛ චීන අනුග්‍රහය ලබන ව්‍යාපෘතියක් වන හම්බන්තොට වරාය[8] සම්බන්ධ දේශීය හා අන්තර්ජාතික විවාද සමග සම්බන්ධිත වේ.

ඒ කෙසේ වුවත්, කොළඹ වරාය නගර පනත් කෙටුම්පත සම්මත වී ඇති අතර, කොළඹ වරාය නගර අධිකාරියට දැන් කොළඹ වරාය නගරය පිළිබඳ අධීක්ෂණය කිරීමට අවසරය ඇත. පහත වගුවෙන් පෙන්වා දෙන පරිදි, මෙම 2021 පනත අනෙකුත් රටවල පනවා ඇති විශේෂ ආර්ථික කලාප නීති වලට සමානකම් දක්වන නමුත් එය පැහැදිලිවම කොළඹ වරාය නගරය සඳහා ම පනවා ඇති බැවින් එය සුවිශේෂී වේ.

**මෑත කාලීන විශේෂ ආර්ථික කලාප නීති පෙන්නුම් කරන වගුව**

| වර්ෂය | රජය | විශේෂ ආර්ථික කලාප නීතිය | ප්‍රධාන අරමුණ |
|---|---|---|---|
| 2021 | ශ්‍රී ලංකාව | කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත | විශේෂ ආර්ථික කලාපයේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි කිරීම්, බලපත්‍ර ලබා දීම්, අවසර ලබාදීම් සහ වෙනත් අනුමැතීන් ලබාදීම සඳහා බලතල සහිත කොමිසමක් පිහිටුවීම |
| 2014 | නැගෙනහිර ටිමෝරය | ඔඑකස් සහ අතවුරෝ නීතියේ සමාජ වෙළෙඳපොළ විශේෂ ආර්ථික කලාපය | ඔඑකස් සහ අතවුරෝ විශේෂ ආර්ථික කලාපය ස්ථාපිත කිරීම |
| 2021 | චීනය | චීන මහජන සමූහාණ්ඩුවේ හයිනන් නිදහස් වෙළෙඳ වරාය නීතිය | චීන අංගයන් සහිතව උසස් මට්ටමේ හයිනන් නිදහස් වෙළෙඳ වරායක් ඉදි කිරීම |
| 2015 | කෙන්යාව | 2015 විශේෂ ආර්ථික කලාප පනත | විශේෂ ආර්ථික කලාප ස්ථාපිත කිරීම සහ ගෝලීය හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම |

| | | | |
|---|---|---|---|
| 2014 | මියන්මාරය | මියන්මාර විශේෂ ආර්ථික කලාප පනත | විශේෂ ආර්ථික කලාපවල දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවාහය ප්‍රවර්ධනය කිරීම සහ ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන අරමුණු වලට සහාය වීම |
| 2015 | බොට්ස්වානා | 2015 විශේෂ ආර්ථික කලාප පනත | විශේෂ ආර්ථික කලාප ස්ථාපනය කිරීම, සංවර්ධනය සහ කළමනාකරණය සඳහා විධිවිධාන සැලසීම |
| 2021 | වෙනිසියුලාව | වෙනිසියුලානු විශේෂ ආර්ථික කලාප කාබනික නීතිය | විශේෂ ආර්ථික කලාප නිර්මාණය කිරීම, සංවිධානය, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය නියාමනය කිරීම |
| 2014 | දකුණු අප්‍රිකාව | 2014 අංක 16 දරණ විශේෂ ආර්ථික කලාප පනත | විශේෂ ආර්ථික කලාප නම් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමානාකරණය කිරීම සඳහා විධිවිධාන සැලසීම |
| 2020 | ඇන්ගෝලාව | නිදහස් වෙළෙඳ කලාප පනත | නිදහස් කලාප බිහි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම |
| 2012 | පකිස්ථානය | 2012 විශේෂ ආර්ථික කලාප පනත | දේශීය හා අන්තර්ජාතික ආයෝජකයන් දිරිමත් කිරීමට අවශ්‍ය නීති සහ නියාමන රාමුවක් තුළින් විශේෂ ආර්ථික කලාප නිර්මාණය කිරීම, වැඩි දියුණු කිරීම සහ මෙහෙයවීම |

මූලාශ්‍රයः කර්තෘ සම්පාදනයකි (2012)

කොළඹ වරාය නගරය මූල්‍ය සහ සේවා මධ්‍යස්ථානයක් ලෙස සහ දකුණු ආසියාවේ තරු පන්තියේ නගරයක් ලෙස ප්‍රවර්ධනය කරමින් තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම සේවා කේන්ද්‍රීය විශේෂ ආර්ථික කලාපය වන මෙම වරාය නගරය සාර්ථකත්වයට පත් වුවහොත් එය කලාපය තුළ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත්වනු ඇත. මුල් වසර පහ තුළදී වරාය නගරය රැකියා අවස්ථා 200,000 ක් උත්පාදනය කරනු ඇති බව ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා මෑතකදී කළ කතාවකදී ප්‍රකාශ කළේය.[9] 2041 දී වරාය නගරය ඉදි කර නිමවූ පසු, එය සෘජු විදේශ ආයෝජන තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අවම වශයෙන් වර්ෂයකට ඩොලර් මිලියන 740 ක දායකත්වයක් සපයනු ඇතැයි පුරෝකථනය කර ඇත. වරාය නගරය ක්‍රියාත්මක කිරීමත් සමග ස්මාර්ට් සහ හරිත නගර බිහිවීම දක්වා ගමන් කිරීමට උපකාරී වන තිරසාර වටිනාකම් නිර්මාණය වනු ඇත. මේවා ගෝලීය ප්‍රවනතාවන්ට අනුරූප වන සුවිශේෂී අරමුණු වන නමුත්, ඒවායෙහි ඵලදායීතාව තක්සේරු කළ හැක්කේ කාලය ගත වන විට පමණි.

## සමාප්තිය

විශේෂ ආර්ථික කලාප යනු පුරෝකථනය කළ හැකි රජයේ ප්‍රතිපත්ති, මනා ජාත්‍යන්තර ආර්ථික සබඳතා කළමනාකරණය සහ නිසි යටිතල පහසුකම් අවශ්‍ය කරන දිගුකාලීන ව්‍යාපෘති වේ. උපායමාර්ගික පිහිටීම, කලාපයේ උපායමාර්ග සමස්ථ සංවර්ධන උපායමාර්ගය සමග සංකලනය කිරීම, සහ වෙළෙඳපොළ හඳුනාගෙන සංසන්දනාත්මක වාසියෙහි උපරිම ප්‍රයෝජන ලබා ගැනීම අනෙකුත් වැදගත් කරුණු ලෙස දැක්විය හැකිය. මෙම කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා දැඩි සහ ඔරොත්තු දෙන නීති සහ රෙගුලාසි අත්‍යවශ්‍ය වේ. කොවිඩ්-19 වසංගතයෙන් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත් වන විට, විශේෂ ආර්ථික කලාප කළමනාකරණය කිරීම තවදුරටත් දුෂ්කර විය හැක. එහෙත්, ඒ සමගම, රටවල් සහ නිෂ්පාදකයින් තනි ප්‍රභවයන්ට නිරාවරණය වීම අඩුකිරීමට සලකා බලමින් ගෝලීය වටිනාකම් ජාල (GVC) කෙටි කිරීමට අරමුණු කරන විට ඒවායෙහි වැදගත්කම තවතවත් වැඩි වේ.

විශේෂ ආර්ථික කලාප යනු ඉහළ සෘජු විදේශ ආයෝජන ගලා ඒම සියයට සියයක් සහතික කරන්නක් හෝ ආර්ථික සංවර්ධනය සහ දියුණුව සඳහා වන මැජික් විසඳුමක් හෝ නොවේ. විශේෂ ආර්ථික කලාප ව්‍යාපෘති වල ඇති සංකීර්ණත්වය සහ ඒ ආශ්‍රිතව පවතින බහු-ස්ථර ගැටලු සඳහා පුළුල්, බහු-විෂයයික විශ්ලේෂණයක් අවශ්‍ය වේ. නීති විශ්ලේෂණ වලට අමතරව, ආර්ථික විශේෂඥයින් සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම මගින් විශේෂ ආර්ථික කලාප වලින් පැන නැගිය හැකි භූ-ආර්ථික අවදානම් පිළිබඳ ගෝලීය දළ විශ්ලේෂණයක් ලබාගත හැකිය. රජයන් ප්‍රවේශම් සහගත විය යුතු අතර, විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමට විවෘත වෙමින්, ඉදිරියේ ඇතිවිය හැකි ගැටලු දුටු වහාම ඒවාට විසඳුම් ලබා දීමට සූදානමින් සිටිය යුතුය.

කොළඹ වරාය නගරයේ දිගු කාලීන සාර්ථකත්වය රඳා පවතිනුයේ, කාර්යක්ෂම නීති, විනිවිදභාවයෙන් යුතු විශේෂ ආර්ථික කලාප ගිවිසුම් සහ වන ආයෝජකයන් ආකර්ෂණය කරගැනීමට එයට ඇති හැකියාව මතය. ආර්ථික දර්ශක වලින් ඔබ්බට සලකා බැලීමේදී, කොළඹ විශේෂ ආර්ථික කලාපයේ පුළුල් සාර්ථකත්වය හා නීත්‍යානුකූලභාවය රඳා පැවතිය හැක්කේ, මහජන අවධානයන් හා මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා සමාන වැදගත්කමක් ලබාදීමට නියාමකයන්ට පවතින හැකියාව මතය. වරාය නගර අධිකාරිය, ශ්‍රී ලංකා රජය, රාජ්‍ය ආයතන සහ ව්‍යාපෘති සංවර්ධකයින් යන සියලු දෙනා ආයෝජනයන් මගින් පරිසරයේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල නොවන බව තහවුරු කර ගැනීම පිණිස තමන්ගේ සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කළ යුතුය. මෙම පත්‍රිකාවෙහි විමසා බලන ලද උදාහරණවලින්, විශේෂයෙන් ම තායිලන්තයේ නැගෙනහිර ආර්ථික කොරිඩෝව මගින්, පෙන්වා දෙන ආකාරයට, ශ්‍රී ලංකාව චීන හවුල්කරුවන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන ආයෝජන වලට අමතරව, විවිධ රාජ්‍යයන් හා හවුල්කරුවන්ගෙන්ද සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට උත්සාහ කරන බව සහතික කර ගත යුතුය.

## පසු සටහන්

1 Yiming Yuan, Hongyi Guo, Hongfei Xu, Weiqi Li, Shanshan Luo, Haiqing Lin and Yuan Yuan 'China's First Special Economic Zone: The Case of Shenzhen' in Douglas Zhihua Zeng (ed), Building Engines for Growth and Competitiveness in China Experience with Special Economic Zones and Industrial Clusters (The World Bank 2010)55, 57 (noting that Shenzhen's GDP was US$2.87 million in 1978).

2 Qianer Liu, Sue-Lin Wong and Jane Pong, 'Hong Kong v Shenzhen: The Battle for Supremacy' Financial Times (21 January 2020) <https://www.ft.com/content/8cf60164-2209-11ea-92da-f0c92e957a96> accessed 15 July 2021

3 බ්‍රයන් මර්කියුරියෝ සහ දීනි සෙජ්කෝ, 'සේද මාවතේ හිඩැස්: චීනයේ 'එක් තීරයක්, එක් මාවතක්' වැඩසටහන යටතේ ආයෝජකයින්ගේ ආරක්ෂාව' (2019) 14 ගෝලීය වෙළෙඳ සහ රේගු සඟරාව 5 ('එක් තීරයක්, එක් මාවතක්' වැඩසටහනෙහි පොදු බලපෑම සහ 'එක් තීරයක්, එක් මාවතක්' වැඩසටහන සම්බන්ධ ආයෝජන තන්ත්‍රයේ අවදානම සාකච්ඡා කරනු ලැබේ).

4 ජුලියන් චයිසේ සහ ජෝර්පියෝ දිමිත්‍රෝපාවුලොස්, 'අන්තර්ජාතික ආර්ථික නීති තුළ විශේෂ ආර්ථික කලාප: ඒකපාර්ශවික ආර්ථික නීතිය දෙසට' (2021), 24 අන්තර්ජාතික ආර්ථික නීතිය පිළිබඳ සඟරාව 229.

5 ඉහළ කාර්යසාධනයක් සහිත විශේෂ ආර්ථික කලාප ෆයිනෑන්ෂියල් ටයිම්ස් හි FDI Intelligence Free Zones Awards සම්මානයෙන් පිළිගැනීමට ලක් කරයි. එමෙන්ම, යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට සමත් වූ විශේෂ ආර්ථික කලාප ඉස්මතු කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් o SEZ Awards විශේෂ ආර්ථික කලාප සම්මානය ස්ථාපනය කළේය.

6 චුට් බන්තොයුන්, 'ස්වෙයි රියෙන් හරහා සිදුවන අපනයන ඩොලර් මිලියන 237කින් ඉහළ යයි ZKhmer Times :2020 අප්‍රේල් 16) <https://www.khmertimeskh.com/713731/exports-through-svay-rieng-increase-by-237-million/> 2020 ජූලි 16 පිවිසිණි.

7 නැගෙනහිර ආර්ථික කොරිඩෝ ව්‍යාපෘතියෙහි වැදගත්කම පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සඳහා දීනි සෙජ්කෝ සහ ඇල්බට් පාර්ක් ගේ, 'ආසියාවේ එක් තීරයක්, එක් මාවතක් වැඩසටහ: තායිලන්තය' (2020 දෙසැම්බර්) හොංකොං විද්‍යා හා තාක්ෂණ විහ්වවිද්‍යාලය, නැඟී එන වෙළෙඳපොළ අධ්‍යයන සඳහා වන ආයතනය, පර්යේෂණ පත්‍රිකාව බලන්න <https://cutt.ly/OmGCE3Z>ප්‍රවේශ වූ දිනය: 2021 ජූලි 15.

8 ළරැිස හෝල්වර්ට් හන්ග්, 'ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරාය: චීනයේ ණය රාජ්‍යෝපාය ණදාණය සඳහා උදාහරණයක්' රාජ්‍ය ප්‍රතිපත්තී සහ නායකත්වය සහ රාජ්‍ය ප්‍රතිපත්ති විධායක අධ්‍යාපන ආයතනය, හොංකොං විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය, පර්යේෂණ වාර්තාව 2020026a (2021) <https://cutt.ly/RmGMrXY> ප්‍රවේශ වූ දිනය: 2021 ජූලි 15.

9 ප්‍රානයි ෂර්මා, 'ඇමරිකානු ඩොලර් බිලියන 1.4 ක වරාය නගර ව්‍යාපෘතියත් සමඟ ශ්‍රී ලංකාව කෙරෙහි චීනයේ බලපෑම වර්ධනය වීම පිළිබඳ ඉන්දියාවේ අවධානය' South China Morning Post (2021 cqks 8) <https://www.scmp.com/week-asia/economics/article/3136486/indias-concerns-over-chinas-rising-influence-sri-lanka-grow> ප්‍රවේශ වූ දිනය: 2021 ජූලි 16.

## ආශ්‍රේය ග්‍රන්ථ


Bunthoeun C, 'Exports Through Svay Rieng Increase by $237 million' Khmer Times (16 April 2020) <https://www.khmertimeskh.com/713731/exports-through-svay-rieng-increase-by-237-million/> accessed 16 July 2020

Chaisse J and Dimitropoulos G, 'Special Economic Zones in International Economic Law: Towards Unilateral Economic Law' (2021) 24 Journal of International Economic Law 229

Cotula L and Mouan L, 'Special Economic Zones: Engines of Development or Sites of Exploitation?' (IIED Briefing October 2018) <https://pubs.iied.org/sites/default/files/pdfs/migrate/17481IIED.pdf> accessed 16 July 2021

Hung H, 'Sri Lanka's Hambantota Port: A Case of China's Debt Diplomacy' Institute for Public Policy, and Leadership and Public Policy Executive Education at the Hong Kong University of Science and Technology Research Report 2020026D (2021) <https://cutt.ly/RmGMrXY> accessed 15 July 2021

Liu Q, Wong S and Pong J, 'Hong Kong v Shenzhen: The Battle for Supremacy' Financial Times (21 January 2020) <https://www.ft.com/content/8cf60164-2209-11ea-92da-f0c92e957a96> accessed 15 July 2021

Mercurio B and Sejko D, 'Holes in the Silk: Investor Protection under China's Belt and Road Initiative' (2019) 14 Global Trade and Customs Journal 5

Sejko D and Park A, 'The Belt and Road Initiative in Asia: Thailand' (December 2020) Hong Kong University of Science and Technology Institute for Emerging Market Studies Research Paper <https://cutt.ly/OmGCE3Z> accessed 15 July 2021

Sharma P, 'India's Concerns Over China's Rising Influence in Sri Lanka Grow with Progress of US$1.4 billion Port City Project' South China Morning Post (8 June 2021) <https://www.scmp.com/week-asia/economics/article/3136486/indias-concerns-over-chinas-rising-influence-sri-lanka-grow> accessed 15 July 2021

UNCTAD, 'World Investment Report 2019: Special Economic Zones' (UNCTAD 2019)

Yuan Y, Guo H, Xu H, Li W, Luo S, Lin H and Yuan Y, 'China's First Special Economic Zone: The Case of Shenzhen' in Zeng D (ed), Building Engines for Growth and Competitiveness in China Experience with Special Economic Zones and Industrial Clusters (The World Bank 2010)55

Zeng D, 'The Past, Present, and Future of Special Economic Zones and Their Impact' (2021) 24 Journal of International Economic Law 259

# වරාය නගරය, පාලනය සහ ජනතාව

*මහාචාර්ය සාවිත්‍රී ගුණසේකර**

*මහාචාර්ය ගුණසේකර, ශ්‍රී ලංකාවේ පාලන ආයතන සහ ක්‍රියාවලි මත වරාය නගර මුලපිරීමෙන් ඇතිවන බලපෑම මෙන්ම ශ්‍රී ලංකාවේ අනාගතයට ඉන් ඇතිවන බලපෑමද සාකච්ඡා කරයි. ඇගේ විශ්ලේෂණයට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත සහ එම පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ මහජන අර්ථසාධක නඩුකර ඇතුළත් වන අතර ඇය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදුන් නඩුතීන්දුවේ විශ්ලේෂණයක් ද කර ඇත.*

## 1. හැඳින්වීම

මනහර මුහුදු සහ වෙරළ තීරයක් සහිත, කොළඹ නගරයේ ඉතාමත්ම දර්ශනීය ස්ථානයකින් කොටසක් ද ඇතුළුව කෘතිමව ගොඩකර නිර්මාණය කරන ලද හෙක්ටාර 446,6153ක භූමි භාගයකින් කොළඹ වරාය නගරය සමන්විත වේ. මෙම භූමි ප්‍රදේශය, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ සම්පූර්ණ පාලනය සහ කළමනාකරණය යටතේ පවතින විශේෂ අර්ථික කලාපයක් බවට පත්වනු ඇත. 2021 මැයි 19 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ මෙම විශේෂ ආර්ථික කලාපය සහ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලැබීය. මෙවැනි විශේෂ ආර්ථික කලාප පිහිටුවීමේ අදහස අලුත් සංකල්පයක් නොවේ. ආසියාවේ සහ අප්‍රිකාවේ බොහෝ රටවල මෙවැනි කලාප දැකගත හැකිය.[1] ශ්‍රී ලංකාවේ කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය, නොහොත් 'කොළඹ වරාය නගරය' යනු එකී පනතෙහි (2 වන වගන්තිය යටතේ) I වන උපලේඛනයේ දක්වා ඇති භූමි ප්‍රදේශයයි. බස්නාහිර පළාතේ, කොළඹ නගරයේ, මෙම කලාපය සඳහා වෙන් කර ඇති බිම් කොටස එම උපලේඛනයෙහි විස්තර කර ඇති අතර, එයට ගොඩකළ ඉඩම් සහ ඒ ආසන්නයේ ඇති තවත් භූමි ප්‍රදේශ ඇතුළත් වේ.

මෙම විශේෂ ආර්ථික කලාපය "සේවා සැපයීම ඉලක්ක කරගත් කර්මාන්තවලට" සහාය සපයා දෙමින් "විවිධාංගීකරණය වූ සේවා ආර්ථිකයක්" ලෙස ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. පනතේ පූර්විකාවෙහි සහ 6 වන

* සම්මානිත නීති මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

වගන්තියෙහි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (CPCEC) විස්තර කර ඇත්තේ "එම කලාපය තුළ ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකීය ආයෝජන පහසුකම් සලසන්නකු" වශයෙනි. ජාත්‍යන්තර වෙළඳාම, නාවික කටයුතු, අක්වෙරළ බැංකුකරණය හා මූල්‍ය සේවා, තොරතුරු තාක්ෂණ සේවා බාහිර ප්‍රභවයන්ට දීම, සංචාරක කර්මාන්තය සහ විනෝදස්වාදය වැනි ක්ෂේත්‍රවල "ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයක්" වශයෙන් ක්‍රියා කරමින් සෘජු විදේශ ආයෝජන සඳහා පහසුකම් සැලසීම පිණිස ස්වකීය පුළුල් අයිතිවාසිකම් සහ බලතල යොදාගැනීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇති විධිනියෝගය වේ. පනතෙහි පූර්විකාවට අනුව රජය විසින් කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ "රාජ්‍ය සහ පෞද්ගලික ආර්ථික ක්‍රියාකාරකම් හරහා" කඩිනම් ජාතික සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ස්වකීය පොරොන්දුව ඉටු කිරීමට ය. තවදුරටත් ආයෝජන ප්‍රවර්ධනය කිරීම, කලාපය තුළ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම, "තාක්ෂණික, වෘත්තීය සහ ව්‍යවසායකත්ව විශේෂඥභාවය" වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ අරමුණු වශයෙන් විශේෂයෙන් දක්වා තිබේ.

මුහුද ගොඩකිරීමේ කටයුතු ආරම්භ වීමේ සිට ම කොළඹ වරාය නගර වැඩසටහන මතභේදයට තුඩුදී ඇති මාතෘකාවක් වී තිබේ. මෙම ව්‍යාපෘතිය තුළ චීන රජයේ කාර්ය භාරය, එම හවුල්කාරීත්වයෙන් ඇතිවන බලපෑම, සහ ජාතික පරමාධිපත්‍යයට ඇති තර්ජන එම සංවාදයේ සහ විවාදයේ කොටසක් වී තිබේ. පරිසරයට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක මෙම ව්‍යාපෘතියෙහි දීර්ඝකාලීන බලපෑම් පිළිබඳ කනස්සලුවලට හේතු වී තිබේ.

සැලකිය යුතු මට්ටමකින් ලාභාංශ උපයා දෙමින්, රටේ ආර්ථිකයට සහ ජනතාවට ඉහළ පංතිවල සිට පහළ පංති දක්වා වූ ධනාත්මක බලපෑමක් ඇතිකිරීමට හැකි, වෙනම ක්‍රියාත්මක වන ව්‍යාපාරික කලාපයක් වශයෙන් කොළඹ වරාය නගරය කළමනාකරණය කළ හැකි බව එයට සහයෝගය පළකරන අයගේ තර්කය වේ. එමගින් ඉදිරි පස් වසර තුළ රැකියා අවස්ථා 200,000ක් නිර්මාණය වනු ඇති අතර, ශ්‍රී ලාංකික සේවකයින්ට විදේශ මුදල්වලින් වැටුප් ලැබෙනු ඇත. මෙම කලාපය ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රධාන හවුල්කරු වන චීනය, ගෝලීය ආර්ථික බලවතෙකි. එවැනි හවුල්කාරීත්වයක් යනු අපගේ පරමාධිපත්‍යය විදේශ රටකට පවරා දීමක් නොව, ශ්‍රී ලංකාව සාම්ප්‍රදායිකව අනුගමනය කර ඇති නොබැඳි විදේශ ප්‍රතිපත්තියට අනුකූල වන විදේශ සම්බන්ධතාවල සාධනීය සහයෝගීතාවයකි.

මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ පසු පෙත්සම්කරුවන් වූ දේශපාලන සහ රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් විසින් ද, මැදිහත් වූ පෙත්සම්කරුවන් 14 දෙනෙකු විසින් ද මෙම පනත ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් කරන ලදී. මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි කිසිදු විධිවිධානයකට අනනුකූල නොවන බවට නීතිපතිවරයා රජයට උපදෙස් දී තිබුණි. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි තීන්දුවෙන් ප්‍රකාශ වූයේ මෙම පනත් කෙටුම්පතෙහි වගන්ති 26ක් පාර්ලිමේන්තුවේ සම්මත කරගත හැක්කේ 2/3 ක විශේෂ බහුතරයකින් පමණක් වන බව සහ තවත් වගන්ති 9ක් සම්මමත කර ගැනීම සඳහා විශේෂ බහුතරය සහ ජනමත විචාරණයක් අවශ්‍ය කරන බව ය.[2] ඒ අනුව, පනත් කෙටුම්පත සංශෝධනය කර, සරල බහුතරයකින් පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලදී. දැන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත රටේ නීතිය බවට පත් වී තිබේ.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට එරෙහි නඩුවේදී තර්කයට භාජනය වූ ප්‍රධාන ම ගැටළු දෙකක් වැදගත් නෛතික සහ දේශපාලන කරුණු සමග බැඳී පවතියි. ඉන්

එකක් නම්, අලුතින් ගොඩකර නිර්මාණය කරන ලද කොළඹ වරාය නගර භූමිය එකී කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය සහ පාලනය යටතට පැවරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලය පිළිබඳ ගැටළුවකි. දෙවැන්න, අලුතින් ගොඩකර නිර්මාණය කරන ලද කොළඹ වරාය නගර භූමි ප්‍රදේශය කොලඹ පරිපාලන දිස්ත්‍රික්කයට ඒකාබද්ධ කර එම දිස්ත්‍රික්කයේ නිර්වචනය වෙනස් කිරීමට විධායකයට ඇති බලය පිළිබඳ ගැටළුවකී ඉදිරි ඡේදවල දී මෙම ගැටළු දෙකම සාකච්ඡා කරනු ලැබේ.

## 2. කොළඹ වරාය නගරය යනුවෙන් හඳුන්වන භූමියේ දේශභූමික තත්වය

කොළඹ වරාය නගරයේ කෘත්‍රිමව නිර්මාණය කරන ලද භූමි ප්‍රදේශය, මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වැනි ව්‍යවස්ථාව මගින් නිර්වචනය කර ඇති ශ්‍රී ලංකාවේ දේශභූමියට අයත් නොවන බව එක් පෙත්සම්කරුවකුගේ නීතිවේදීයා තර්ක කළේය. කෘතිමව ගොඩකර නිර්මාණය කළ භූමිය 'රජයේ ඉඩම්' නොවන බැවින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ එම ඉඩම් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව වෙත ප්‍රදානය කිරීමට ජනාධිපතිවරයාට නොහැකි බව ඔහු කියා සිටියේ ය. එයට ප්‍රතිවිරුද්ධව අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් ඉදිරිපත් කළ තර්කය පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය, කිරීට ඉඩම් ආඥා පනතෙහි (1947) (වර්තමානයේ රජයේ ඉඩම් ආඥාපනත යනුවෙන් නැවත නම් කර ඇති) 58 වන, 60 වන, සහ 110(1) වන වගන්තිවලට අනුව කොළඹ වරාය නගරය ශ්‍රී ලංකාවේ දේශභූමියෙහි කොටසක් වන, ගොඩකරන ලද ඉඩමක් බැව් පැහැදිලි වන්නේ යැයි තීන්දු කරන ලදී. රජයේ ඉඩම් ආඥා පනතේ ඉහත කී වගන්ති පිළිබඳ සඳහන් කරමින් අධිකරණය, 'වෙරළාසන්න මුහුද හෝ මුහුදු පත්ල ගොඩකර, එසේ ගොඩකිරීමෙන් නිර්මාණය කරනු ලබන ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමට' එකී වගන්ති මගින් ජනාධිපතිවරයාට බලය ලබා දෙන බව තීන්දු කළේය. තවද, එසේ ගොඩකරන ලද භූමිය බදු දීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට මෙම ආඥා පනත මගින් ජනාධිපතිවරයාට (කිරීටය වෙනුවට වර්තමානයේ සිටින) බලය පවරා දෙන බව ගරු විනිසුරුතුමන්ගේ නිගමනය විය.[3]

බ්‍රිතාන්‍ය යටත්විජිත ආණ්ඩුව 1947 කිරීට ඉඩම් ආඥාපනත නීතිගත කළේ 'ලංකාවේ කිරීට ඉඩම් සහ වෙරළාසන්න සමුද්‍ර තීරය කළමනාකරණය සහ පාලනය සඳහා එම ඉඩම් ප්‍රදානය කිරීමට සහ පවරා දීමට විධිවිධාන සැලසීම' පිණිස ය (ආඥාපනතේ දීර්ඝ නාමය). ඒ අනුව අග්‍රාණ්ඩුකාරවරයාට 'මහ රැජිණගේ නාමයෙන් හා මහ රැජිණ වෙනුවෙන්' කිරීට ඉඩම් කොන්දේසි රහිතව හෝ සහිතව ප්‍රදානය කිරීමට, විකිණීමට, බදු දීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට' හැකිය (2(1) හා (2) වන වගන්ති). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලාත්මක වූ පසුව, 1980 වර්ෂයේ දී සාදන ලද සංශෝධිත නීති පැනවීම් මගින් විධායක අධිකාරය වෙනුවට 'ජනාධිපතිවරයා' යන යෙදුම ද, 'කිරීට ඉඩම්' වෙනුවට 'රජයේ ඉඩම්' යන යෙදුම ද යොදන ලදී. 20 වැනි සංශෝධනය මගින් සංශෝධිත පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි වර්තමාන 33(ඊ) වගන්තියෙහි (කලින් 19 වැනි සංශෝධනයෙහි 33(2)(ඊ) වගන්තියෙහි) ඉඩම් ප්‍රදානය කිරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලතල පිළිබඳව විශේෂයෙන් සඳහන් කර ඇත. ගරු විනිසුරුතුමන්ලාගේ මතය රජයේ ඉඩම් යන්නෙහි අර්ථ දැක්වීම පිළිබඳව රජයේ ඉඩම් ආඥාපනතෙහි ඇති විධිවිධාන සමග ද, රජයේ ඉඩම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ඇති බලතල පිළිබඳව එම ආඥාපනතෙහි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දැක්වෙන විධිවිධාන ද සමග ද පැහැදිලිව ම අනුකූල වේ.

කෙසේ නමුත්, යටත්විජිත සමයේ පැනවූ නීතියකින් ගත් විධිවිධාන සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තියෙන් ආරක්ෂා

කර දී ඇති ජනතා පරමාධිපත්‍යයෙහි නව සම්මතය පිළිබඳ එහි ඇති ගම්‍යමානයන්, සහ ඉඩම් වැනි වැදගත් සම්පතක් සම්බන්ධයෙන් ජනතාවට ඇති අයිතිවාසිකම් විශ්ලේෂණය කිරීම සඳහා තිබූ අවස්ථාවක් නීතිවේදියාට සහ අධිකරණයට මගහැරී යාම කණගාටුවට කරුණකි.

1947 වර්ෂයේ දී කිරීට ඉඩම් ආඥාපනත නීතිගත කරනු ලැබුවේ ඉතාමත් වැදගත් ආර්ථික, සමාජ හා දේශපාලන වත්කමක් වන ඉඩම් සම්බන්ධයෙන් රජයේ පාලනය ස්ථාපිත කිරීම සඳහා වූ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්විජිතවාදී නීති සම්පාදන න්‍යාය පත්‍රයේ කොටසක් වශයෙනි. මතභේදයට තුඩු දුන් නීතියක් වූ කිරීට ඉඩම් බලෙන් අල්ලාගැනීම් ආඥාපනත ඇතුළුව, යටත් විජිත ආණ්ඩුව විසින් 1840 සිට 1947 දක්වා කාලය තුළ පනවන ලද තවත් නීති ගණනාවක් ම යටත් විජිත ආණ්ඩුව විසින් ඉඩම් හිමිකම් අත්පත් කරගැනීම පිළිබඳව සහ එය නියාමනය කිරීම පිළිබඳවත්, රාජ්‍යයේ විධායක ප්‍රධානියා වන කිරීටයේ බලතල පිළිබඳවත් විය. මේ හරහා මෙරට වැසියන්ට තමන්ගේ ඉඩම් සඳහා වූ අයිතිය අහිමි වුවත්, ප්‍රජාවගේ යහපත පිණිස ඉඩම් භාවිතා කරන බව ප්‍රකාශ කරමින් එම ප්‍රතිපත්තිය සාධාරණීකරණය කරන ලදී.

කිරීටය නොහොත් රාජ්‍යය විසින් ඉඩම් නැමැති මෙම වැදගත් සම්පත ජනතාව වෙනුවෙන් සහ පොදු යහපත උදෙසා භාරකරුවකු වශයෙන් දරා සිටින්නේ ය යන සංකල්පය යටත්විජිත කාලසීමාව මුළුල්ලෙහි ම ඉඩම් ප්‍රතිපත්තිවල සහ නීතිවල දිගින් දිගටම සඳහන් කරන ලදී. පළමු යටත්විජිත ඉඩම් කොමිෂන් සභාවට (1927-1929) අනුව, කිරීට ඉඩම් යන්නෙන් එම ඉඩම් මහ රැජිනගේ පුද්ගලික ප්‍රයෝජනය උදෙසා, හෝ රජයේ ප්‍රයෝජනය උදෙසා කිරීටයට පැවරෙන බවක් ගම්‍ය නොවන අතර, එය යම්කිසි පුද්ගලයෙකුට පැවරී නොමැති, පොදුවේ මහජනයා වෙනුවෙන් කිරීටයේ භාරකාරත්වය යටතේ පවත්වාගෙන යා යුතු සියළුම ඉඩම් හැඳින්වීම සඳහා යොදාගන්නා පහසු යෙදුමක්' විය.[4] ඇත්ත වශයෙන් ම, 1947 කිරීට ඉඩම් ආඥා පනත පැනවීමේදී බ්‍රිතාන්‍ය යටත්විජිත ආණ්ඩුව මේ තර්කය පිළිබඳව සඳහන් කර තිබේ. එහි අරමුණ වූයේ 'මහජනතාව වෙනුවෙන් භාරකරුවකු වශයෙන් කිරීටයේ හිමිකාරිත්ව අයිතිවාසිකම් පැහැදිලි කරගැනීම' වියි මෙහිදී මෙය පැහැදිලි කිරීම සඳහා බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය විසින් ශ්‍රී ලංකාවේ ඉඩම් නීතියෙහි ප්‍රධානතම මූලාශ්‍රයක් වූ රෝම ලන්දේසි නීතියෙහි ඇති සම්මතයන් සහ සංකල්ප ද ගෙනහැර දක්වා තිබේ. ඒ අනුව, රෝම ලන්දේසි නීතියෙහි සඳහන් පරිදි මුහුද වැනි එක් දේපළ වර්ගයක් 'res communes' දේපළ වශයෙන් හඳුන්වන සියලු ම වැසියන්ට අයිති දේපළ වන ලෙස ද, පොදු ගංගා, ඇල දොළ, පොදු මාර්ග සහ වෙරළ වැනි රජයට අයත් දේපළ 'res publicae' දේපළ වශයෙන් ජනතාවගේ යහපත තකා රජය භාරයේ පවතින දේපළ ලෙස ද කිරීට ඉඩම් ආඥාපනත මගින් පිළිගෙන තිබේ.[5]

කිරීට ඉඩම් ආඥාපනතෙහි දක්වා ඇති පරිදි, රෝම ලන්දේසි නීතියෙහි සහ බ්‍රිතාන්‍ය යටත්විජිත නීතියෙහි සංකල්ප බුලන්කුලම (එප්පාවල ඛනිජ සම්පත් සූරාකෑම) නඩුවේදී ඒ.ආර්.බී. අමරසිංහ විනිසුරුතුමාගේ තීන්දුවේදී දේශීය නෛතික, සමාජ, සහ ආර්ථික වටිනාකම් සමග සම්බන්ධ කර දක්වා තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් 'රාජ්‍යයේ ස්වාභාවික සම්පත් විශ්වසනය පිට භාරයේ තබාගෙන සිටීම පිණිස හෝ මහජනයාගේ යහපත තකා භාවිතා කිරීම පිණිස ඒවායෙහි නෛතික හිමිකාරීත්වය විධායකය වෙත පවරා තිබීම' සඳහා පදනමක් සපයා දෙන බව ද, 'විධායක බලතල ක්‍රියාත්මක කිරීම අධිකරණ සමාලෝචනයට යටත් වන' බව ද ගරු විනිසුරුතුමා පවසා සිටියේය.[6]

රජයේ ඉඩම් ජනතාව වෙනුවෙන් විශ්වසනය පිට භාරයේ තබාගෙන සිටීම යන දෘෂ්ටිකෝණයෙන් රජයේ ඉඩම් ආඥාපනතෙහි විධිවිධාන පිළිබඳව සිදු කරනු ලබන විශ්ලේෂණයක්, කොළඹ වරාය

නගරයේ ඉඩම් එම කොමිෂන් සභාව වෙත පැවරීමට ජනාධිපතිවරයාට ඇති බලය පිළිබඳව සහ පනතෙහි අන්තර්ගත කර ඇති 'රජයේ අළෙවි කළ හැකි ඉඩම්' සහ 'ව්‍යාපෘති සමාග මේ අළෙවි කළ හැකි ඉඩම්' වැනි සංකල්ප පිළිබඳව වඩාත් ගැඹුරු විශ්ලේෂණයක් සඳහා ප්‍රයෝජනවත් විය හැකිව තිබුණි. එසේම, ශ්‍රී ලංකාවේ 'ලිඛිත නීති' අතරින් ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් ඇති වැදගත් නීති වන නාගරික සංවර්ධන අධිකාරී පනත, මහ නගර සභා ආඥා පනත සහ නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත වැනි නීති කොළඹ වරාය නගරය තුළ අදාළ වන නීති අතරට ඇතුළත් කර නොමැත.[7]

## 3. වරාය නගරය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොටසක් ලෙස

2019 අගෝස්තු මාසයේ දී, අභ්‍යන්තර හා ස්වදේශීය කටයුතු සහ පළාත් සභා අමාත්‍යවරයා 1955 පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ ගැසට් නිවේදනයක් නිකුත් කරමින්, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකට අනුව, කොළඹ වරාය නගරය නමින් හඳුන්වන, ගොඩකර නිර්මාණය කරන ලද භූමි ප්‍රදේශය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයට ඇතුළත් කිරීම පිණිස එම පනතෙහි පළමු උපලේඛනයෙහි දක්වා ඇති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ සීමා සංශෝධනය කරන ලද බව ප්‍රකාශයට පත් කරන ලදී. කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් පැවරූ නඩුවලදී පෙත්සම්කරුවන් මෙම කාර්ය පටිපාටියේ වලංගුතාවය අභියෝගයට ලක් කළහී කෙසේ නමුත්, මෙම කාර්ය පටිපාටීන්හි වලංගුතාවය මීට පෙර අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් වී නොමැති බවත්, 1955 පරිපාලන දිස්ත්‍රික් පනත යටතේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව කොළඹ වරාය නගරය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොටසක් බවට පත්වී ඇති බවත් ශේෂ්ඨාධිකරණය තීන්දු කළේය.

ඉඩම් යනු පළාත්සභා ලැයිස්තුවට (18 වන විෂයය, I වන ලැයිස්තුව) අයත් වන විෂයයක් බව පෙත්සම්කරුගේ තවත් තර්කයක් විය. පළාත් සභාවලට ඉඩම්, ඉඩම් පැවරීම සහ ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් නීති පැනවීමට හැකියි ජනාධිපතිවරයා විසින් එවැනි ඉඩම් අන්සතු කිරීමේ හා පැවරීමේ බලතල ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාවල අදහස් විමසිය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(උ)3 ව්‍යවස්ථාවේ දැක්වෙන බව නීතිවේදියා තර්ක කළේ ය. එබැවින්, කොළඹ වරාය නගර පනත් කෙටුම්පත පළාත් සභා වෙත යොමු කිරීමට අසමත්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි. ඒ අවස්ථාවේ කිසිදු පළාත් සභාවක් පත්කර නොතිබූ බැවින්, පළාත් සභාවල අදහස් දැනගැනීමට පනත් කෙටුම්පත පළාත් සභා වෙත යොමු කිරීම කළ නොහැක්කක් බව මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. පවත්නා වාතාවරණ යටතේ පනත් කෙටුම්පත පළාත් සභා වෙත යොමුකිරීමට නොහැකි වීම පාර්ලිමේන්තුව විසින් මෙම නීතිය පනවනු ලැබීම වැළැක්වීමට හේතුවක් නොවන බව අධිකරණයේ නිගමනය විය. එය, නියම කර ඇති කාර්යපටිපාටිවලට අනනුකූලවීමක් වශයෙන් සහ පළාත් සභා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඇති ව්‍යවස්ථා සම්පාදන බලතල පිළිබඳව ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන උල්ලංඝනයක් වශයෙන් නොසලකන ලදී. 'කාර්ය පටිපාටිමය පියවරක් සමග අනනුකූලතාවයක් තිබේද යන්න තීරණය කිරීම සඳහා, පළාත් සභා පිහිටුවා තිබීම නීතියට අනුව පූර්වාවශ්‍යතාවයක් වේ' යනුවෙන් අධිකරණය ප්‍රකාශ කළේය (පි.23).

ඉඩම් පිළිබඳව පළාත් සභාවලට ඇති බලතල සම්බන්ධයෙන් නඩු තීන්දු නීතියෙහි සහ නීතිමීමාංසාවෙහි ඇති ප්‍රතිවිරුද්ධ අදහස් ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකා බලන ලදී. ඉඩම් යනු පළාත් සභා විෂයයක් වන බවත්, පත්කර නොතිබූ පළාත් සභාවක අදහස් ලබා ගැනීමට අපොහොසත්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන බවත්, එබැවින් පනත් කෙටුම්පත

පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක විශේෂ බහුතරයකින් සම්මත විය යුතු බවත් තීන්දු කළ දිවිනැගුම පනත් කෙටුම්පත නඩුවේ (2021)[8] ශ්‍රේෂ්ඨාධිකරණයේ අර්ථනිරූපණය තමන් විසින් අනුගමනය නොකරනු ලබන බව අධිකරණය තීරණය කළේ ය. නීතියට අනුව පළාත් සභා පිහිටුවා නොතිබීම හේතුවෙන් එසේ අදහස් විමසීමේ කාර්යපටිපාටිමය පියවර සපුරාලීම කළ නොහැක්කක් වීම ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම පෙර නඩු තීන්දුව ප්‍රතික්ෂේප කරනු ලැබීමට පදනම් වූ හේතුව වශයෙන් දක්වන ලදී. කෙසේ නමුත් මෙහිදී අධිකරණය ඉඩම් සම්බන්ධයෙන් මධ්‍යම රජයට හා පළාත් සභාවලට ඇති බලතල පිළිබඳ ප්‍රායෝගික ගැටළුව සලකා බැලුවේ නැත. පළාත් සභා පිහිටවනු ලැබ, රජයේ ඉඩම් ආඥාපනත යටතේ පැවරී ඇති විධායක බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා කොළඹ වරාය නගරයේ සහ පළාත්වල ඉඩම් අන්සතු කිරීම සිදු කළ හොත් මෙය ඉදිරියටත් පවතින ගැටළුවක් විය හැකිය.

පළාත් සභා ලැයිස්තුවේ දැක්වෙන ඉඩම් (18 වන විෂයය, I වන ලැයිස්තුව) සම්බන්ධයෙන් පළාත් සභා සතු බලතල පිළිබඳ සඳහන් කිරීම, රජයේ ඉඩම් ආඥාපනතේ 110(1) වගන්තියෙහි නිර්වචනය කර ඇති පරිදි රජයේ ඉඩම් පිළිබඳ සඳහන් කිරීමක් වශයෙන් අර්ථනිරූපණය කළ නොහැකි බව ශාස්ත්‍රීය ලිපිවල[9] යෝජනා කර ඇත. 13 වන සංශෝධනයෙන් පසුව ද එම ඉඩම් තවදුරටත් මධ්‍යම රජය යටතේ පවතින අතර එය ජාතික ඉඩම් කොමිෂන් සභාවේ බලතල යටතට අයත් වන විෂයකි.

පළාතක් තුළ පිහිටි ඉඩම්වලට අදාළව එම පළාත් සභාවට හිමිවන තත්වය මධ්‍යම රජය සහ පළාත් ආණ්ඩු අතර බලය බෙදා ගැනීමේ ප්‍රතිපත්තිය හා බැඳී පවතින දේශපාලනමය වශයෙන් මතභේදයට තුඩුදී ඇති කරුණක් වේ. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත මගින් පළාත් තුළ ඇති ඉඩම් ඒවායෙහි පාලනය සහ කළමනාකරණය සම්බන්ධ පූර්ණ බලතල ද සහිතව එම කොමිෂන් සභාව වෙත පැවරීමට ජනාධිපතිවරයාට බලය ලබා දිය හැකි වීම උපහාසයට කරුණක් වේ. බලයට පත්වූ සෑම රජයක් ම ජාතික ප්‍රශ්නයට ප්‍රතිචාරයක් වශයෙන් පළාත් සමග වඩාත් සාධනීය ලෙස බලය බෙදාගැනීම දශක ගණනාවක් තිස්සේ ප්‍රතික්ෂේප කර ඇති නමුත්, කොළඹ වරාය නගරය නමින් හඳුන්වන මෙම වැදගත් භූමි ප්‍රදේශය තුළ මෙම පුළුල් බලතල 'විමධ්‍යගත' කෙරෙනු ඇත.

## 4. පාලනය සහ ජනතාව කෙරෙහි කොළඹ වරාය නගරය මගින් ඇති කෙරෙන ගම්‍යමානයන්

කොළඹ වරාය නගරය මගින් ඇති කෙරෙන භූ-දේශපාලනික ඇඟවීම් පිළිබඳව මෙම පත්‍රිකාව තුළ සාකච්ඡා නොකෙරේ. වර්තමානයේ මෙරට පවතින පාලන ක්‍රමය සහ රාජ්‍ය ආයතන නියාමනය සැලකිල්ලට ගැනීමේ දී, කොමිෂන් සභාවේ පරිපාලනය අභ්‍යන්තර වශයෙන් රට කෙරෙහි ඇතිකරන ගම්‍යමානයන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය, රාජ්‍ය පරිපාලනය සහ නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් වැදගත් කරුණක් වේ.

### (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සහ නීතියේ ආධිපත්‍යය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සහ නීතියේ ආධිපත්‍ය යනු ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ මුල් බැසගත් අදහස් ය. මෙම සංකල්ප රාජ්‍ය බලය ක්‍රියාත්මක කළ යුත්තේ සහ රාජ්‍ය ආයතන ක්‍රියාත්මක විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරාමිතීන් සහ සීමාවන් ඇතුළත බව පිළිගැනීමට ලක් කිරීමට ප්‍රයත්න දරයි (1978). බලය අයුතු ලෙස යොදා ගැනීම වැළැක්වීම පිණිසත්, ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ

නිදහස උල්ලංඝනයවීම වැළැක්වීම පිණිසත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රාජ්‍ය බලය ක්‍රියාත්මක කිරීම සීමා කර, රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය පරීක්ෂාවට ලක් කරයි. යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ධුරය දරන, ඡන්දයෙන් තේරීපත්වන ආණ්ඩුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කර ඇති රාජ්‍ය බලය සීමාකිරීම් සහ වගවීමක් සහිත පාලනය පිළිබඳ සම්මතයන්ට අවනත විය යුතු ය.

චීනය සහ නැගෙනහිර ආසියානු රටවල් වැනි විවිධ පාලන ක්‍රම සහිත රටවල් ආර්ථික හා සමාජ අයිතිවාසිකම් වශයෙන් ජනතාවට සෞඛ්‍ය හා අධ්‍යාපනය වෙත පුළුල් ප්‍රවේශයක් ලබා දෙන අතර ම ආකර්ෂණීය ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ද සමත් වී ඇති බව කෝවිඩ් වසංගතයට ලෝකයේ රටවල් දැක්වූ ප්‍රතිචාර වලින් පෙනී යයි. ශ්‍රී ලංකාවේ ද ඇත්තේ මෙම පාලන, ප්‍රතිපත්ති සම්පාදන සහ ජාතික සම්පත් වෙන්කිරීමේ සම්ප්‍රදායයි. මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් (1978) සමාජ සහ ආර්ථික අයිතිවාසිකම් මහජනයාට නීතියෙන් බලාත්මක කරවාගත හැකි අයිතිවාසිකම් ලෙස පිළිගෙන නැත. එනමුත් මානව සංවර්ධනය සඳහා මූලික අවශ්‍යතා සපුරාගැනීමට ජනතාවට ඇති අයිතිවාසිකමෙහි අංගයක් ලෙස දශක ගණනාවක් තිස්සේ මෙරට රාජ්‍ය ප්‍රතිපත්තිය හරහා අපගේ ජනතාවට සෞඛ්‍යය සහ අධ්‍යාපනය වෙත ප්‍රවේශය සපයා දී ඇත.

චීනයේ රාජ්‍ය පරිපාලනයට අදාළ වන පාලන හා නියාමන ක්‍රම ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් මගින් ආරක්ෂා කර ඇති සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් උල්ලංඝනය වීමට හේතුවන්නා වූ රාජ්‍ය බලය සීමා කිරීම පිළිබඳ සංකල්පය පිළිගැනීමට ලක් නොකරයි. එම අයිතිවාසිකම් නීතිමය කාර්යපටිපාටි හරහා බලාත්මක කළ නොහැකි, අභිලාෂමය ප්‍රමිතීන් ලෙස හඳුනාගනු ලබයි. කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිගැනීමට ලක් කර ඇති අතර, අපගේ අධිකරණ හරහා නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කරවාගත හැකිය. මතභේදයට තුඩුදී ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් පවා ජනාධිපතිවරයාගේ බලතල තවත් ශක්තිමත් කර ඇති නමුත්, එමගින් විධායක ධුරය දරන කාලසීමාව තුළ ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා ජනාධිපතිවරයා වගකිව යුත්තෙකු බවට පත්කරමින් 19 වැනි සංශෝධනය හරහා සිදු කරන ලද වෙනස්කම් ඉවත් කර නැත.[10]

කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් සිදුකෙරෙන ඇතැම් විග්‍රහවල මෙම වැඩසටහනට චීනය සම්බන්ධවීම බිහිසුණු තත්වයක් ලෙස පෙන්වා දී ඇති චීන පාලන ක්‍රමයේ ඇතැම් ධනාත්මක අංශ පිළිගැනීමට ලක් කිරීම යුක්තිසහගත ය. එහෙත්, චීනය සමග ඇති හවුල්කාරීත්වය තුළ පවා, කොළඹ වරාය නගරයේ පාලන හා පරිපාලන විධිය මගින් දශක හතක් තිස්සේ මෙරට පැවත ඇති පාලන ක්‍රමය වන වර්තමානයේ පවතින පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය යටපත් නොකළ යුතු බව පිළිගැනීම වැදගත් වේ. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීම්, විශේෂයෙන් ම භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ද, තොරතුරු දැනගැනීමේ අයිතිය ද ඇතුළු මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ සහ රාජ්‍ය ආයතනවල වගවීම තිබිය යුතු වේ. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවීම් සම්බන්ධ සෘජු වගකීමක් නැත. එහෙත්, රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන්

රජය වගකිව යුතු බව පිළිගන්නා පැහැදිලි නීතිමීමංසා ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇත.[11]

අප්‍රිකාවේ සහ චීනය ඇතුළු නැගෙනහිර ආසියාවේ විශේෂ ආර්ථික කලාප සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ මත ගොඩනැගුණු සාක්ෂි පදනමක් තිබේ. එම කලාපවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය එම කලාප කළමනාකරණය කිරීම සහ පරිපාලනය සඳහා ස්ථාපනය කර ඇති නියාමන රාමුවල සහ ආයතනවල ඵලදායීත්වය මත රඳා පවතින බව එමගින් පැහැදිලි කරයි. ආයෝජකයින් සඳහා බදු සහන හා අනුග්‍රහපූර්වක ප්‍රතිපත්ති, කලාපය තුළ ශ්‍රමිකයින් බඳවා ගැනීමට සහ රැකියාවෙන් ඉවත් කිරීමට අවසර දීම වැනි මූල්‍ය සහ මූල්‍ය-නොවන දිරිගැන්වීම් ලබාදීම මගින් ද ඇතුළුව සාමාන්‍යයෙන් ව්‍යාපාර කිරීමේ පහසුව ඇති කිරීම තුළින් ආයෝජන දිරිගැන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ.[12] කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පතෙහි මෙම දැක්ම මුල්බැස ගෙන තිබූ බව එම පනත් කෙටුම්පතෙහි විධිවිධාන වලින් පැහැදිලිව පෙන්නුම් කරයි. බොහෝ දුරට, නැගෙනහිර ආසියානු විශේෂ ආර්ථික කලාප පිළිබඳ දැනුම තිබෙන විදේශීය උපදේශකයෙකු විසින් එය කෙටුම්පත් කර තිබෙනවා විය හැකි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මගින් එම කෙටුම්පත අධිකරණයේ සමාලෝචනයට යටත් කරන ලද අතර, එහි තිබූ බොහෝ විධිවිධානවලට ද අධිකරණය විරුද්ධ විය.

කොළඹ වරාය නගරයේ ප්‍රධාන හවුල්කරු වන චීනයේ දැක්මට අනුකූල වන පරිදි සකස් කරන ලද වෙනස් ආකාරයක පාලනයක් දැන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ නීති පද්ධතියේ දක්වා ඇති පාලන සහ රාජ්‍ය පරිපාලන ප්‍රතිමානවලට හා සම්මතයන්ට පරිබාහිරව ක්‍රියාත්මක වන නියාමන කාර්ය රාමු සහ ආයතන ස්ථාපනය කිරීම සඳහා වන සාධාරණීකරණයක් විය නොහැක.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතෙහි සඳහන් කොමිෂන් සභාවේ අරමුණු, බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් මගින් පැහැදිලි කර ඇති පරිදි කොමිෂන් සභාව විසින් 'තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කළ යුතු ය'.[13] පනතේ පූර්විකාවෙහි 'රටේ ශීඝ්‍ර සංවර්ධනය' පිළිබඳ සංකල්පය ගැන සඳහන් කර තිබේ. මෙම අරමුණු ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ගිවිසුම් සඳහා ලබාදී ඇති පොරොන්දු වලින්, ජාත්‍යන්තර නීතිය මගින් සහ ගෝලීය තිරසාර සංවර්ධන අරමුණු (SDG) වලින් පිළිබිඹු වන මානව හිමිකම් පදනම් කරගත් සංවර්ධනය යන සංකල්පයට අනුකූල විය යුතු වේ. සංවර්ධනය ළඟා කරගැනීම සඳහා කොළඹ වරාය නගරය පරිපාලනය සහ පාලනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, අපගේ ලිඛිත නීතියට සහ මෙම ජාත්‍යන්තර සම්මතයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූල වන්නේ දැයි අධීක්ෂණය කළ හැකි සහ කළ යුතු විය යුතු වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති ජාත්‍යන්තර ගිවිසුම්වල දැක්වෙන ආර්ථික හා සමාජ අයිතිවාසිකම් අතර ඇති සම්බන්ධතාවය තිරසාර සංවර්ධන අරමුණු නැමැති දෘෂ්ටිය සඳහා මූලික වේ. මානව හිමිකම් වෙනුවෙන් හඬ නැගීමේදී බොහෝවිට අවධානය යොමු කෙරෙන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව වන අතර, පාලනය සඳහා චීනය යොදගන්නා ප්‍රවේශය අනුමත කරන අය ප්‍රමුඛත්වය ලබා දෙන්නේ ජනතාවගේ ආර්ථික සහ සමාජ අයිතිවාසිකම්වලට ය. තිරසාර සංවර්ධන අරමුණු මගින් තිරසාර සංවර්ධනය යන යෙදුමේ නිර්වචනය තුළ මෙම අයිතිවාසිකම් කාණ්ඩ දෙක ම ඒකාබද්ධ කර ඒවාට ප්‍රමුඛත්වය ලබා දී තිබේ් පරිසරය ආරක්ෂා කිරීම තිරසාර සංවර්ධන අරමුණු බොහොමයක අන්තර්ගත කර ඇති අතර, සමානාත්මතාවය හා වෙනස්කොට නොසැලකීම, කම්කරු අයිතිවාසිකම් සහ

ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාවීම ඇතුළු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වල විවිධ මානයන් ද ඇතැම් තිරසාර සංවර්ධන අරමුණුවල සහ වටිනාකම් රාමුව තුළ අන්තර්ගත කර තිබේ. එබැවින්, කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් වන ඕනෑම ආර්ථික වර්ධන හා සංවර්ධන ආකෘතියක් මානව හිමිකම් පදනම් කරගත් සංවර්ධනයක් ක්‍රියාත්මක කරීම සඳහා සහ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ශ්‍රී ලංකාව ලබා දී ඇති පොරොන්දු සමග බැඳී තිබිය යුතු අතර ඒවායින් දුරස්ථ නොවිය යුතුය.

## (ආ) ජනතා පරමාධිපත්‍යය සහ ජනාධිපති බලතල

ජනාධිපතිවරයාට යම් විශේෂිත බලතල තිබෙන බව කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත මගින් පිළිගෙන තිබේ. ජනාධිපතිවරයාට ලබා දී ඇති වඩාත්ම වැදගත් බලය වන්නේ වරාය නගරය තුළ ඇති ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා දීමට ලබා දී ඇති බලය යි (65(1)(3) වන වගන්තිය). ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව සහ එහි සභාපතිවරයාව පත් කරනු ලැබේ. කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් බහුතරයක් සහ සභාපතිවරයා ශ්‍රී ලාංකිකයින් විය යුතු ය (7(1) වන වගන්තිය). කොළඹ වරාය නගරය විෂයය පිළිබඳ වගකීම අමාත්‍යවරයෙකුට පවරා නැත්තේ නම්, කොමිෂන් සභාවේ අවසාන විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්ම සඳහා එකඟත්වය ලබා දීම, සහ සැලැස්ම සම්බන්ධයෙන් නියෝග ලබා දීම යන බලතල ජනාධිපතිවරයාට පැවරෙයි (15(2), 25(5), 4(1), 4(6) යන වගන්ති). එමෙන් ම, එම කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පත්කිරීමේ දී ද ජනාධිපතිවරයාට උපදේශක කාර්යභාරයක් පැවරෙයි (24(1) වන වගන්තිය). ලබා දී ඇති අනෙකුත් බලතල අක්වෙරළ බැංකුකරණ කටයුතු සහ ක්‍රමෝපායික වැදගත්කමකින් යුත් ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් ලබාදීම සම්බන්ධයෙන් වේ (8 සහ 9 කොටස්). ජනාධිපතිවරයාට හෝ කොළඹ වරාය නගරය විෂයය භාර අමාත්‍යවරයාට පනත යටතේ (71 වගන්තිය) රෙගුලාසි සෑදීම අවශ්‍ය කරන කාරණා සම්බන්ධයෙන් රෙගුලාසි සෑදීම සඳහා පුළුල් බලතල හිමිවී තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සම්මත කරගැනීමෙන් පසුව ජනාධිපතිවරයාට දැන් අසීමිත බලතල තිබෙන්නේ ය යන අදහස ප්‍රචලිත වී තිබේ. එලෙසින් ම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ලැබෙන ඉහත සඳහන් බලතල ද කිසිදු සීමාකිරීමකට යටත් නොවී ක්‍රියාත්මක කළ හැකිය. කෙසේ නමුත්, ජනතාවට වගකියන පාලනය යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල සංකල්පයට කේන්ද්‍ර වී ඇත්තේ රජයේ ධුර සඳහා තේරීපත්වන හෝ පත්කරනු ලබන තැනැත්තන් විසින් සිදුකරන්නේ 'ධුරය දැරීමක්' මිස 'බලය' දැරීමක් නොවේ ය යන කරුණ ය. ජනතාව ඔවුන්ව ඔසවා තබන්නේ 'බලය' වෙත නොව 'ධුරය' වෙතයි. මෙය, 1972 වර්ෂයේ දී මුලින්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දී, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විශේෂිත ආකාරයකින් ඇතුළත් කර ඇති 'ජනතා පරමාධිපත්‍යය' නැමැති සංකල්පය හා බැඳෙයි. පරමාධිපත්‍යය පිහිටන්නේ ජනතාව තුළ බවත්, පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඊට ඇතුළත් වන බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාව මගින් පැහැදිලි කර ඇත. රජයේ ප්‍රධාන කුළුණු තුනක් පවතින බව 4 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වෙයි. ජනතාවගේ පාලන බලය පිළිබිඹු කරමින් පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අධිකරණය පිළිවෙලින් ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ක්‍රියාත්මක කරයි. ඒ අනුව, අධිකරණ නීති මීමංසාව තුළ අදාළ නඩු නීතියෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන

හා 4 වන ව්‍යවස්ථා සම්බන්ධ කර තිබේ. ජනාධිපතිවරයා විසින් ජනාධිපති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීම වැළැක්වීම පිණිස ජනාධිපතිවරයාගේ වගවීම සම්බන්ධ විශේෂ විධිවිධානයක් 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දී තිබුණි. 20 වැනි සංශෝධනය තුළ ද එම විධිවිධානය එලෙස ම රඳවාගෙන ඇත.[14]

එබැවින්, පාලනයේ අනෙකුත් වැදගත් කුළුණු වන පාර්ලිමේන්තුව සහ අධිකරණය විසින් තම පරිපාලනය පරීක්ෂාවට ලක්කරනු ලැබීම මගහැර සිටීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් 'සර්වබලධාරී ජනාධිපතිවරයෙකු' සවිබලගන්වා ඇත්තේය යන අදහස වැරදි ය. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මෙම කුළුණු තුනට ම පාලනයේ යම් යම් කාර්ය භාරයන් පැවරී තිබේ. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වන අතර, ජනාධිපතිවරයාගේ ක්‍රියාවන් අධිකරණ විමසුමට යටත් වේ.

බෞද්ධ ආචාරධර්ම අනුව අධිරාජයෙකුගේ වගකීම් දැක්වෙන දස රාජ ධර්මයේ මගපෙන්වීම අනුව තමන් කටයුතු කරන බව 2021 වර්ෂයේ පොසොන් දින පණිවුඩය නිකුත් කරමින් ජනාධිපතිවරයා සඳහන් කළේය. රජෙකු තම යටත්වැසියන්ට වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් සම්බන්ධ ඉතා උසස් දර්ශනයන් මෙම ආචාර ධර්ම තුළ ගැබ්වී තිබෙනවා විය හැක. එසේ වුවත්, මේ රටේ ජනාධිපතිවරයා අධිරාජයෙකු නොවන බව ශ්‍රී ලංකාවේ වැසියන් සිහිපත් කර ගත යුතු කරුණකි. 1972 වර්ෂයේ දී අප රට ජනරජයක් වූ අවස්ථාවේ පටන් මේ රටේ කිසිදු අධිරාජයෙකු රාජ්‍ය පාලනය කර නොමැති බවත්, ජනාධිපතිවරයාට එම කාර්ය භාරය උරුමවූවක් නොවන බවත් 2018 පාර්ලිමේන්තුව විසිරුවාහැරීම පිළිබඳ නඩුවේදී අපගේ ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තේය.[15] ඒ අනුව, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත මගින් ජනාධිපතිවරයාට ලබාදී ඇති බලතල ද පාර්ලිමේන්තුවේ සහ අධිකරණයේ විමසුමට යටත් වනු ඇත.

කොලඹ වරාය නගරය පනත් කෙටුම්පත සමාලෝචනය කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය එම කෙටුම්පතෙහි විධිවිධාන කිහිපයක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන බව හඳුනා ගත්තේයි මෙම වගන්ති පසුව සංශෝධනය කරන ලදී. කොමිෂන් සභාවට සාමාජිකයින් පත්කිරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලතල, පනතෙහි අඩංගු වන පත්කිරීම් සිදුකරීම පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූල වන්නේ දැයි පරීක්ෂා කර බැලීම සඳහා අධිකරණයේ විමසුමට ලක් කළ හැකි බව අධිකරණය විශේෂයෙන් සඳහන් කළේයි එම අභිමතානුසාරී බලය අත්තනෝමතික ලෙස භාවිතා කරනු ලැබීම අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කළ හැකි බව ද ප්‍රකාශ කරන ලදී (පි. 26). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි හා 4 වැනි ව්‍යවස්ථාවල ජනතා පරමාධිපත්‍යය සම්බන්ධයෙන් ඇතුළත් කර ඇති විධිවිධාන සැලකිල්ලට ගෙන, යටත් විජිත යුගයේ රාජ්‍ය ඉඩම් ආඥාපනත (1947) යටතේ කොමිෂන් සභාව වෙත ඉඩම් ප්‍රදාන ලබාදීමට ජනාධිපතිවරයාට ඇති බලතල ද අධිකරණයේ විමසුමට ලක්කර තිබුණේ නම් සුදුසු බව ගෞරවපූර්වකව යෝජනා කරනු ලැබේ.

### (ඇ) පාර්ලිමේන්තුවේ අධීක්ෂණ භූමිකාව

ජනතා පරමාධිපත්‍යය යන සංකල්පය මත පදනම් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලන රාමුවක් සඳහා පාර්ලිමේන්තුවේ සහ ජනාධිපතිවරයාගේ බලතල හා වගකීම් අතර සමතුලිතභාවයක් පවත්වාගෙන යා යුතු වේ. සම්පත් වෙන්කිරීමේ දී සහ රාජ්‍ය මූල්‍යය යෙදවීමේ දී පාලනයේ ව්‍යවස්ථාදායක

ශාඛාවට (පාර්ලිමේන්තුවට) වැදගත් අධීක්ෂණ කාර්ය භාරයක් පැවරී ඇත. පාර්ලිමේන්තුව 'රාජ්‍ය මූල්‍යය සම්බන්ධ පූර්ණ පාලනය' ක්‍රියාත්මක කරන බව පාර්ලිමේන්තුවේ කාර්යභාරය පිළිබඳව සඳහන් වන 148 වන ව්‍යවස්ථාවෙහි ද ඇතුළුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ සඳහා ම වෙන්වුණු පරිච්ඡේදයක සහ විධිවිධාන වල දක්වා තිබේ. රජයේ සියලු ම ක්‍රියාකාරකම් වලට අදාළ ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව, මේ අන්දමින් පාර්ලිමේන්තුවේ අධීක්ෂණ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඇති වැදගත් යන්ත්‍රණයක් වේ.[16] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පාර්ලිමේන්තුවේ මූල්‍ය අධීක්ෂණ බලතල පිළිබඳව දක්වා ඇති විධිවිධාන අවධානයට ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ වරාය නගරයේ නියාමන ක්‍රමවේදයේ ඇති විධිවිධාන කිහිපයක් ම පරීක්ෂාවට ලක් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, අවසානයේ දී බලාත්මක කරන ලද නීතියට යම් යම් සංශෝධන සිදු කරන ලදී. පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාර්ය භාරය වඩාත් ශක්තිමත් කිරීම සඳහා තවත් සංශෝධන ගෙන ඒමට විපක්ෂයට අවශ්‍ය වුවත්, පාර්ලිමේන්තුවේ කාර්ය භාරය සහ වගකීම් සම්බන්ධ ද්විපක්ෂ ප්‍රවේශයක් තුළ එම සංශෝධන ඒකාබද්ධ කරගැනීමක් සිදු නොවීය.

කොළඹ වරාය නගරයේ අක්වෙරළ සමාගම් ස්ථාපනය කෙරෙනු ඇත. කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත කලාපය තුළ සේවා සපයනු ඇති මෙම සමාගම් වලට 'බලයලත් පුද්ගලයින්' යන තත්වය හිමිවනු ඇත. මෙම සමාගම් 2007 සමාගම් පනත යටතේ ලියාපදිංචි විය යුතු නමුත් එම පනතෙහි සඳහන් විධිවිධාන මෙම සමාග ම්වලට පූර්ණ වශයෙන් අදාළ නොවනු ඇති එසේම, 1987 පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත ද කොළඹ වරාය නගරය තුළට අදාළ නොවේ. එය, ශ්‍රී ලංකාවේ 'ලිඛිත නීති' අතරින් මෙම කලාපයට අදාළ වන නීති වලින් බැහැර කර ඇති එක් නීතියක් වේ.

ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන වැදගත් නීති මෙම කලාපයට අදාළ නොවීම සම්බන්ධයෙන් සහ "සෘජු විදේශ ආයෝජන" වශයෙන් ඕනෑම වර්ගයක විදේශ මුදල් මෙම කලාපය තුළට ගෙන ඒම මගින් ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම ඇතුළුව මුදල් විශුද්ධිකරණය සඳහා අවස්ථා ලැබිය හැකි වීම සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු වී තිබේ. දේශීය ආදායම් පනත (2017) සහ බදුකරණය නියාමන කිරීමේ ක්‍රමවේදය, සහ විදේශ විනිමය පනත (2017) අදාළවීම සම්බන්ධයෙන් ද යම් යම් ව්‍යතිරේක පවතියි.[17] මේ ජාතික නීතිවලින් නිදහස් කිරීම සහ ඒවා අදාළ නොවීම කලාපය තුළ "ව්‍යාපාර කිරීමේ පහසුව" වැඩිකිරීම සහ "නියාමන රාමු සමග අනුකූලවීම අවම කිරීම" පිණිස සිදුකරන්නේය යන හේතු දැක්වීම මත සාධාරණීකරණය කරනු ලැබේ. එහෙත්, කාර්යක්ෂමතාවය සහ ශීඝ්‍ර ආර්ථික වර්ධනය සහතික කිරීම සඳහා මේ ආකාරයට පාර්ලිමේන්තුවේ අධීක්ෂණය සීමා කිරීම මගින් ද, නීති හා නියාමන පද්ධතිය සමග 'අනනුකූලවීම' නීත්‍යානුකූල කිරීම මගින් ද, රාජ්‍ය පරිපාලනයේ දී මහා පරිමාණ දූෂණ සහ ජාතික සම්පත් අවභාවිතය නිතර ම අත්විඳින රටක මූල්‍ය පාලනය කෙරෙහි බරපතල අවදානමක් එල්ල කරයි. කලාපය තුළ දුර්වල මූල්‍ය පාලනයක් තිබීම ශීඝ්‍ර සහ තිරසාර සංවර්ධනයක් ළඟා කරගැනීම සඳහා ඇති ඉඩ ප්‍රස්තාවලට බලපෑම් ඇති කළ හැකිය.

ශක්තිමත් බහුතරයක් සහිත ආණ්ඩු පක්ෂයක් සිටින විට වගවීම සහිත පාලනයක් සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන පාර්ලිමේන්තු අධීක්ෂණය දුර්වල විය හැකිය. රටේ යහපත උදෙසා මූල්‍ය අධීක්ෂණය සහ පාලනය පිළිබඳ ඵලදායී විවාදයක් සහ සාකච්ඡාවක් සඳහා ද, ද්වීපාර්ශවික පොදු එකඟතාවයක් ගොඩනගා ගැනීම සඳහා ද උපකාරී

වන්නේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ආසනවල සහ විපක්ෂයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය සහ නියෝජනය යි. ශ්‍රී ලංකාවේ පවතින සමානුපාතික නියෝජන ක්‍රමය තුළ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා නාමයෝජනා ලබාදීමේ ක්‍රියාවලියේ දී දේශපාලන පක්ෂවලට පැවරෙන ප්‍රබල භූමිකාව හේතුවෙන්, මෙම වැදගත් ආයතනයට නිසි දක්ෂතා සහිත, අවංක පුද්ගලයින් තෝරාපත් කරගැනීම සඳහා ජනතාවට ඇති හැකියාව සීමා කරවයි. ජාතික ලැයිස්තුව ඇත්තේ පාර්ලිමේන්තුවට විවිධත්වය සහ වෘත්තීමය නිපුණත්වය ගෙන ඒමට වුවත්, ඡන්දයෙන් පරාජය වූ අපේක්ෂකයින් ජාතික ලැයිස්තුව හරහා පාර්ලිමේන්තුවට ගෙන ඒමේ වත්මන් පිළිවෙත ද, නියෝජනය කිරීම සඳහා තමන්ට මහජනතාවගෙන් ඡන්දය නොලැබුණු පක්ෂ වලට යමින් මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කිරීම ද, පාර්ලිමේන්තුව නැමැති ආයතනය කෙරෙහි මහජනයා තුළ ඇති කලකිරීමට හේතු වී තිබේ. ජාතික මැතිවරණයකින් පසුව ඡන්ද දායකයින්ට දැනෙන්නේ තමන් අසරණ බවට පත්වූ හැඟීමකි. පාර්ලිමේන්තුවේ දී දිනෙන් දින අසන්නට ලැබෙන්නේ කර්කශ කථා පැවැත්වීම් සහ විරුද්ධවාදීන් වෙත එල්ල කරන අරුත්සුන් විරෝධය පළ කිරීම් පිළිබඳ පුවත් වන අතර, තරුණ, නවක මන්ත්‍රීවරුන් මෙන්ම අත්දැකීම් බහුල ප්‍රවීන දේශපාලනඥයින් ද අර්ථවත් යමක් දායක කරනු ඇති බවට අපේක්ෂා කළ හැක්කේ අල්ප වශයෙනි. මෑතකදී පැවැත්වූ රූපවාහිනී සාකච්ඡාවකදී, මහජනයාට බලපාන කාලීන ගැටළු විසඳීම සඳහා තමන් නියෝජනය කරන සුළුතර පක්ෂය ක්‍රියා කරන්නේ කෙසේ දැයි නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගෙන් විමසන ලදී. ඔහු ක්ෂණිකව ලබා දුන් පිළිතුර වූයේ 'අපට බලය දෙන්න' යන්නයි - ඔහු දෙවරක් ම එය පැවසුවේය. 'ධුරයට ඡන්දයෙන් තේරී පත්වීම' පිළිබඳව එහි සඳහනක් නොතිබුණි. 'පැරණි වමේ' ප්‍රවීණ දේශපාලඥයෙක් කොළඹ වරාය නගරය තුළ කම්කරු අයිතිවාසිකම් බාදනයවී යාමට ඇති ඉඩ සම්බන්ධයෙන් ඔහු කනස්සල්ලට පත්වී සිටින බව සහ ඒ නිසා ඔහු පනතට සංශෝධනයක් කෙටුම්පත් කළ බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළේ ය. 'ඔහුගේ ජ්‍යෙෂ්ඨයින්' එම සංශෝධනය ඉල්ලා අස්කරගන්නට තමන්ව පොළඹවා ගත් බව ඔහු ප්‍රකාශ කළේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් සහ එහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ ජනාධිපතිවරයාගේ බලතල පුළුල්වීම මගින් පාර්ලිමේන්තුවේ බලතල හා වගකීම්, විශේෂයෙන් ම රාජ්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය හා ජාතික සම්පත් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඇති බලතල හා වගකීම් ඉවත් කර ඇතැයි සිතීම වැරදි ය. බලයේ සිටින ජනාධිපතිවරයාගේ සහ රජයේ "රබර් මුද්‍රා" බවට පත්විය හැක්කේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ම මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ නීතිවලට නොවේ.

ආයතනයක් වශයෙන් පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමට මැතිවරණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගෙන නොඑන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අපගේ නීතිවලින් විධිවිධාන සලසා ඇති, කොළඹ වරාය නගරයේ මූල්‍ය අධීක්ෂණය ඉටු නොවන අපේක්ෂාවක් වීමට ඉඩ තිබේ. තමන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය බලතල සහ වගකීම් ඉටුකරන්නට කැපවී නොසිටින බහුතරයකගෙ න් සිදුවිය හැකි අනර්ථය, වගකීමෙන් කටයුතු කරන සහ හඬ නගන්නා වූ විපක්ෂයක්, මාධ්‍ය සහ සිවිල් සමාජයක් හරහා යම් තාක් දුරකට හෝ මගහරවා ගත හැකි ය. එය කොළඹ වරාය නගරය ජාතික සංවර්ධනයට දායකවීම අරමුණු කරගත් ආර්ථික කලාපයක ඵලදායීත්වයට ඉතාමත් වැදගත් වන මූල්‍ය වගවීම සම්බන්ධ සම්මතයන්ට අනුකූල වන බව සහතික කරගැනීම සඳහා තිබෙන එක් ක්‍රමයක් විය හැකි ය.

## (ඈ) කොළඹ වරාය නගරය රජයේ ආයතනයක් ලෙස කළමනාකරණය සහ පරිපාලනය කිරීම

කොමිෂන් සභාවට පත්කිරීම් සිදුකරන්නේ ජනාධිපතිවරයා විසින් වන අතර, පත්කිරීම් සිදු කිරීම සඳහා වන ඇතැම් නිර්ණායක පනතෙහි ඇතුළත් කර තිබේ. කොලඹ වරාය නගරය පනත් කෙටුම්පත සම්බන්ධ නඩුවේ තීන්දුව ලබාදීමේ දී, කොමිෂන් සභාවට පත්කිරීම් සිදුකරන විට ජනාධිපතිවරයාට සීමා රහිත අභිමතයකින් ක්‍රියා කිරීමට බලය ලබා දීමේ සංකල්පය අධිකරණය ප්‍රතික්ෂේප කළේය. එම පත්වීම් අධිකරණ සමාලෝචනයට යටත් වේ.[18]

ශිරාණි බණ්ඩාරණායක අධිකරණ විනිශ්චයකාර නිලයට පත්කිරීම පිළිබඳ නඩුවේ දී[19], අධිකරණ විනිශ්චයකාර නිලයට පත්කිරීමට අදාළ විශේෂ නිර්ණායක ඇතුළත් නොවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානයක් පවා, විනිශ්චයකාර නිලය සඳහා පත්කිරීමට අවශ්‍ය සුදුසුකම් පිළිබඳව පවතින අනෙකුත් නියාමන විධිවිධානවලට ගැළපෙන ආකාරයෙන් අර්ථ නිරූපණය කිරීමට අධිකරණයට හැකි බව මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා ද තීන්දු කළේය. කෙසේ නමුත්, රාජ්‍ය කොමිෂන් සභාවලට පත්කිරීම් විචාරාත්මක විවේචන වලට ලක් වීමට ඉඩ ඇතත්, ඒවා සාමාන්‍යයෙන් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීමක් සිදු නොවේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ සම්බන්ධ නීති මීමංසාව මගින් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවට ජනාධිපතිවරයා විසින් සිදුකරන පත්කිරීම් මහජනතාව විසින් පරීක්ෂාවට භාජනය කරනු ලැබීම දිරිගන්වයි.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යනු පුළුල් බලතල සහිත බලවත් කොමිෂන් සභාවකි. කොළඹ වරාය නගරයේ ව්‍යාපාර කටයුතුවල නිරතවිය හැකි "බලයලත් පුද්ගලයින්" ලෙස ආයෝජකයින් වෙත 'බලපත්‍ර ලබාදීම,' අවසර දීම සහ ලියාපදිංචි කිරීම සඳහා එම කොමිෂන් සභාවට පූර්ණ අභිමතය ඇති බව පෙනෙයි. මෙම කොමිෂන් සභාව විස්තර කරනු ලැබ ඇත්තේ 'ඒකීය ආයෝජන පහසුකම් සලසන්නෙක්' වශයෙනි. කොළඹ වරාය නගරයේ දැක්ම වන්නේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සහ ක්‍රියාකාරකම් "පහසු" කිරීම වන බැවින්, නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම 'බරක්' වශයෙන් සලකනු ලැබේ. මෙය බලපත්‍ර, අවසරදීම් සහ ලියාපදිංචිය ලබා දීම සහ හඳුනාගත් ඇතැම් ලිඛිත නීති සහ නියාමන රාමුවලින් නිදහස්වීම සඳහා කොමිෂන් සභාවට සැලකිය යුතු බලතල ප්‍රමාණයක් සහ අභිමතයක් ලබාදීම සාධාරණීකරණය කරන හේතු වශයෙන් ඉදිරිපත් කර ඇත.

වරාය නගරය පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කළ අවස්ථාවේ, කලාපය පරිපාලනය සහ කළමනාකරණය සඳහා කොමිෂන් සභාවට ලබා දී ඇති සීමා රහිත අභිමතය සහ වැදගත් ජාතික මූල්‍ය ආයතනවල නිලධාරීන් නිල බලයෙන් කොමිෂන් සභාවට පත් නොවීම පිළිබඳව පෙත්සම්කරුවෝ ප්‍රශ්න කළහ. මෙම පනතෙහි සඳහන් කර ඇති නියාමන බලධාරීන්ට ඔවුන්ගේ ම නීති සහ රෙගුලාසි යටතේ ඔවුන්ගේ අභිමතය සහ තීරණ ගැනීමේ බලය අහිමි නොකළ යුතු බව එයට ප්‍රතිචාර වශයෙන් අධිකරණය තීන්දු කළේය. ඒ අනුව දැන් අදාළ නියාමන බලධාරීන්ගේ එකඟත්වය ලබාගත යුතු අතර, කොමිෂන් සභාව විසින් මෙම නීති ක්‍රියාත්මක කරනු ලැබීම කොමිෂන් සභාව විසින් අවහිර නොකළ යුතු ය. මෙම අදහස් පනතට ඇතුළත් කිරීම සඳහා පනතට මෙම සංශෝධන ඇතුළත් කර තිබේ. එබැවින්, කොමිෂන් සභාවේ නියාමන බලතල, මෙකී නියාමන බලධාරීන්ගේ බලතලවලට ගරු කළ යුතු ය යන නියමයට යටත් වේ.[20]

දේශපාලන මැදිහත්වීම් රාජ්‍ය සේවය සහ රජයේ ආයතන දුර්වල කිරීමට හේතු වී

ඇති බව රාජ්‍ය පරිපාලනය සම්බන්ධයෙන් මෑතකාලීනව ඇතිවී තිබෙන ප්‍රවණතාවලින් පෙන්නුම් කරයි. සංස්ථා සහ විශ්වවිද්‍යාල වැනි රජයේ ආයතනවල පාලක මණ්ඩල සාමාජිකයින් අකර්මන්‍යව සිටින බවක් ජනතාවට නිරීක්ෂණය වෙයි. 'බැඳුම්කර වංචාව,' 'සිල් රෙදි බෙදදීමේ' සිද්ධිය, සහ ජාතික ගුවන් සේවාවල අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාත්මක වන ආකාරය මගින් මෙවැනි වැදගත් රජයේ ආයතනවල ඉහළ ම මට්ටමේ තනතුරු දරන පුද්ගලයින් ඒවායේ කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධයෙන් අක්‍රිය සහ එයට කිසිදු සම්බන්ධයක් නැත්තවුන් සේ පසෙකට වී බලාසිටින අන්දම පෙන්නුම් කරේ. ආහාරපාන බෙදහද ගෙන, විහිළු තහළු කරමින්, 'මතභේදයට තුඩු දෙනු ඇතැයි' පෙනෙන්නට තිබෙන කිසිදු ගැටළුවක් සම්බන්ධයෙන් සාකච්ඡා නොකර, රැස්වීම් නිමාකර පිටවී යන්නට ඔවුන් හුරුපුරුදු වී තිබේ. පාලක මණ්ඩලවල සාමාජිකයින්ගේ උදාසීනත්වය සහ අකර්මන්‍යතාවය ඒවායේ සභාපතිවරුන් විසින් බලය අයුතු ලෙස යොදා ගනු ලැබීම පහසු කරවයි. මෙම තත්වය අපක්ෂපාතී ප්‍රතිපත්ති සම්පාදනය සහ තීරණ ගැනීම වෙනුවට දේශපාලන අතපෙවීම් සඳහා ඉතාමත් සුදුසු පරිසරයක් නිර්මාණය කරයි. මෙම ක්‍රමය ම දිගින් දිගටම පැවතුනහොත්, කොළඹ වරාය නගරය කොමිෂන් සභාව ද ජනතාවට වගකියන ආකාරයකට ජාතික සංවර්ධනයට උරදීම සඳහා තමන්ට පැවරී ඇති භූමිකාව සහ වගකීම ඉටුකරන රජයේ ආයතනයක් වශයෙන් ක්‍රියාකාරනු ඇතැයි අපේක්ෂා කිරීම දුෂ්කර ය.

කොමිෂන් සභාවට පවරා දී ඇති, කොළඹ වරාය නගරයේ ඉඩම් 'රජයේ අළෙවි කළ හැකි ඉඩම්' සහ 'ව්‍යාපෘති සමාගමේ අළෙවි කළ හැකි ඉඩම්' යනුවෙන් දෙයාකාරයකින් විස්තර කර තිබේ. පනතට සහ අනෙකුත් ලිඛිත නීතිවලට යටත්ව ඉඩම් බදුදීමට කොමිෂන් සභාවට බලය ඇත. එසේම මෙම ඉඩම් කාණ්ඩ දෙකට ම අයත් 'සහාධිපත්‍ය කොටස්' බදුදීමට හෝ සින්නක්කර පදනමින් පවරාදීමට ද කොමිෂන් සභාවට බලය ඇත. 'රජයේ අළෙවි කළ හැකි ඉඩම්' යනු රජයේ ඇතැම් නිශ්චිත හා සමාන සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත හැකි පරිදි කොළඹ වරාය නගරය තුළ පිහිටා ඇති ගොඩකළ භූමි ප්‍රදේශයකි. මෙම ඉඩම් නේවාසික සහ වාණිජ කටයුතු සඳහා යොදාගැනීම සහ "ප්‍රජා මූලික සංවර්ධනය" සඳහා යොදාගැනීම එවැනි නිශ්චිත සංවර්ධන කටයුතු අතරට ඇතුළත් වේ. "ව්‍යාපෘති සමාගමේ අළෙවි කළ හැකි ඉඩම්" යනු නේවාසික, වාණිජ, විනෝදාස්වාදය හා විවේකය පදනම් කරගත් හා එයට සමාන වෙනත් සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපෘති සමාගමට යොදාගත හැකි, නාගරික සංවර්ධන අධිකාරිය විසින් 'ප්‍රධාන බදු දරන්නා' යන පදනමින් ව්‍යාපෘති සමාගමට නිකුත් කරනු ලබන, ගොඩකළ භූමි ප්‍රදේශයයි.[21]

කොළඹ වරාය නගර භූමි ප්‍රදේශය තුළ "අදාළ නොවන" පනතක් වශයෙන් නම් කරමින් නාගරික සංවර්ධන අධිකාරිය (1978) පනත බැහැර කර තිබුණ ද, කොළඹ වරාය නගරයට පැවරී ඇති යම් ඉඩමක් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඕනෑම ඉඩම් පවරා දීමක් හෝ බදු දීමක් හෝ එවැනි වෙනත් ලියවිල්ලක් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ එම කොමිෂන් සභාව විසින් අත්සන් කර ඇති ලෙස සලකනු ලැබේ. මෙය නාගරික සංවර්ධන අධිකාරියෙන් කොමිෂන් සභාව ලබාගත් හිමිකමේ මූලාශ්‍රයෙහි අවිච්ඡින්නතාවය සහතික කරයි. කොළඹ වරාය නගරය තුළ පිහිටා ඇති ඉඩම් යන වැදගත් මාතෘකාව සම්බන්ධයෙන් මෙම ආයතනය කොමිෂන් සභාව සමග සම්බන්ධ වනු ඇත්තේ කෙසේද යන්න නොපැහැදිලි ය.[22] කොළඹ වරාය නගරය පනත් කෙටුම්පත පිළිබඳ තීන්දුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය, කොමිෂන් සභාව විසින් සහ රජයේ ඉඩම් ආඥා පනත මගින්

ජනාධිපතිවරයාට ලබා දී ඇති බලතල යටතේ ඉඩම් ප්‍රදානය කිරීමට ජනාධිපතිවරයාට ඇති බලතල නැවත අවධාරණය කිරීමේ දී, හිමිවූ ඉඩම් බදු දීමේ සහ පවරා දීමේ බලය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ඇති බව උපකල්පනය කළේයි ඉඩම් බදු දීම සහ පැවරීම සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිලි සංරක්ෂණය කිරීම යන සංකල්පවල පැහැදිලි බවක් නොතිබීම පිළිබඳව අවධානය යොමු නොවීය.

## කොළඹ වරාය නගරය තුළ 'උරුම ගොඩනැගිලි' සංරක්ෂණය කිරීම

සුප්‍රකට "කොළඹ කොටුවේ උරුම චතුරස්‍රය" තුළ පිහිටි පැරණි ගොඩනැගිලිවල අනාගතය කුමක් වේද යන්න මහජන සාකච්ඡාවට ලක් වූ මාතෘකාවකි. මහනුවර සහ ගාල්ලේ පිහිටා ඇති ගොඩනැගිලි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 'උරුම ස්ථාන' වශයෙන් නම් කර තිබේ. මෙය අභාවප්‍රාප්ත ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා විසින් හඳුන්වා දෙන ලද ක්‍රමවේදයකි. 'උරුම ස්ථාන' වශයෙන් ගැසට් කර ඇති ගොඩනැගිලි සංරක්ෂණය කිරීම, අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට, මහනගර සභාවලට සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධීකරණයෙන් යුතුව ඉටු කළ යුතු කාර්ය භාරයක් සහ වගකීමක් පැවරී තිබේ.

කෙසේ නමුත්, කොළඹ කොටුවේ පිහිටි ගොඩනැගිලි මේ අන්දමින් නම් කර නොමැත. ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පියකු වූ පාණි විජේරත්න කොළඹ වරාය නගරය මගින් ඇති කෙරෙන සමාජ සහ සංස්කෘතික බලපෑම සලකා බැලීම සඳහා පත්කරන ලද ජූරියක කටයුතු කළ අතර, එහි වාර්තාව මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන අතරතුර ඉදිරිපත් කරන ලදී. එහෙත්, කොළඹ වරාය නගරයට ඇතුළත් බව පෙනෙන්නට තිබෙන 'උරුම චතුරස්‍රයේ' පිහිටි වැදගත් පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කරන ආකාරය කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ නියමයන්හි විෂය අතරට ඇතුළත් වී නැත.

පැරණි යටත්විජිත නීතියක් වන පුරාවස්තු ආඥා පනත (1940) මගින්, විනාශයට හෝ හානියට පත්වීමේ අවදානමට ලක් වී තිබෙන, පුද්ගලික ඉඩම්වල පිහිටි ගොඩනැගිලි ද ඇතුළුව 1815-1850 කාලයට පූර්ව 'ඉපැරණි ස්මාරක' යන නමින් හඳුන්වන ගොඩනැගිලි සංරක්ෂණය සඳහා විධිවිධාන සලසයි. පොදු යහපත උදෙසා එවැනි ගොඩනැගිලි 'රක්ෂිත ස්මාරක' යනුවෙන් ප්‍රකාශයට පත් කළ හැකිය.[23] 'උරුම චතුරස්‍රයේ' පිහිටි එවැනි ගොඩනැගිලි පුරාවිද්‍යා ආඥාපනතට කඩිනම් සංශෝධනයක් සිදු කිරීම හරහා 'රක්ෂිත ස්මාරක' යනුවෙන් ප්‍රකාශයට පත් කළ හැකියි. එමගින් සම්බන්ධීකරණය කළ සංරක්ෂණ ප්‍රතිචාරයක් සඳහා පහසුකම් සැලසෙනු ඇති. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය වැනි බලධාරීන්ට සහ ආයතනවලට ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංරක්ෂණ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව මෙම දර්ශනීය ගොඩනැගිලි සංස්කෘතිකමය වශයෙන් යෝග්‍ය වන සහ සංවේදී ආකාරයකට ප්‍රතිසංස්කරණ කර, නවීකරණයන් සිදු කර, මනා ලෙස සංරක්ෂිත උරුමයන් වශයෙන් පවත්වා ගනු ලබන බව සහතික කිරීමට උපකාර කළ හැකිය.

ඉහත සඳහන් කළ ජූරිය කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් නිකුත් කළ වාර්තාව මගින් ඇතැම්විට එවැනි සංරක්ෂණ කටයුතු සඳහා පදනමක් සකසා දිය හැකියි කොටුවේ 'උරුම චතුරස්‍රය' තුළ පිහිටා ඇති මෙම වැදගත් ගොඩනැගිලි සංරක්ෂණය කිරීම පිළිබඳ ගැටළුවට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වුව හොත්, අවසානයේ දී "බලයලත් නියෝජිත" සමාගමක් විසින් මෙම ගොඩනැගිලි විනාශ කරනු ලැබීමට හෝ ශ්‍රී ලාංකීය උරුමය

සහිත ස්ථාන යන සංකල්පයට නොගැළපෙන ප්‍රමිතීන් හා සම්මතයන් අනුව එම ගොඩනැගිලි අළුත්වැඩියා කරනු ලැබීමට ඉඩ තිබේ. චීන සමාගමක් තිස්ස වැවේ රොන්මඩ ඉවත්කිරීම සම්බන්ධයෙන් උද්ගතවූ තිස්ස වැව සිදුවීම වැන්නක් නැවත සිදුවන බව අපට දැකගැනීමට සිදු විය හැක.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම සම්බන්ධ ප්‍රමිතීන්ට ගරුකිරීම

ශ්‍රේෂ්ඨාධිකරණය කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් ලබා දුන් තීන්දුවේ දී, කොමිෂන් සභාවේ බලතල සහ කොළඹ වරාය නගරයේ ව්‍යාපාර කටයුතු සිදුකිරීමට 'බලයලත් පුද්ගලයින්' වෙත බලපත්‍ර, අනුමැතිය සහ ලියාපදිංචිය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පවතින වෙනත් ගැටළු කිහිපයක් ද සලකා බලා තිබේ. අදාළ ලිඛිත නීතිවල දැක්වෙන විධිවිධාන උල්ලංඝනය කරමින්, කොමිෂන් සභාව විසින් අත්තනෝමතික තීරණ ගනු ලැබීම සඳහා පනත මගින් අවසර නොදීමේ වැදගත්කම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවධාරණය කරන ලදී. ලබාදෙනු ලබන නිදහස්කිරීම් සඳහා 'සාධාරණ වර්ගීකරණයක්' පදනම් කරගනිමින් නිශ්චිත මාර්ගෝපදේශ නියම කිරීම හරහා, බලයලත් පුද්ගලයින්ට නිදහස් කිරීම් සහ වාසි ලබාදීමේදී වෙනස්කොට සැලකීම වළක්වා ගත යුතුය.

සමානාත්මතාවය සහ නීතියේ සමාන ආරක්ෂාව සඳහා ඇති මූලික අයිතිවාසිකම පිළිබඳව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව ක්‍රියාවට නැංවීම සහ එයට අනුකූල වීම සඳහා වන අවශ්‍යතාවය කෙරෙහි ගරු විනිසුරුතුමන්ලාගේ අවධානය යොමුකර තිබේ. කෙසේ නමුත්, අක්වෙරළ සමාගම් නිදහස් කිරීම සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන ඇතුළත් වී ඇති බැවින්, සමාගම් පනතේ විධිවිධානවලින් අක්වෙරළ සමාගම් නිදහස් කිරීම මෙම ප්‍රමිතිය උල්ලංඝනය කිරීමක් වශයෙන් අධිකරණයෙන් සලකා නොමැති සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා යනු නියාමන අධිකාරියක් යැයි මෙම පනතෙන් සලකා ඇති බැවින්, කොමිෂන් සභාවෙන් ගන්නා තීරණ හරහා, කලාපය තුළ සමාගම් පනතේ අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම උල්ලංඝනය නොවිය යුතු බව ද අධිකරණයෙන් පෙන්වා දෙන ලදී. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම යන මාතෘකා සම්බන්ධයෙන් පවතින නීති මෙම කලාපය තුළ අදාළ වන බැවින් එවැනි ක්‍රියා සඳහා අවදානමක් පවතින්නේ යැයි ඉදිරිපත් වූ තර්ක අධිකරණයෙන් ප්‍රතික්ෂේප කරන ලදී.[24]

තමන්ගේ භූමිය බද්දට දීම හරහා කොළඹ වරාය නරගයේ කටයුතු කිරීමට බලයලත් තැනැත්තන් සමග ප්‍රතිරූප දයකත්ව පදනමින් ව්‍යාපාර කටයුතුවල නිරතවීමට ශ්‍රී ලාංකිකයින්ට අවසර ලබාදීම සඳහා කොමිෂන් සභාවට බලය ඇත. භූමියේ වටිනාකම ආයෝජනයේ කොටසක් වේ. රටින් පිටත සිට විදේශ මුදල්වලින් ගෙන එනු ලබන අරමුදල් ඇත්තේ නම් මිස, ඔවුන්ට වෙනයම් ආකාරයකින් මෙම ව්‍යාපාරවලට ආයෝජනය කළ නොහැකිය. කලාපය තුළ බලයලත් තැනැත්තන්ට කොළඹ වරාය නගරයෙන් පිටත පිහිටි ශ්‍රී ලාංකීය ව්‍යාපාර සමග හවුල්කාරීත්වයන්ට එළඹීමට ද අවසර ලබාදිය හැකියි. එවැනි කටයුතු මහජන සුබසිද්ධිය සහ ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ අභිවෘද්ධිය උදෙසා සිදුවන්නේදැයි සහතික කරගැනීම කොමිෂන් සභාවට පැවරී තිබේ. එහිදී, කලාපය තුළ ක්‍රියාත්මකවීම සඳහා බලයලත් තැනැත්තන්ට ලබාදී ඇති නිදහස් කිරීම්, ඔවුන් කලාපයෙන් පිටත ක්‍රියාත්මක වනවිට භුක්ති නොවිඳින බව ද කොමිෂන් සභාවෙන් සහතික කරගත යුතු ය. එසේ නොමැතිව, කලාපයෙන් පිටත දී එවැනි නිදහස් කිරීම් ලබාදීම අනෙකුත් ව්‍යාපාරවලට එරෙහිව වෙනස්කොට සැලකීමක් වන බව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දු කළ

බැවින් මෙම දෙවන කාරණය සංශෝධනයක් වශයෙන් පනතට හඳුන්වාදුන්නකි.[25]

අක්වෙරළ සමාගම් ඇතුළුව බලයලත් තැනැත්තන්ට කලාපයෙන් පිටත පිහිටි ආයතන සහ පුද්ගලයින්ගෙන් සේවා ලබාගත හැකියි කොළඹ වරාය නගරයේ කොමිෂන් සභා බල ප්‍රදේශය තුළ 'නේවාසික ප්‍රජාවක්' පවතිනු ඇත. මේ සඳහා 'නාගරික පහසුකම් පිළිබඳ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීමට' කොමිෂන් සභාවෙන් කටයුතු කළයුතුව තිබේ. එහෙත්, මහනගරසභා ආඥා පනත යනු කලාපය තුළ අදාළ නොවන්නේ යැයි සලකනු ලබන නීතියක් වේ. බලයලත් තැනැත්තන් කලාපයට පිටතින් ජලය සහ ආලෝකය වැනි සේවාවන් කරා ප්‍රවේශවනු සහ ලබාගනු ඇති බව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සැලකිල්ලට ගෙන නොමැත.[26]

ඒ අනුව, නීතියට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවන අන්දමින් ඔවුන්ගේ පරිපාලන කටයුතු සිදුකෙරෙන බව සහතික කරගන්නේ කෙසේදැයි මෙම නඩුතීන්දුවෙන් කොමිෂන් සභාව වෙත යම් මගපෙන්වීමක් ලබා දී තිබේ. කොමිෂන් සභාව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් බලපෑමකට ලක් වේ යැයි කලින් කිව නොහැකිය. ඇතැම්විට, නඩුතීන්දුවේ පිටපත් පනත සමග අමුණා, කොළඹ වරාය නගරය සහ කොමිෂන් සභාව සම්බන්ධයෙන් ලබාදෙන තොරතුරුවල කොටසක් වශයෙන් සියළුම සාමාජිකයින්ට සහ 'බලයලත් තැනැත්තන්ට' යැවීම සුදුසු වනු ඇත.

## (ඉ) අධිකරණවල භූමිකාව හා වගකීම් සහ කොළඹ වරාය නගරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති, අපේ රටේ පාලන ව්‍යුහයේ එක් ප්‍රධානතම කුළුණක් වන්නේ අධිකරණයයි. අධිකරණයේ කාර්යභාරය සහ වගකීම ජනතා පරමාධිපත්‍යය තුළ පිහිටා ඇත. පාලනයේ අනෙකුත් කුළුණු වන පාර්ලිමේන්තුවේ සහ ප්‍රධාන විධායකයා ලෙස ජනාධිපතිවරයාගේ මැදිහත් වීමෙන් අධිකරණය ස්වාධීන වීම, ජනතා පරමාධිපත්‍ය සංකල්පයෙ සඳහා ඉතාමත් වැදගත් වේ. එක් එක් ආයතනය විසින් තම බලය සහ වගකීම් ක්‍රියාත්මක කිරීමේදී අදාළ වන සංවරණ සහ තුලන, ජනතා සුබසිද්ධිය සහතික කිරීම සහ පාලන බලය අනිසි ලෙස භාවිතා කිරීමෙන් ජනතාව ආරක්ෂා කිරීම සමඟින් සම්බන්ධ වේ. එසේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම් අධිකරණය හරහා බලගන්වාගැනීම, සහ රජයේ ආයතන විසින් අත්තනෝමතික ලෙස බලය භාවිතා කිරීමට එරෙහිව අභියෝග කිරීමට ඇති හැකියාව ද ජනතා පරමාධිපත්‍ය සමග සම්බන්ධ වේ. කොළඹ වරාය නගර නඩු තීන්දුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය, පාලනයේ අනෙකුත් කුළුණු විසින් වගවීමෙන් යුත් පාලනයක් සඳහා පහසුකම් සැලසීමට අධිකරණය නිරූපණය කරන වැදගත් භූමිකාව පිළිගැනීමට ලක් කරයි.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදුන් නඩු තීන්දුවෙහි, කොළඹ වරාය නගරය රජයේ ආයතනයක් වශයෙන් පරිපාලනය කිරීමේදී මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට අනුකූලතාවය දැක්විය යුතු බව පැහැදිලි කරන අතර අවධාරණය කරයි.[27] පනත් කෙටුම්පතේ වූ විධිවිධාන කිහිපයක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බැවින් ප්‍රතික්ෂේප වූ අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 (උ), (ඌ) හා (එ) යන ව්‍යවස්ථා උල්ලංඝනයවීමට ඇති අවකාශය හේතුවෙන් අවසාන පනත සංශෝධනය කරන්නට සිදුවිය. පනතේ සඳහන් කර ඇති නියාමන අධිකාරි ඇතුළු ව්‍යවස්ථාපිත ආයතනවලට ඇති තීරණ ගැනීමේ බලතල සඳහා කොමිෂන් සභාව අනුකූලතාවය

දැක්වීමේ වැදගත්කම අධිකරණයෙන් අවධාරණය කරන ලදී. විශේෂයෙන් ම මූල්‍ය නිදහස් කිරීම් ඇතුළු නිදහස් කිරීම් ලබා දීමේදී කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 148 ව්‍යවස්ථාවලට අනුකූලව, තම අභිමතානුසාරී බලතල ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආමන්ත්‍රණය කරන සඳහන් කර තිබේ.

කලින් සඳහන් කළ අන්දමට, රාජ්‍ය නොවන ක්‍රියාකරුවකු විසින් සිදුකළ ක්‍රියාවකින් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවුවහොත්, රජය ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම අභියෝග යට ලක් කරමින් නඩුපැවරිය හැකිය.[28] සිවිල් අධිකරණයේ ඔවුන් වගකියනු ලබන බව සහතික කරගැනීම සඳහා මූලික අයිතිවාසිකම් ඇසුරින් පදනමක් නිර්මාණය කරගතහැකි යැයි තර්කයක් තිබේ. භාෂණය සහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පවතින වැදගත් මූලික අයිතිවාසිකම් සහ යාම් ඊම් නිදහස සඳහා හිමිකම් කියා පෑ හැක්කේ පුරවැසියන්ට පමණක් වීම ද මෙහිදී අවධානයට ගතයුතු කරුණකි. එනම්, පුරවැසියන් නොවන 'බලයලත් තැනැත්තන්' සහ වරාය නගර ප්‍රජාවේ සාමාජිකයින්ට මෙයින් බලපෑම් ඇති වේ.[29] රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධ ගැටළු, පවරනු ලැබූ නඩු තුළ ඉස්මතු නොවූ නමුත් එම විෂයය සම්බන්ධයෙන් පවතින නීති මීමංසාව කොළඹ වරාය නගරයට අදාළ වනු ඇත.

ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට 'නීතියට අනුකූල නොවූ' පත්කිරීමක් සිදුකළහොත් ඒ පිළිබඳව අධිකරණමය සමාලෝචනයක් සිදුකළ හැකි බව නඩු තීන්දුව හරහා ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගෙන තිබේ. පත්කිරීමේ බලය අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක කිරීමක් සම්බන්ධයෙන් 'උචිත නීති කාර්යපටිපාටි' හරහා අභියෝග කළ හැකි බව ඔවුහු සඳහන් කරති.[30] ශ්‍රේෂ්ඨාධිකරණයට පත්වීම් සිදුකිරීම සම්බන්ධයෙන්, මාර්ගෝපදේශ විරහිතව ජනාධිපතිවරයාට ලබාදී ඇති අභිමතය කෙතරම් විවෘත ද යත්, නීති පුස්තකාලයේ කාර්යමණ්ඩල සාමාජිකයකු වුවද පත් කිරීමට ජනාධිපතිවරයාට හැකිදැයි ප්‍රකට නඩුවකදී පෙත්සම්කරුගේ ජ්‍යෙෂ්ඨ නීතිවේදියා අධිකරණයෙන් අසා සිටි බවක් කියැවේ! 'බලය අභිමතානුසාරී වන අතර, එය සීමා රහිත බලයක් නොවේ. එය අවහිර නොමැති හෝ බාධක නොමැති බලයක් නොවේ' යනුවෙන් මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා පැහැදිලි කරයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිවේදියකු විය යුතු බවත්, යම් යම් වෙනත් කොන්දේසි සපුරා තිබිය යුතු බවත් ගරු විනිසුරුතුමා තවදුරටත් සඳහන් කරයි.[31] කොළඹ වරාය නගර නඩුවේ ජ්‍යෙෂ්ඨ නීතිවේදියකු කළ ප්‍රකාශයක සඳහන් වූ අන්දමට, විදේශිකයකු පවා මේ අධිකරණයේ විනිසුරකු වශයෙන් පත් කිරීමට අධිකරණ ධුර සඳහා පත්කිරීම් සම්බන්ධයෙන් පවතින නීති මීමංසාවෙන් ඉඩ නොලැබේ. කොළඹ වරාය නගර පනත යටතේ පත්කිරීම් සිදුකිරීම සඳහා ජනාධිපතිවරයාට සහ කොමිෂන් සභාවට ඇති බලය විවෘත අභිමතයක් වශයෙන් විස්තර කළ නොහැකි අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සම්මත හා ප්‍රමිති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ඒවා අභියෝගයට ලක් කළ හැකිය.

කොලඹ වරාය නගරය තුළ සිදුකෙරුනු වරද සම්බන්ධයෙන් අධිකරණ බලය, අධිකරණවලට පවතියි.[32] කෙසේනමුත්, බලයලත් තැනැත්තකු හෝ තැනැත්තන් විසිම් මේ පනත යටතේ වරදක් සිදුකරනු ලැබුවහොත්, එය 'ඔහුගේ දැනුම නොමැතිව සිදුකර ඇතිනම්, හෝ එම වරද සිදුවීම වැලැක්වීමට ඔහු විසින් නිසි උද්යෝගයෙන් යුතුව කටයුතු කර ඇත්නම්' ඒ තැනැත්තන් වරදක් කර ඇත්තේ යැයි නොසලකනු ඇති බව පනතේ එක් විධිවිධානයකින් කියැවේ.[33] මෙය, 'ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා පහසුකම් සැලසීම' සහ (නීති හා රෙගුලාසිවලට) 'අනුකූලතාවය

දැක්වීමේ බරෙන් නිදහස් කිරීම' යන කොමිෂන් සභාවේ අරමුණුවල දැක්වුනු ලක්ෂණ සමග අනුකූල වේ.[34] එමෙන්ම, ඊට පටහැනි අන්දමින් ඕනෑම සාමාන්‍ය ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණත්, කොළඹ වරාය නගර පනතට අනුකූල ලියාපදිංචි බලපත්‍ර, ඔප්පු හා පැවරුම් හෝ බදුදීම් කිසිවක් නව ආයෝජකයාට අවාසිසහගත වන අන්දමින් අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමට නොහැක්කේ ය යැයි විධිවිධානයක් පනතට ඇතුළත් ය. මීට ව්‍යතිරේක කිහිපයක් සඳහන් කර තිබේ.[35] රටේ යුක්තිය පසිඳලීම යන සන්දර්භය තුළ පනතේ මේ විශේෂ විධිවිධානවල විෂයපථය සහ ඒවා අදාළ කරගැනීම සිදුවන්නේ කෙසේදැයි පැහැදිලි නැත. උදාහරණ වශයෙන්, මෙම පනත යටතේ ව්‍යවස්ථාපිර වරදක් වන කරුණක් සම්බන්ධයෙන් 'දැනුම නොමැතිවීම' සහ 'නිසි උද්යෝගයෙන් යුතුව' කටයුතු කිරීම ඔප්පු කිරීමේ විෂයයපථය කුමක්ද?

ව්‍යාපාර කිරීමේ පහසුව සලසාදීම යන අරමුණ අවධානයට ගනිමින් පනත, ආරවුල් නිරාකරණය සඳහා බේරුම්කරණයට ප්‍රමුඛතාවය ලබාදී තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පෙන්වා දී ඇති අන්දමට, මින් අධිකරණ පද්ධතිය 'පසෙකට දැමීමක්' අදහස් නොවේ. මක් නිසාද යත් බේරුම්කරණය අනිවාර්ය ක්‍රියාවලියක් නොවන අතර එය සිදුවන්නේ පාර්ශවයන්ගේ ඒකමතික එකඟතාවයේ පදනමින් වන බැවිනි.[36]

කොළඹ වරාය නගරයේ සිවිල් හෝ වාණිජ නඩු විභාග කිරීමට අධිකරණය ප්‍රමුඛත්වය දිය යුතු බවටත්, ඒවා "දිනපතා පදනමින්" කඩිනමින් විභාග කිරීමටත් නියම කරන, පනතේ විශේෂ කොටස ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකා බලන ලදී. ඒ හරහා ජනතාවගේ අධිකරණ බලය, සහ සමානාත්මතාවය හා වෙනස්කොට සැලකුම් නොලැබීමට පුරවැසියන්ට ඇති අයිතිය පිළිබඳ සංකල්පවලට අදාළ 3,4 සහ 12 යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වගන්ති උල්ලංඝනයක් සිදුවී ඇතැයි පෙත්සම්කරුවන් ඉදිරිපත් කළ තර්කය ගරු විනිසුරුතුමන්ලා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මෙම විධිවිධානය ව්‍යාපාර කිරීමේ පහසුව ඇතිකිරීමේත් නව ආයෝජන ආකර්ෂණය කරගැනීමේත් අරමුණු ළඟාකරගැනීම සඳහා යුක්තිසහගත බව අධිකරණයේ අදහස විය.[37]

ළමා ලිංගික අපයෝජන නඩු ඇතුළුව විවිධ අංශවල නඩුකටයුතුවල ප්‍රමාදය හේතුවෙන් මේ රටේ බහුතර පිරිසකට යුක්තිය අහිමිවීයාමේ පසුබිමක් තුළ මෙම වරප්‍රසාදය ලබාදීමේ 'යුක්තිසහගතබව' ප්‍රශ්නකාරී වන බව ගරුත්වයෙන් යුතුව සඳහන් කරනු ලැබේ. පැහැදිලිවම, නීතියේ ප්‍රමාදයන් යනු යුක්තිය පසිඳලීමේ පද්ධතියෙහි පවතින පොදු ප්‍රශ්නයකි. එය, අධිකරණවල කාර්යපටිපාටි වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන සිදුකරන මැදිහත්වීම් හරහා විසඳිය යුතු වේ. වේගයෙන් නඩු විභාග කිරීම සඳහා තවත් අංශ කිහිපයක් තෝරාගෙන ඇත්තේ නම් මිස, කොළඹ වරාය නගරයේ එක් කාණ්ඩයකට අයත් වාණිජ නඩු සඳහා පමණක් ප්‍රමුඛතාවය දීම වෙනස්කොට සලකනසුළු ය.

## නිගමන

විශේෂ ආර්ථික කලාප තුළ ඵලදායී නියාමනයක් සහ කළමනාකරණයක් සහිත වගකිව යුතු පාලනයක් ඇතිවිට පමණක් එම කලාප සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බව පෙන්නුම් කරන සාක්ෂි පදනමක් තිබේ. පාරිසරික හායනය සහ තීරණ ගැනීම දේශපාලනීකරණය වීම වැනි සෘණාත්මක බලපෑම් එම කලාප වලින් අපේක්ෂිත ආර්ථික වර්ධනය අත්කරදීම සඳහා එම කලාප සතුව ඇති ධාරිතාවය හීන කරයි.[38]

ඒ හැරෙන්නට, එවැනි කලාප ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මත පදනම් වී ඇති රටේ නියාමන

පද්ධතියෙන් සහ පාලන පද්ධතියෙහි ඇති මූලික නීති රීති සහ ප්‍රමිතීන්ගෙන් බැහැර නොවිය යුතුය. ව්‍යාපාර පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්ම සහ ව්‍යාපාර හා මානව හිමිකම් පදනම් කරගත් ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සම්බන්ධ කරන බහු පාර්ශ්වික සම්මුතියක් සකස් කර සම්මත කර ගැනීම සඳහා වන යෝජනා මගින් ජාතික සංවර්ධනයේ දී රාජ්‍ය නොවන ආයතනික ක්‍රියාකාරීන්ගේ භූමිකාව පිළිබඳ නව චින්තනයක් පිළිබිඹු කරයි. සාමූහික සමාජ වගකීමට සහ ආර්ථික වර්ධනය මානව හිමිකම් හා තිරසාර සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සම්මතයන් සමග සමබර කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවට ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ ශ්‍රී ලංකාවේ දේශීය නීති□ ප්‍රතිපත්ති සහ පාලනය ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති ජාත්‍යන්තර ගිවිසුම් සමග අනුකූල කිරීමට රජය දක්වන කැපවීම් මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ආකෘතියක් ඇත.[39] නඩු කටයුතුවලදී ජාත්‍යන්තර සම්මතයන් නොසලකන නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව තිරසාර සංවර්ධනය පිළිබඳ මෙම ප්‍රවනතාවන්ට අනුකූල වන බව පෙනෙයි.

මූල්‍ය හා මූල්‍යමය නොවන දිරි දීමනා සපයා දෙමින්, සේවකයින් බඳවා ගැනීමට හා සේවයෙන් ඉවත් කිරීමට ඉඩ සලසන අනුග්‍රහපූර්වක ව්‍යාපාර ප්‍රතිපත්ති සකසා දෙමින්, සහ ව්‍යාපාර කිරීමේ පහසුව ප්‍රවර්ධනය කරමින් විදේශීය ආයෝජන දිරි ගැන්වීමේ අරමුණු මගින් කොළඹ වරාය නගරය පනත් කෙටුම්පතෙහි කෙටුම්පත්කරුවන්ට පැහැදිලිව ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ලිඛිත නීතිය නොසලකා හැර එම පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීමට මග පෙන්වීය. කොළඹ වරාය නගරය පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද අවස්ථාවේදී බොහෝ පෙත්සම්වල පදනම වූයේ එය අපේ ජාතික නියාමන පද්ධතියට අනුකූල නෙවෙන්නේය යන්නයි. වරාය නගරය ආර්ථික කලාපයට මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ නීති පද්ධතියේ රාමුවෙන් බැහැරව නීතී නියාමනය සඳහා වෙනම ම කලාපයක් ලෙස ක්‍රියා කළ නොහැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද තීන්දුව මගින් නිගමනය කරන ලදී.

පනත් කෙටුම්පතෙහි බොහෝ විධිවිධාන අධිකරණ සමාලෝචනයට යටත් විය හැකි බව පිළිගත් අධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම හේතුවෙන් ඒවා අවලංගු කළේයි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව ඇතුළු රාජ්‍ය ආයතනවලට රටේ නීති රාමුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පරිබාහිරව ක්‍රියා කළ නොහැකි බවට පැහැදිලි ප්‍රකාශයක් කිරීමට දායක වූයේ පෙත්සම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතයයි. එබැවින්, කොළඹ වරාය නගරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ රටේ නීතියට "අනුකූලවීමේ බර" ලෙස එහි මුල් පනත් කෙටුම්පත විසින් සලකන ලද දෙයින් ආයෝජකයින්ට සම්පූර්ණයෙන්ම සහනය සලසා දෙන "ව්‍යාපාරික වටපිටාවක්" සහිත "ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයක්" වනු ඇති බවට වන මහජන මතය අභියෝගයට ලක් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය මගින් පදනමක් සපයා දෙයි. මෙරට නීතියට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සම්මතයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව කොළඹ වරාය නගරයෙහි ක්‍රියාකාරකම් ජනතාව, සිවිල් සමාජය සහ නියාමන ආයතන විසින් අධීක්ෂණය කරනු ලැබිය හැකි හා කළ යුතු බවට වන වැදගත් සහතික කිරීමක් මෙයින් ලබා දෙයි.

කොළඹ වරාය නගරය පනත් කෙටුම්පත පිළිබඳ නඩු විභාගය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීති සම්පාදක කුළුණ වන පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරනු ලැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන නීති සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සම්බන්ධයෙන් ද බරපතල ප්‍රශ්න මතු කරයි. මෙම යථාර්ථයන් සලකා බැලීමේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත කොළඹ වරාය නගරය පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල පනත් කෙටුම්පතක් ලෙස නීතිපතිවරයා

විසින් ප්‍රසිද්ධියේ විස්තර කරනු ලැබිය හැකිව තිබුණේ කෙසේද?[40]

නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජෙනරාල් ෆර්සානා ජමීල් මහත්මිය පනත් කෙටුම්පතෙහි ඇතැම් වගන්ති පිළිබඳ ඉතා හොඳ තර්ක ඉදිරිපත් කළ අතර ඒවා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාලෝචනය කර වලංගු යැයි සලකන ලදී. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වීමේ කාරක සභා අවස්ථාවේ දී ඉදිරිපත් කරනු ඇතැයි ජමීල් මහත්මිය සඳහන් කළ විධිවිධාන සඳහා ඒ මහත්මිය ද සංශෝධන ඉදිරිපත් කළායි මෙය ඇතැම් විධිවිධානවල තිබූ ව්‍යවස්ථා විරෝධී බව ඉවත් කිරීමට උපකාරී විය.

පනත් කෙටුම්පතක් නඩු පැවරීම මගින් අභියෝගයට ලක් කර ඇති අවස්ථාවක එම පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය අනුමත කිරීම, ව්‍යවස්ථානුකූලභාවය සඳහා යෝජිත නීති සම්පාදනය පරීක්ෂා කර එයට සංශෝධන සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ රජයට උපදෙස් දීමේ පැහැදිලි වගකීමෙන් නීතිපතිවරයාව නිදහස් කෙරෙන්නේය යන කරුණ ගෞරවයෙන් යුතුව ඉදිරිපත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල සම්මතයන්ට අනුකූල වන නීති හා ප්‍රතිපත්ති සම්පාදනයේ යෙදීම සඳහා වන රජය සතු වගකීම ශක්තිමත් කරනු ලබන්නේ පනත් කෙටුම්පතක් අභියෝග යට ලක් කිරීමට පෙර එය නීතිපතිවරයාගේ පූර්ව පරීක්ෂාවට භාජනය කිරීම මගින් වේ. ඉදිරියේ දී පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ දී සංශෝධන ඉදිරිපත් කරන්නේය යන කරුණ මත පදනම්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ සමාලෝචනය අවස්ථාවේ දී පනත් කෙටුම්පතක් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමේ පිළිවෙත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සම්බන්ධ නඩු විභාග යේදී පෙත්සම්කාර පාර්ශවයේ නීතිඥවරයා විසින් අභියෝගයට ලක් කරන ලද නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය එය පිළිගත්තේ නැත. එමගින් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් විවාද කර සම්මත කරනු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට **පෙර** එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන්නේද යන්න පරීක්ෂා කර බැලීමේ වගකීම ඉටු කරනවා වෙනුවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රශ්නකාරී පිළිවෙත අනුගමනය කරනු ලැබීම දිරිමත් කිරීම කණගාටුවට කරුණකි. මෙම පිළිවෙත නිසැකව ම පනත් කෙටුම්පත් පරීක්ෂා කිරීම සඳහා වන ස්වකීය ප්‍රවේශය පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැඩි ලෙස සලකා බැලිය යුතු කරුණක් වේ.

නාගරික සංවර්ධන පනත සහ මහ නගර සභා ආඥාපනත වැනි වැදගත් නීති බැහැර කරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතෙහි ගම්‍යමානයන් පැහැදිලි වනුයේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිසමෙහි වැඩකටයුතු ආරම්භ වූ පසුව පමණකි. ඒ හා සමානව ම, මෙම කොමිසමට දේශීය ආදායම් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත වැනි වැදගත් නීති වලින් නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ලබා දීමෙහි බලපෑම ද එවැනි ය.[41] කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත කොළඹ වරාය නගරයේ ව්‍යාපාර සඳහා අදාළ වීමෙන් බැහැර කිරීම මගින් මෙම ප්‍රදේශයෙන් පිටත කම්කරු සබඳතාවලට අදාළ නොවන සංකල්පයක් වන සේවකයින් බඳවා ගැනීමේ සහ ඉවත් කිරීමේ සංකල්පයක් හඳුන්වා දෙයි. 1977 - 1980 කාල කාලපරිච්ඡේදයේ දී නිදහස් වෙළඳ කලාප සඳහා ද මේ ආකාරයේ කම්කරු නීති වලින් නිදහස් කිරීමක් හඳුන්වා දුන් විට, නිදහස් වෙළඳ කලාප ඇතුළත සහ ඉන් පිටත කර්මාන්තශාලාවල දී කාන්තා ශ්‍රමිකයින්ව සූරාකනු ලැබීම වැළැක්වීමට උපකාරී වූයේ කාන්තා කණ්ඩායම් ද ඇතුළු සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරීත්වය යි. ආයෝජකයින්ගේ විශ්වාසය ප්‍රවර්ධනය කිරීම පිණිස සහ "ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා පහසුකම් සැලසීම" පිණිස

නීති හා නියමයන්ට අනුකූල වීම අවම කිරීමෙහි අරමුණු මගින් රාජ්‍ය ආයතන කළමනාකරණයේ දී සහ පරිපාලනයේ දී නීතිය සහ නියාමනය සහ සේවක අයිතිවාසිකම් නොසලකා හැරීමේ සංකල්පයක් තවදුරටත් නීත්‍යානුකූල නොකරන සහ ශක්තිමත් නොකරන බව සහතික කිරීම සඳහා ඒ ආකාරයේ ම මැදිහත්වීමක් අවශ්‍ය විය හැක. ජනතාවගේ මූලික අයිතිවාසිකම් යටපත් කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන මැදිහත්වීම් නීත්‍යානුකූල කිරීම සහ නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සඳහා දණ්ඩමුක්තිය ලබා දීම මගින් යුක්තිය පසිඳලීම කෙරෙහි ඇති මහජන විශ්වාසය තවදුරටත් බාදනය වීම දිරිමත් නොකිරීම වැදගත් වේ.

පෙත්සම්කරුවන් විසින් අභියෝගයට ලක්කරනු ලැබීම සහ නඩු විභාගයේ දී අධිකරණ සමාලෝචනය හේතුවෙන් කොළඹ වරාය නගරය පනතෙහි සංශෝධන සිදු කර තිබියදීත්, කොළඹ වරාය නගරයට "රාජ්‍යයක් තුළ රාජ්‍යයක්" වන වෙනම ම ඒකකයක් බවට පත්වීමට අවසර ලබා දෙන්නේ නම් එය සම්භාව්‍ය උත්ප්‍රාසයක් වනු ඇති. මෙය සිදුවන්නේ විවිධ දේශපාලන පාලන තන්ත්‍ර තුළ දී බලය බෙදීම සහ පළාත් අතර බලය බෙදා හැරීම පිළිබඳ සංකල්පය මතභේදවල මාතෘකාව බවට පත්වී ඇති සන්දර්භයක ය.

වසර ගණනාවක් පුරා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීති මීමංසාව මගින් "ජනතාවගේ පරමාධිපත්‍යය" යන වැදගත් සංකල්පය පිළිගෙන ඇති. මහජනතාවගේ පරමාධිපත්‍යය බාදනය කරන සහ යටපත් කරන තවත් "ස්වෛරී" හෝ රාජ්‍ය අධිකාරීන්ගේ විධායක බලයක් තිබිය නොහැකි බව ශේෂ්ඨාධිකරණයේ කොළඹ වරාය නගරය නඩුව සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට එරෙහි නඩුව (2018) මගින් පිළිගත්තේ ය. අධිකරණවල නඩු මගින් රාජ්‍ය බලය විග්‍රහ කිරීමේ වලංගුභාවය පිළිගෙන ඇති අතර ද *සිල්වා එදිරිව අතුකෝරල* (1993) නඩුවේ දී " පොදු යහපත පිණිස භාවිතා කිරීම සඳහා පමණක් බලය හිමිවී ඇති රාජ්‍ය අධිකාරියකට නිර්බාධිත අභිමතයක් තිබීම හුදෙක් යෝග්‍ය නොවේ" යනුවෙන් විනිසුරු මාර්ක් ප්‍රනාන්දු තීරණය කළේය.[42] මෙම වචන ජනාධිපති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද මග පෙන්විය යුතුය. රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මිනීමැරුම් චෝදනාවකට වරදකරු කර දඬුවම් නියම කර තිබීම නොසලකා හරිමින්, මතභේදාත්මක ජනාධිපති සමාව දීමේ බලතල ක්‍රියාත්මක කිරීම මගින්, දයාව දැක්වීමේ ක්‍රියාවක් ලෙස පොසොන් පොහොය දිනයේ දී, මතභේදයට තුඩු දුන් දේශපාලඥයෙකුට නිදහස ලබා දෙන ලදී. සමාව දීමේ බලය සීමාවක් නොමැති අභිමතයක් නොවන අතර, එය සමාව දීම පිළිබඳ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව සිදු විය යුතු බව ශ්‍රී ලංකා නීතීඥ සංගමය ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කරමින් අවධාරණය කළේය.[43] මෙරට දණ්ඩ නීති සංග්‍රහය යටතේ සාපරාධී වැරදි සම්බන්ධයෙන් අධිකරණය විසින් දණ්ඩ විනිශ්චයන් ලබා දී ඇති විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරාමිතීන්ට පරිබාහිරව ජනාධිපති සමාව ලබාදිය නොහැකි බැවින් ඇතැම් ජනාධිපති සමාවදීම් අභියෝගයට ලක් කරමින් අධිකරණයේ පවරන ලද නඩු තිබේ. කොළඹ වරාය නගරය පරිපාලනය කිරීමේ දී මෙය පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.

ජනාධිපතිවරයා 2021 පොසොන් පොහොය දිනයේ දී සිදු කරන ලද පරිද්දෙන් රාජ්‍ය පාලනයේ දී "දස රාජ ධර්මය" අනුගමනය කරන බව ප්‍රකාශ කරන විට, ඔහු රජෙකු නොවන බවත්, ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ජනතාව තුළ පරමාධිපත්‍යය තබා ඇති නීතිය සහ ලිඛිත ව්‍යවස්ථාව මගින් ඔහුව පාලනය කරනු ලබන බවත් ජනතාව සහ රාජ්‍ය පාලනයේ අනෙකුත් අංශ වන පාර්ලිමේන්තුව සහ අධිකරණය විසින් මතක තබා ගත යුතුය. කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ පරිපාලනය සහ පාලනය මෙහෙයවිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය මගින් පවතින පරිදි පුළුල් කර

ඇති ජනාධිපති බලතල යන සංකල්පයට වඩා වෙනස් වූ ජනතා පරමාධිපත්‍යය පිළිබඳ මෙම සංකල්පය මගින් ය.

"ස්වෛරීභාවය" යන යෙදුම සම්බන්ධයෙන් අද මහජනතාවගේ සිත් තුළ ඇත්තේ ව්‍යාකූලත්වයකි. බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ දේශපාලඥයින් බොහෝ විට ජනාධිපතිවරයාව හඳුන්වන්නේ පාලනයේ දී රජෙකුගේ සළු පිළියෙන් සැරසී සිටින අයෙකු ලෙසයි එසේම ශ්‍රී ලංකා රාජ්‍යයේ පරමාධිපත්‍යය ජනතාවගේ පරමාධිපත්‍යය සමග පටලවාගෙන ඇත. ජනතාවගේ පරමාධිපත්‍යය යන සංකල්පය ශ්‍රී ලංකා ජාතික රාජ්‍යයේ පරමාධිපත්‍යයට ඇඟිලි ගැසීමට අවසර දෙන බටහිර මතවාදය ලෙස ජනතාවගේ මානව හිමිකම් පිළිබඳ විවේචනයක් තුළ අභියෝගයට ලක් වේ.

කෙසේ වෙතත්, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ ද අන්තර්ගත කර ඇති ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම්වල ඇති අදහස්, රාජ්‍ය බලය අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ඓතිහාසික අත්දැකීමකින් ගොඩනැගුණු සම්මතයන් වේ. දශක ගණනාවක් පුරා බහුපාර්ශ්වික මානව හිමිකම් ගිවිසුම් අපරානුමත කිරීම මගින් මෙම ප්‍රවේශය ශක්තිමත් කරමින් ශ්‍රී ලංකාව වැනි ජාතික රාජ්‍යයන් මෙම සම්මතයන් සහ ප්‍රමිතීන් ඒවායෙහි ජාතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට අන්තර්ග්‍රහණය කර ගෙන ඇත්තේ එබැවිනි. ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් අනුමත කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක වැනි ගෝලීය ප්‍රතිපත්ති පිළිගැනීම ශ්‍රී ලංකා රජය විසින් **ස්වේච්ඡාවෙන්** රාජ්‍ය ස්වෛරීභාවය ප්‍රකෘතිමත් කිරීම පිළිබිඹු කරන්නක් බව නීතිපති වැනි රාජ්‍ය නීති උපදේශකයින් ඇතුළු පාර්ලිමේන්තුව, අධිකරණය සහ විධායකය දැන සිටිය යුතුය. මෙය මෙම සම්මතයන් දේශීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීති, ප්‍රතිපත්ති සහ පාලනය සමග අනුකූල කිරීමට ඇති කැමැත්ත ප්‍රකාශ කිරීමකි.

අද අපි ඇතැම් විට ශ්‍රී ලංකාව "දුර්වල" හෝ "අකර්මන්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක්" ලෙස සිතන්නෙමු. නමුත් අපි දශක ගණනාවක් තිස්සේ මෙම පාලන ක්‍රමය පවත්වා ගෙන ගොස් ඇත. කොළඹ වරාය නගරය පිළිබඳ මහජන තර්කය ඇතැම් විට මෙම ව්‍යාපෘතිය මගින් එහි ප්‍රධාන ම හවුල්කරුවෙකු වන සහ වර්ධනය වෙමින් පවතින ගෝලීය සුපිරි බලවතෙක් වන චීනයෙහි විදේශ ආධිපත්‍යය දිරිමත් කරනු ඇතැයි යන අදහස මත කේන්ද්‍රගත වී ඇත. විදේශ බලවේග යක "ග්‍රහණය" නිසා කොමිෂන් සභාව සහ ජනාධිපතිවරයා විසින් කොළඹ වරාය නගරය තුළ නව හා වෙනස් ආකාරයේ පාලනයක් ස්ථාපනය කරනු ඇතැයි යෝජනා කෙරේ. එහෙත්, විදේශීය බලපෑම් මත එවැනි ග්‍රහණයක් හා පාලනයේ පරිවර්තනයක් සිදුවන්නේ නම්, මෙය සිදුවන්නේ අපේ රටේ යටත් විජිත ඉතිහාසයේ සිදු වූවාක් මෙන්, ජනතාවගේ, ආයතනවල සහ පාලනයේ නිලතල දරන පුද්ගලයින්ගේ සහාය හෝ අකර්මන්‍යතාවය හේතුවෙනි.

රාජ්‍ය ආයතනවල, පාර්ලිමේන්තුවේ, රාජ්‍ය අංශයේ හෝ අධිකරණයේ සිටින පුද්ගලයින්ට, ස්වෛරී ජනතාවගේ යහපැවැත්ම උදෙසා ධනාත්මක වෙනසක් සහ වගකිවයුතු පාලනයක් සඳහා දායකත්වයක් ලබාදීමේ වගකීමක් ඇත. ඔවුන්ගේ වගකීම වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාවය සහ රාජ්‍ය බලය සීමා කිරීම මත පදනම්ව දශක ගණනාවක් තිස්සේ අප විසින් පිළිගෙන ඇති ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කිරීම මිස අඩපණ කිරීම නොවේ. ඔවුන් සහ ජනතාව සහ සිවිල් සමාජය ඒකාධිපතිවාදයේ සහ පාලනයේ අසීමිත රාජ්‍ය බලය නැමති දේශපාලන මුදල් ඒකකයට නීත්‍යානුකූලභාවය ලබා නොදිය යුතුය. ජනාධිපතිවරයා ඇතුළු දේශපාලනඥයින් සහ

පාර්ලිමේන්තුවේ බහුතර පක්ෂයක් "බලයට එන්නේ" නැත. ඔවුන් රාජ්‍ය නිලතල දරන අතර ස්වෛරී ජනතාවට වග කිව යුතු වේ. ක්‍රියාවාදය සහ නියැළීම තුළින් කොළඹ වරාය නගරයේ පරිපාලනය සහ ක්‍රියාකාරීත්වය අප විසින් අධීක්ෂණය කර අභියෝග කළ යුත්තේ මෙම දැක්ම තුළින් ය.

අපගේ අධිකරණ සහ නීතිපතිවරයා සහ රජයේ නීති නිලධාරීන් මූලික අයිතිවාසිකම් සහ බලතල පිළිබඳ මෙරට නීති මීමංසාව සැලකිල්ලට ගනිමින්, ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජනතා පරමාධිපත්‍යය පිළිබඳ සංකල්පය සහ කොළඹ වරාය නගරය ආර්ථික කලාපය තුළ වගකීම් සහගත පරිපාලන බලය ක්‍රියාත්මක කරනු ලැබීම ආරක්ෂා කළ යුතුය. අධිකරණ පද්ධතිය පිළිබඳ නොනැසී පැවති මහජන විශ්වාසය "ඇත්ත වශයෙන්ම සහ පෙනෙන්නට තිබෙන ආකාරයෙන් අධිකරණය දේශපාලන බලවේගවලින් සහ දේශපාලන බේරුම්කිරීම් වලින් සම්පූර්ණයෙන් ම වෙන්වී සිටීම මගින් පෝෂණය කළ යුතු" බව ප්‍රකාශ කරමින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ නඩුවේදී (2018) විනිසුරු නලින් පෙරේරා මහතා ස්වකීය මතය ප්‍රකාශ කළේය.[44] ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ පරමාදර්ශය වෙනුවෙන් අඛණ්ඩ කැපවීමක් තිබෙන්නේ නම් පමණක් කොළඹ වරාය නගරයෙන් මේ රටේ ජනතාවට අපේක්ෂිත ලාභාංශ සහ ප්‍රතිලාභ අත්වනු ඇත. කොළඹ වරාය නගරයෙනි. අතීතයේ තවත් එක් පොසොන් දිනයක දී මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට ලබාදුන්නේ යැයි පැවසෙන අවවාදයට අනුව, රට ජනතාවට අයත් වන්නක් වන අතර රාජ්‍ය නිලතල දරන්නන් එහි ඇති සම්පත්වල තාවකාලික භාරකරුවන් වේ.

*බුලංකුලම එදිරිව ලේකම්, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය (2000)* යන සුප්‍රසිද්ධ නඩුවේදී විනිසුරු ඒ.ආර්.බී. අමරසිංහ මෙම අදහසම ඉතා ව්‍යක්ත ලෙස නැවත ප්‍රකාශ කළේය. එම විනිසුරුතුමා මෙසේ සඳහන් කළේය. "පරමාධිපත්‍යය ජනතාව තුළ පවතින බවත්, එය අහිමි කළ නොහැකි බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන් කර ඇත (3 වැනි ව්‍යවස්ථාව). නියෝජිත ප්‍රජාන්ත්‍රවාදී රාජ්‍යයක් වන නිසා දැනට ඇතැම් කර්තව්‍යයන් පවරා දෙනු ලැබ ඇති පුද්ගලයින් හරහා ජනතාවගේ බලය ක්‍රියාත්මක කරනු ලැබේ." පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අධිකරණය පිළිබඳ සඳහන් කරමින් විනිසුරුතුමා තවදුරටත් මෙසේ කියා සිටියේය: "රාජ්‍යයෙහි අංග යනු ජනතාව විසින් ජනතාවගේ සම්පත් ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති භාරකරුවන් වේ. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දක්වා ඇති පාලන ක්‍රමයට පමණක් නොව, අපගේ පාලකයන්ගේ යුතුකම් පිළිබඳ යුක්ති සහගත සංකල්පයට ද අනුකූල වේ."[45]

මහජනතාවගේ, විශේෂයෙන් ම මාධ්‍ය සහ සිවිල් සමාජයේ අධීක්ෂණයට, පාර්ලිමේන්තුව වැනි පාලනයෙහි කුළුණුවලට සහ අධිකරණ සමාලෝචන ක්‍රියාවලියට ඉතා බලගතු කොළඹ වරාය නගරය ආර්ථික කොමිසම සහ විධායක ජනාධිපතිවරයෙකු වුව මහජන යහපත වෙනුවෙන් සහ නීතියට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරමින් ක්‍රියා කරන බව සහතික කිරීමට උපකාරී විය හැක. ගැසට් නිවේදන වැනි ජනාධිපති නියෝග මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ අයිතිය සහ තොරතුරු දැනගැනීමේ අයිතිය සහ මාධ්‍ය නිදහස බාදනය කිරීම කොළඹ වරාය නගර පරිපාලනය තුළ අකාර්යක්ෂම සහ දුර්වල කළමනාකරණය, දූෂණය සහ වගකීම් විරහිතභාවය සහිත  සංස්කෘතියක් බිහිවීමට දායක වනු ඇත.

අපි සැවොම වරාය නගරය මෙම ස්ථිර, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වලින් වෙන්වූ කාර්මික හෝ වෙනත් ආකාරයක පාලනයක් සහිත ආර්ථික වෘද්ධියක් බවට පත්වීමෙන් වළක්වා ගත යුතුය.

## පසු සටහන්

[1] Dr Dayanatha Jayasuriya PC. “Erosion of National Sovereignty and Free Trade Zones: A Storm in a Tea Cup”? *Daily FT* 11/5/21; Global Experience with Special Economic Zones with a Focus on China and Africa, World Bank, Feb 2015.

[2] Colombo Port City Economic Commission Bill, Special Determination of the Supreme Court SCSD 04/2021, 05/2021, 07/2021 to 23/2021; Statement of the Attorney-General published in Daily News of Colombo 27/4/21.

[3] Ibid p.20.

[4] Cited in R.K.W. Goonesekere, Select Laws on State Lands, Law and Society Trust (2006) p. 33.

[5] Ibid ;p. 33-34, 117; Willes Principles of South African Law 7th ed. Juta and Co Ltd, Cape Town (1977) p.163.

[6] *Bulankulame v. Secretary Ministry of Industrial Development*, 2000 3 SLR, 343 p. 253 – 257.

[7] S 75 on Interpretations; Schedule III.

[8] SCSD Nos 1 to 03/2012.

[9] See R.K.W. Goonesekere, note 4 supra pp. 118 – 121, 372.

[10] Art 35 and proviso 20th Amendment.

[11] *Mohamed Faiz v. Attorney-General* 1995 1 SLR 372; *Upaliratna v. Tikiri Banda* 1995 1 SLR 165.

[12] World Bank Report note 1 supra.

[13] S 5 (i).

[14] Art 3, 4, 35 (1) and proviso.

[15] *R Sampanthan and Others v. AG and Others* SC FR Appl 351-361 (2018) H.N.J Perera CJ pp.31, 38, 69.

[16] Arts 148, 154. Chapter VII.

[17] Schedule III and II.

[18] S 7(1) (2), note 2 supra p. 25 – 26.

[19] *Edward Silva and Others v. Shirani Bandaranayake*1997 1 SLR 92.

[20] Note 2, supra p. 27 – 31.

[21] S 65 (1) (3), 75, and Schedule III, S 6 (1) (c) to (f) and S 38.

[22] S 65 (2), Part III.

[23] Antiquities Ordinance (1940) Part III S. 16 (1) (2), 18; S 48.

[24] Note 2 supra p 37 – 40, 46 – 50.

[25] S 26 (1) 27 (3) (4) (Foreign direct investment) S 38,39, 27 (5) (Partnership with Lease of Land), S 37 (1), (2) (3) authorized persons engaging in business with a Sri Lankan citizen, or resident outside Colombo Port City.

[26] S 5 (j), Schedule III, S 6 (1) (a).

[27] S 75; judgment pp 27 - 33, 37 -39, 43-44,45-46,48; Constitution Arts. 14(1) (g), 14 (1) (h).

[28] Note 11 supra.

[29] Constitution Article 14 (1), especially (a) and (h); S. Goonesekere, “Fundamental Rights and the Law of Delict” in Human Rights, Human Values and the Rule of Law, Essays in Honour of H.L. Silva PC ed. A.R.B. Amerasinghe and S.S. Wijeratne, Legal Aid Foundation and the Bar Association pp. 51 – 70.

[30] P. 26.

[31] Note 19 supra p. 95; anecdote. Krishantha Weliamune PC, a Junior to a Senior Counsel R.K.W. Goonesekere in the Case.

[32] S 68 (1) (e).

[33] S 69 proviso.

[34] S 5 (c ) (d).

[35] S 67.

[36] Note 2, p. 51.

[37] Ibid, p.52; Part IV, Priority in Hearing Legal Proceedings.

[38] World Bank Report note 1 supra.

[39] Constitution Art 33 (1) (g) UN Guiding Principles on Business and Human Rights OHCHR (2011) HR/PUS/11/04.

[40] Daily News, 27/4/2021, Colombo.

[41] Schedule II and III of the Act.

[42] *De Silva v. Athukorale,* 1993 1SLR 283 at p. 297; *R. Sampanthan and Others v. AG and Others,* note 15 supra, p. 38, 69.

[43] Constitution Art. 34 (1) and proviso; Bar Association Public Statement in Presidential Pardons 24 June 2021.

[44] Note 15 supra p. 69.

[45] Note 6 supra at p. 253 – 254.

*Supported by:*

diakonia

PEOPLE CHANGING THE WORLD

LAW & SOCIETY TRUST

**නීතිය හා සමාජය භාරය**
නෝ 3, කින්සි ටෙරස, කොළඹ 8
දුරකථන : +94 11 2691228/2684845/2684853
ෆැක්ස් : +94 11 2686843
ඊ-මේල් : lstadmin@sltnet.lk